ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

ස්තුතිය

පර්යේෂණ කටයුතු සඳහා මුදලින් ආධාර කිරීම, පර්යේෂණ කාර්ය මණ්ඩලය හුවමාරු කිරීම සහ පුහුණු කිරීමේලා පහසුකම් සැලසීම සඳහා අරමුදල් සැපයූ ආයතන හා විදේශීය රාජ්‍යයන්ටත්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මෙම මධ්‍යස්ථානය සිය ස්තුතිය පිරිනමන අතර, ඔවුන් දැක්වූ සහයෝගය පිළිබඳ කෘතඥතාවය ද මෙහිලා සඳහන් කරයි.

මෙම මධ්‍යස්ථානයේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඊට නන් අයුරින් සහයෝගය දැක්වූ, ආධාර කලා වූ සියලුම සේවකයින්ට සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය මෙයින් පිරිනැමේ.



ඉංජි. ඩී. ආර්. පුල්ලපෙරුම
සභාපති
ශ්‍රී ලං. ජා. ඉ. ප. සහ සං. මධ්‍යස්ථානය

NERDC

පටුන

	මාතෘකාව	පිටු අංකය
01.	පනත් , නීති හා ව්‍යවස්ථාපිත පාලනය	02
02.	අධ්‍යක්ෂ මණ්ඩලය, සහ සංවිධාන ව්‍යුහය	03-04
03.	සභාපතිතුමාගේ පණිවුඩය	05-06
04.	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය	07-09
05.	මානව සම්පත්	10-21
06.	2011 වර්ෂය තුළදී මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	22-37
07.	සාමූහික සමාජ වගකීම්	38
08.	ගිණුම්කරණ ප්‍රතිපත්තීන්	39-42
09.	2011.12.31 දිනට ගිණුම් වලට අදාළ සටහන්	43-48
10.	2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	49
11.	2011.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය	50
12.	2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රතිඵල වාර්තාව	51
13.	2011.12.31 දිනෙන අවසන් වර්ෂයට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	52
14.	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව	53-67
15.	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ අඩංගු නිරීක්ෂණයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පැහැදිලි කිරීම	68-74

01. පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 වර්ෂයේදී පිහිටුවන ලද අතර වර්තමානයේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයකි.දේශීය ඉංජිනේරු කර්මාන්තය සහ තාක්ෂණ, පර්යේෂණ ක්ෂේත්‍රයේ දියුණුව හා ප්‍රගමනය උදෙසා නර්ඩ් මධ්‍යස්ථානය මෙම පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවන ලද ප්‍රමුඛතම ආයතනයකි.ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත.

අපගේ දැකම

දකුණු ආසියාව තුල ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කාර්යයෙහි විශිෂ්ඨ මධ්‍යස්ථානයක් වීමට සහ එමගින් රටේ ආර්ථික සහ සමාජීය දියුණුවට ඉංජිනේරුමය වශයෙන් සැලකිය යුතු ලෙස දායක වීම.

අපගේ මෙහෙවර

ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු හරහා ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය අත්පත් කර ගැනීම, භාවිතා කිරීම සහ පැවරීම තුලින් මානව සහ ද්‍රව්‍යමය සම්පත් භාවිතය අවම කර ගැනීම මගින් රටේ ආර්ථික දියුණුව සහ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ තත්වයකට ගෙනඒමයි.

අරමුණු

- ශ්‍රී ලංකාවේ නව සොයා ගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

- සාමුහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම.

- රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

- අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජණය අත්කර ගැනීමට අනුබල දීම.

- කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

- ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණානයනය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

- ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම.

02. අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය

නම	තනතුර	රාජකාරි ස්ථානය	සුදුසකම්
ඉංජි. ඩී. ආර්. පුල්ලපෙරුම මහතා අංක 03, අලුබෝගහවත්ත, ඇන්ඩර්සන් පාර, දෙහිවල	**සභාපති**	ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 2පී/17බී., කාර්මික ජනපදය ඒකල, ජා ඇල.	BSc Eng, C Eng., FIE(SL), FIET MBA(Utility Management), Ireland
ඉංජි. පරාක්‍රම ජයසිංහ මහතා අංක 4/6ඒ, ප්‍රතිබිම්බාරාම පාර, කළුබෝවිල, දෙහිවල	සාමාජික	අධ්‍යක්ෂ ජයෝටෙක් (පෞද්) ආයතනය අංක 13/1, පැපිලියාන මාවත කොහුවල, නුගේගොඩ	BSc Eng Hons, University of Peradeniya, FRMIT (Australia), FIE (SL), C Eng, P E
ආචාර්ය ඒ. එම්. මුබාරක් මහතා අංක 410/2 බෞද්ධාලෝක මාවත, කොළඹ 07	සාමාජික	අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී කාර්මික තාක්ෂණ ආයතනය අංක 363, බෞද්ධාලෝක මාවත කොළඹ 07	BSc (Chemistry) Hons, University of Colombo, PhD (Cantab), Fellow of Institute of Chemistry, Fellow of National Academy of Sciences
ඉංජි. එච්. ඒ. ඩී. යූ. ජී. ගුණසේකර මහතා එල්/3/2, 117 වත්ත, ඇල්විටිගල මාවත, කොළඹ 08	සාමාජික	අධ්‍යක්ෂ/ කළමනාකරණ අධ්‍යක්ෂ යුනියන් කෙමිකල් ලංකා ආයතනය 4 වන මහල, සාරති ගොඩනැගිල්ල අංක 50, හයිඩ් පාර්ක් කෝනර් කොළඹ 02.	MBA, LLM, LLB, FIIE(Sc), FMS(UK), Dip on Polymer Technology, Attorney-at-law
ආචාර්ය රෝහාන් මුණසිංහ මහතා අංක 94/1, බණ්ඩාරගම පාර, බටුවන්දර, මඩපාත	සාමාජික	අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මොරටුව විශ්වවිද්‍යාලය කටුබැද්ද මොරටුව	PhD (Saga), C Eng, MIEFE
ඉංජි. ජී. එස්. ජේ. දිසානායක මහතා අංක 915/1, පේරාදෙණිය පාර, මහනුවර	සාමාජික	සභාපති/ සම්බණ්ධීකරණ අධ්‍යක්ෂ ජනාධිපති ලේකම් කාර්යාලය කොළඹ 01	GCGI (UK)
අසංග දයාරත්න මහතා	සාමාජික	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය කොළඹ 01	MA (Economics) South Korea, BA Hons
ඉංජි. ඩී. ඩී. ඒ. නාමල් මහතා	ලේකම්	අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 2පී/17බී. කාර්මික ජනපදය ඒකල, ජා ඇල.	MEng (Energy Technology), BSc Eng Hons, C Eng, MIE (SL)

කාර්යාලය:

2පී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

තැපැල් සංකේත අංකය : 11380

දුරකථන අංක

+ 94 11 2236284
+ 94 11 2236384
+ 94 11 2236307
+ 94 11 5354597
+ 94 11 5354601

බැංකු කරුවෝ:

ලංකා බැංකුව - ජා ඇල
ලංකා බැංකුව - ආයතනික ශාඛාව
මහජන බැංකුව - ජා ඇල

විගණකවරු: විගණකාධිපති

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
සංවිධාන ව්‍යුහය



03. සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය නොයෙකුත් බාධක මධ්‍යයේ වුවද ශ්‍රී ලාංකීය සමාජයට ඵලදායී සේවාවක් සැපයීමේ කාර්යයේ නිරතව සිටියි. විශ්ව විද්‍යාලවලින් විශේෂයෙන් ඉංජිනේරු පීඨවලින් පිටවන අතිදක්ෂ පර්යේෂණ ඉංජිනේරුවන් මෙම ආයතනයට බඳවා ගැනීම කල යුතුය යන්න විවිධ කතිකා වලදී පෙන්වාදී ඇත. එසේ වුවද පෞද්ගලික ආයතනයක මෙන් නර්ඩ් මධ්‍යස්ථානය වැනි රාජ්‍ය ආයතන වලට එවැනි පර්යේෂකයින් බඳවා ගැනීමට අවශ්‍ය සුපිරි පහසුකම් නොමැති අතර, ඊට හේතු වී ඇත්තේ අප ආයතනවල බඳවා ගැනීමේ පටිපාටි ඒ ඒ තනතුරු වලට අවශ්‍ය අනෙකුත් පහසුකම් රාජ්‍ය පරිපාලන සහ භාණ්ඩාගාර චක්‍ර ලේඛ මගින් තීරණය වන බැවිනි. දැනට අප විසින් ලබා දෙන පහසුකම් වල ඌණතාවය නිසා දැනට සිටින ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවරුන් කිහිප දෙනෙක්ද වැඩි වැටුප් සහ පහසුකම් ඇති ආයතන කරා යාමට පෙළඹුනු අතර ඒ හෙතුව නිසා ඔවුන් විසින් කරගෙන ආ පර්යේෂණ කටයුතු සියල්ල අතරමඟ නතර කිරීමට සිදුවී ඇත. 2011 වසරේදී ඉංජිනේරුවන් 09 දෙනෙක බඳවා ගැනීමට අප මධ්‍යස්ථානයට හැකි වුවද ඉන් දෙදෙනෙකු නර්ඩ් මධ්‍යස්ථානය හැරගොස්, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ජල සම්පාදන සහ ජලපවහන මණ්ඩලය යන ආයතන වලට බැඳී ඇත. පසුගිය වසර කිහිපය තුල ඇති වූ මෙවන් තත්වයන් නිසා ආයතනය තුල මධ්‍යම මට්ටමේ පර්යේෂණ ඉංජිනේරුවන්ගේ දැඩි හිඟයක පවතී. පර්යේෂණ සේවක සංඛ්‍යාවේ (cadre) පවතින ජ්‍යෙෂ්ඨ තනතුරුවලට ඇති බඳවා ගැනීමේ පටිපාටි සහ අනුමත වැටුප් ව්‍යුහයන් අනුව උපාධිය සහිත වසර 10ක පර්යේෂණ කටයුතු සඳහා පලපුරුද්දක් ඇති වෘත්තීය ඉංජිනේරුවන් ඉහත කී මධ්‍යම මට්ටමේ තනතුරුවලට බඳවා ගැනීම දුෂ්කර වී ඇත. 2011 අයවැයෙන් මෙම තත්වයන් අවම කර ගැනීමට හඳුන්වා දෙන ලද පර්යේෂණ දීමනාව අප අගයන අතර, අප මධ්‍යස්ථානයේ පර්යේෂකයන්ට එම දීමනාව ලබා ගැනීමට අවස්ථාව නොලැබී ඇත්තේ සුදුසුකම් ලත් එවන් කාර්යය මණ්ඩලයේ හිඟකමයි. නර්ඩ් මධ්‍යස්ථානයේ දැනට ආචාර්ය උපාධියක් සහිත කිසිඳු ඉංජිනේරුවකු නොමැති අතර, ආචාර්ය උපාධිය සහිත පර්යේෂණ ඉංජිනේරුවන් දෙදෙනෙකු 2011 වසරේදී මධ්‍යස්ථානයෙන් ඉවත් විය. ඉන් එක් අයකු වයස අවුරුදු 60 සම්පූර්ණ වී තිබීම නිසා විශ්‍රාම ගිය අතර, අනෙක් ඉංජිනේරුවරයා පුනර්ජනක බලශක්ති පිලිබඳ විද්‍යාපති උපාධිය ලබා දිවයිනට පැමිණීමෙන් පසු මොරටුව විශ්ව විද්‍යාලයේ සේවයට බැඳුනි. ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මෙම තත්ත්වය ගැන ගැඹුරින් සිතා බැලිය යුතු අතර නොඑසේ නම් දැනුම් ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් හිමිවන පර්යේෂණ සහ සංවර්ධන ආයතන අකර්මන්‍ය තත්වයට පත්වීම වැලැක්විය නොහැක.

ඉහත කී බාධක මධ්‍යයේ වුවද නර්ඩ් මධ්‍යස්ථානය රටේ ආර්ථික සහ සමාජයීය සංවර්ධනය සඳහා සැලකිය යුතු මෙහෙයක් සිය පර්යේෂණ සහ සංවර්ධනය කටයුතු හරහා සිදු කරන ලදී. එය 2010 වසරේ ක්‍රියාකාරකම් වලට වඩා 46%ක වැඩි වීමකි. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රධාන ප්‍රතිපාදන සහ ප්‍රතිඵලය වනුයේ කාර්මික සහ කෘෂිකාර්මික අංශ වල ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට ඉවහල් වූ නව නිෂ්පාදන සහ තාක්ෂණයන් හඳුන්වාදීමයි. ආයතනයේ අරමුණු සහ පරමාර්ථ ද පෙරදැරිව රජයේ සංවර්ධන සැලැස්මටද අනුව නර්ඩ් මධ්‍යස්ථානය තම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ තාක්ෂණ පැවරුම් කටයුතු ප්‍රධාන වශයෙන් සිදු කරන ලද්දේ විරංකියාව, ඉදිකිරීම් අමුද්‍රව්‍යවල අධික මිල, ප්‍රධාන කර්මාන්ත වල ශ්‍රම බලකායේ හිඟය සහ කෘෂිකර්ම සහ වැවිලි අංශයේ බලශක්ති අර්බුදය ආදී ක්ෂේත්‍රයන්ට විසඳුම් සෙවීම සඳහාය. තවද, කර්මාන්ත සඳහා සේවා සැපයීමේ අංශයේ 2010 වසරට සාපේක්ෂව 20%ක වර්ධනයක් අත් කර ගැනීමට සමත්විය. මෙයින්ද පිළිඹිබු වන්නේ අප වැනි පර්යේෂණ ආයතන කර්මාන්ත අංශය හා එක්ව ආර්ථිකය නැංවීමට ගන්නා උත්සාහයයි.

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය රටේ ආර්ථික ප්‍රගතියට සෘජු දායකත්වයක් දක්වයි. 2010 -2011 වසර වල ලැබූ රටේ ආර්ථික ප්‍රගතියට සමගාමීව රට තුල ඉදිකිරීම් කටයුතු වලට දායකත්වය ලැබුණු බැවින් නර්ඩ් මධ්‍යස්ථානය තම ක්‍රියාකාරකම් වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණ කෙරෙහි යොමු කිරීමට උත්සුක විය. මෙම තාක්ෂණ පැවරුම් ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට අඩුපාඩුවක්ව පැවැති පුහුණු සහ නුපුහුණු ශ්‍රමිකයින්, සැලසුම්කරුවන් සහ ඉංජිනේරුවන් හිඟකමට පිලියමක් ලෙස නර්ඩ් මධ්‍යස්ථානයේ වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය පිලිබඳව මනා පුහුණුවක් ඔවුන් හට ලබා දෙන ලදී. එලෙසම ජනාධිපති ලේකම් කාර්යාලයේ මඟ පෙන්වීම යටතේ දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය භාවිතා කරමින් ග්‍රාමීය පාසැල් වලට අනුයුක්තව පුස්තකාල ගොඩනැගිලි කිහිපයක් මොණරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලදී. සිවිල් ආරක්ෂක බලකායේ භටයින් මෙම ඉදිකිරීම් කටයුතු වලට සක්‍රීයව දායක වූ අතර, එම තාක්ෂණ ක්‍රමයම භාවිතා කරමින් 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද ග්‍රාමීය පාසල් 27ක් සඳහා පුස්තකාල ගොඩනැගිලි ඉදි කිරීමට පියවර ගෙන ඇත. මෙම ගොඩනැගිලි තාක්ෂණයන්හි සඵලමත් බව සලකා බලා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මුදල් කොමිසම හරහා සියලුම පලාත් සභාවන් සඳහා මෙම තාක්ෂණය හඳනුවාදීමට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත. ඒ අනුව පලාත් සභාවල අධ්‍යාපන සහ සෞඛ්‍ය අමාත්‍යාංශයන්ට අයත් ගොඩනැගිලි කිහපයක් මුලින්ම ඉදිකිරීමට කටයුතු කරගෙන යනු ලබයි. මෙම ගොඩනැගිලි තාක්ෂණ ක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් පොලොන්නරුව මහ රෝහලේ හෙද නිල නිවාස සංකීර්ණයක් නවතම ගෘහ නිර්මාණ සංකල්ප යොදා ගනිමින් නර්ඩ් මධ්‍යස්ථානය මගින් ඉදිකරගෙන යනු ලබයි.

තේ වියලීමේ කර්මාන්තය සඟහා කුඩා දර කැබලි ඉන්ධනයක් ලෙස කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සඳහා නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම පුනර්ජනක බලශක්ති ක්ෂේත්‍රයේ ලද විශාල ජයග්‍රහණයයි. මෙම නව තාක්ෂණ ක්‍රමය සංවර්ධන කර අවසන්ව ඇති අතර තාක්ෂණ පැවරුම් ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම තාක්ෂණ පැවරුම් ක්‍රියාවලියක් සමග තෙ වියලීමේ කර්මාන්තය සඳහා වැයවන බලශක්තිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගත හැකි අතර පරිසර සංරක්ෂණයටද එමගින් අත්වන පිටුවහල ඉමහත්ය.

2011 ඔක්තෝබර් මාසයේදී තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය මගින් 'තාක්ෂණ වෙලඳපොල' ප්‍රදර්ශනයක් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලැබූ අතර, එම ප්‍රදර්ශනයේදී ව්‍යවසායකයින් හට අප මධ්‍යස්ථානය මගින් කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා දිය හැකි සේවාවන් සහ තාක්ෂණයන් පිලිබඳ අවබෝධයක් දෙන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් වන නර්ඩ් මධ්‍යස්ථානය දියුණුවට පත් කිරීම සඳහා අවශ්‍ය නායකත්වය ලබා දෙන අධ්‍යක්ෂ ජනරාල් ඉංජි. ආනන්ද නාමල් මහතාගේ සේවය අගය කරන අතර ඔහු සමග කටයුතු කිරීම සතුටට කරුණකි. ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් හා අඛන්ඩ ඇගයීමට ලක් කිරීමෙන් ඔහු කරනු ලබන කාර්යය පැසසිය යත්තකි. එලෙසම අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ටත් අංශ ප්‍රධානින්ටත්, පර්යේෂණ ඉංජිනේරුවන්ටත් /විද්‍යාඥයින්ටත්, තාක්ෂණවේදීන්ටත් සහ සියලු කාර්ය මණ්ඩලයටද මෙම වසර තුලදී මධ්‍යස්ථානයේ අරමුණ කරා ලඟාවීමට ලබා දුන් සහාය වෙනුවෙන් ස්තූතිය පුද කර සිටිමි.

ශ්‍රී ලංකා ජාතක ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය



ඉංජි. ඩී. ආර්. පුල්ලපෙරුම
සභාපති

04. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

සභාපති

ඉංජි. ඩී. ආර්. පුල්ලපෙරුම MBA (Utility Management-Ireland), BSc Eng,C Eng, FIET(SL)

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී. ඩී. ඒ. නාමල් - MEng (Energy Technology), BSc Eng (Hons), C Eng, MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජී. කේ. කේ. ඒ. ද සිල්වා මයා - MSc (Building Technology), BSc Eng, C Eng, MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඒ. එච්. පියසිරි මයා - MSc(Management of Technology), BSc Eng (Hons)

දෙපාර්තමේන්තු මට්ටමින් විධායක කාර්ය මණ්ඩලය

බලශක්ති සහ පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව	**අංශ ප්‍රධානි**	
	ජේ. ඒ. ඒ. ඩී. ජයසූරිය මයා	MEng, BSc Eng
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	
	කේ. ටී. ජයසිංහ මයා	MEng, BSc Eng
	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ	
	පී. එම්. ජී. පතිරාජ මිය	MSc(Environmental Science & Technology), BSc (Special)
	පර්යේෂණ ඉංජිනේරුවන්	
	එන් පී ටී පෙරේරා මෙනවිය	BSc (Eng)
	එල් එල් ලලිත් කුමාර මයා	MSc (Eng), BSc (Eng)
	එන්.එස්. ගමගේ මිය (2011.04.07 දින සිට)	BSc (Eng)
	එම්.ඩී. සහර්දීන් මයා (2011.05.02 දින සිට)	BSc (Eng)
සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව	**වැ.බ. අධ්‍යක්ෂිකා (තාක්ෂණික)**	
	ජේ. ඒ. සී. ක්‍රිෂාන්ති මිය (2011.06.30 දක්වා)	BSc Eng, C Eng, MIE(SL)
	අධ්‍යක්ෂිකා (තාක්ෂණික)	
	ජේ. ඒ. සී. ක්‍රිෂාන්ති මිය (2011.07.01 සිට)	BSc Eng, C Eng, MIE(SL)
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවන්	
	ඩබ්. පී. ආර්. ඩී. වීරසිංහ මයා	NDT, CEI Part I, IESL Part I
	ඩබ්. ඩබ්. පී. කේ. පෙරේරා මයා	BSc Eng(Hons), Meng (Struct), C Eng MIE (SL)
	පර්යේෂණ ඉංජිනේරු	
	ඩී.ටී.එස්.යූ. දිසානායක මයා (2011.03.01 සිට 2011.09.26 දක්වා)	BSc Eng (Hons)
	ගෘහනිර්මාණ ශිල්පි	
	සී. ඒ. උපුල් දල්පදාදු මයා	BSc(BE)Hons, MSc(Arch), AIA(SL), RIBA, Chartered Architect

පුනර්ජනක බලශක්ති දෙපාර්තමේන්තුව	**අධ්‍යක්ෂ (තාක්ෂණික)**	
	එන්. කේ. එදිරිසිංහ මයා	BSc Eng
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවන්	
	ඩී. එම්. පුංචිබණ්ඩා මයා	BSc Eng
	ආචාර්ය. එම්. නාරායන මයා (2011.12.11 දක්වා)	PhD MPhil, BSc Eng, C Eng, MIE(SL)
	පර්යේෂණ ඉංජිනේරුවන්	
	ආර් එම් ඩී එස් ගුණරත්න මිය	BSc (Eng)
	එස්.ජී.ජේ.යූ. සමරසිංහ මයා (2011.03.01 සිට)	EC(UK) Part I & II, NDT
	එන්.පී. කුමාරසිංහ මිය (2011.03.10 සිට)	BSc (Eng)
	එල්.එම්.එස්.ඩී පෙරේරා මිය (2011.03.10 සිට)	BSc (Eng)
කෘෂි ඉංජිනේරු පසු අස්වනු තාක්ෂණ දෙපාර්තමේන්තුව	**අංශ ප්‍රධානී** **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාර්ථී**	
	ආචාර්ය ටි. බී. අධිකාරිනායක මයා (2011.07.25 දක්වා)	PhD, MEng, MSc, MIAgrE, CEng(UK), C Eng, MIE(SL)
	වැ.බ. අධ්‍යක්ෂ (තාක්ෂණික)	
	කේ. වයි. එච්. ඩී. ශාන්ත මයා (2011.07.26 සිට)	BSc Eng
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවන්	
	වයි. එම්. එම්. කේ. රණතුංග මිය	NDT
	ඉංජි. ඩබ්. කේ. ආර්. පීරිස් මයා	MPhil, MA(Buddhist studies), BSc Eng, C Eng, MIE(SL)
	පර්යේෂණ ඉංජිනේරුවන්	
	කේ යූ සී පෙරේරා මෙනවිය	BSc Eng
	ජේ. සී. රාජගුරු මයා (2011.05.01 දක්වා)	MSc Eng, BSc (Eng)
	පී.එම්.වයි.එස්. පතිරාජ මිය (2011.04.07 සිට)	BSc (Eng)
විදුලි, විද්‍යුත් හා මෙකට්‍රෝනික් ඉංජිනේරු දෙපාර්තමේන්තුව	**වැ.බ. අංශ ප්‍රධානී**	
	ඉංජි. එන්. ජී. ඩී. එදිරිසිංහ මිය	M Eng, C Eng, MIE(SL)
	පර්යේෂණ ඉංජිනේරුවන්	
	එච්. පී. එච්. කුමාර මයා	EC (UK) Part I & II
	එල් කේ ඩී සී ඒ කරුණාරත්න මයා	BSc (Eng)
	එස්.එම්. හඳගල මයා (2011.03.10 සිට)	BSc (Eng)
	ඩබ්.එම්.අයි.පී. දිවාරත්න මයා (2011.03.10 සිට 2011.07.01 දක්වා)	BSc (Eng)
	පී. මාධවී පෙරේරා මෙනවිය (2011.05.09 සිට)	BSc (Eng)
සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව සේවා දෙපාර්තමේන්තුව	**අධ්‍යක්ෂ (තාක්ෂණික)**	
	ඒ. ඒ. එස්. පී. ජයසිංහ මයා	BSc Eng (Hons)
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවන්	
	එච්. එම්. එල්. යූ. හේරත් මයා	BSc Eng
	ඒ. ආර්. සී. සල්ගාදු මයා	BSc Eng
	පර්යේෂණ ඉංජිනේරුවන්	
	එස්.පී. පෙරේරා මයා (2011.03.01 සිට)	EC(UK) Part I & II, NDT

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව	**අංශ ප්‍රධානී** ඉංජි. එම්.වී.එස්.ඒ කේ. පෙරේරා මයා (2011.08.03 දක්වා)	PG Dip, IESLPart I & II, C Eng, MIE(SL)
	පර්යේෂණ විද්‍යාර්ථී ඉංජි. එම්.වී.එස්.ඒ කේ. පෙරේරා මයා	PG Dip, IESLPart I & II, C Eng, MIE(SL)
	ඉංජි. එම්. ඒ. එම්. ප්‍රනාන්දු මයා	PG Dip, (Energy), IESLPart I & II, C Eng, MIE(SL)
	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරුවන් ඩී. වී. විමලසේන මයා	NDT, Diploma in Marketing (S.L)
	අලෙවි නිළධාරි එස්. විජේසූරිය මයා	BSc(Agriculture) Special
තාක්ෂණ උද්‍යානය	**පර්යේෂණ ඉංජිනේරුවන්** ඩබ්. ආර් සෝයිස් මයා (2011.04.28 දක්වා)	NDT, CEI.- Part I
මුදල් අංශය	**මුදල් කළමණාකරු** ඩී. වී. එස්. පෙරේරා මිය	ICMA Professional Part II
	ගණකාධිකාරි ජේ. එම්. ආර්. එස්. ජයසිංහ මයා	BSc (Adm) (Special), Professional part I
අභ්‍යන්තර විගණන අංශය	**අභ්‍යන්තර විගණක** පී. බී. සුසන්ත මයා	HNDA, Chartered Licentiate Ex Part I & II
පරිපාලන අංශය	**අධ්‍යක්ෂිකා (මානව සම්පත්)** ජේ. පී. ඒ. ඩී. එස්. අයි. ජයසේකර මිය	MPM, BSc, Dip in Personnel Mgmt, Dip in Advanced English
	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) කේ. ජී. එන්. රත්නායක මයා	BCom (Special), National Dip in HRM
සැපයුම් අංශය	**සැපයුම් නිලධාරි** ආර්. එච්. ඒ. ජීවානන්ද මයා	BSc (Physical Science)
පුස්තකාලය	**පුස්තකාලයාධිපති** තුෂාරිකා දේවගිරි මිය	MSSc Lib (Special) Degree ASLLA

සමස්ථ කාර්ය මණ්ඩලය (2011 දෙසැම්බර් 31 දක්වා)

ඉහළ කළමනාකාරිත්වය	-	04
ඉංජිනේරු කාර්ය මණ්ඩලය	-	32
අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	-	10
කණිෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය	-	05
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	-	18
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	-	45
ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය (ප්‍රහුණු/නුපුහුණු)	-	155
මුළු එකතුව	-	**269**

05. මානව සම්පත්

මානව සම්පත ආයතනයක පවත්නා වඩා වැදගත්ම සාධකය වන්නේ එහි පවත්නා සජීවී ගුණයත්, සඵලදායීත්වයත් හේතුවෙනි. වෙනත් වචනවලින් කියතොත් ආයතනයක මානව සම්පත නොමැතිව අනෙකුත් සම්පත් සඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට හෝ කළමනාකරණය කිරීමට නොහැකි වන්නේය.

මධ්‍යස්ථානයේ ස්ථිර සේවක සංඛ්‍යාව 269 ක් වන අතර ඉන් ඉහළ කළමනාකාරීත්වයද ඇතුළුව ඉංජිනේරු කාර්ය මණ්ඩලය 36 ක්ද අනිකුත් විධායක කාර්යමණ්ඩලය 10 දෙනෙකුද, කණිෂ්ඨ කළමනාකරුවන් 05 ක්ද, තාක්ෂණික කාර්ය මණ්ඩලය 18 ක්ද, කළමනාකරණ සහකාර 45 දෙනෙකු සහ ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් කාර්ය මණ්ඩලය 155 දෙනෙකුද වශයෙනි.

මධ්‍යස්ථානයේ සමස්ථ ස්ථිර කාර්ය මණ්ඩලයේ තොරතුරු සාරාංශය පහත දක්වා ඇති පරිදි වේ.

සමස්ථ කාර්ය මණ්ඩලයෙහි තොරතුරු සාරාංශය

සේවක ගණය	සංඛ්‍යාව
ඉහළ කළමනාකරණ මණ්ඩලය	4
ඉංජිනේරු කාර්ය මණ්ඩලය	32
විධායක කාර්ය මණ්ඩලය	10
කණිෂ්ඨ විධායක කාර්ය මණ්ඩලය	5
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	18
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	45
ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය	155
එකතුව	**269**



2011 වර්ෂය තුළදී මධ්‍යස්ථානය සඳහා අභ්‍යන්තර හා බාහිර බඳවාගැනීම් පහත සඳහන් පරිදි සිදුකරන ලදි.

නම	තනතුර	දෙපාර්තමේන්තුව	දිනය
01.එස් ජී ජේ යූ. සමරසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	01/03/2011
02.එස් පී පෙරේරා මයා	පර්යේෂණ ඉංජිනේරු	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව සේවා	01/03/2011
03.ඩී.ටී.එස්.යූ. දිසානායක මයා	පර්යේෂණ ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	10/03/2011
04.ඩබ් එම් අයි පී දිවාරත්න මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකට්‍රොනික් ඉංජිනේරු	10/03/2011
05. එස් එම් හඳගල මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකට්‍රොනික් ඉංජිනේරු	10/03/2011
06.එන් පී කුමාරසිංහ මිය	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	10/03/2011
07.එල් එම් එස් ඩී පෙරේරා මිය	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	10/03/2011
08.එන් එස් ගමගේ මිය	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	07/04/2011
09.පී එම් වයි එස් පතිරාජ මිය	පර්යේෂණ ඉංජිනේරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	07/04/2011
10.එම් ඩී සහර්ඩීන් මයා	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	02/05/2011
11.මාධවී පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකට්‍රොනික් ඉංජිනේරු	09/05/2011
12.ඩී එම් ඒ කේ දිගල මිය	තාක්ෂණ නිලධාරී	සිවිල් ඉංජිනේරු	01/02/2011
13.ආර් කුෂියානන්දන් මයා	තාක්ෂණ නිලධාරී	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	01/02/2011
14. කේ වයි එච් ඩී ශාන්ත මයා	වැඩ බලන අධ්‍යක්ෂ (තාක්ෂණ)	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	26/07/2011
15.එම් ඒ එම් ප්‍රනාන්දු මයා	වැඩ බලන අධ්‍යක්ෂ (තාක්ෂණ)	තාක්ෂණ අලෙවි	04/08/2011

අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතය අනුව පහත සඳහන් සේවක මහත්ම මහත්මීන්ගේ සේවා කාලය 2011 වර්ෂයේදී දීර්ඝ කරන ලදී.

නම	තනතුර	දෙපාර්තමේන්තුව	දිනය (වසරකින්)
01.එච් පී රණසිංහ මයා	වැද්දුම් /පැස්සුම්කරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	07/04/2011
02.එම් වී එස් ඒ කේ පෙරේරා මයා	අංශ ප්‍රධානී තාක්ෂණ අලෙවි	තාක්ෂණික අලෙවි	21/04/2011 සිට 03/08/2011
03.එම් සිරිල් සිල්වා මයා	කම්කරු	සිවිල් ඉංජිනේරු	01/07/2011
04.එච් ඒ ජේ පෙරේරා මයා	විදුලි කාර්මික	විදුලි, විද්‍යුත් සහ මෙකට්‍රොනික් ඉංජිනේරු	26/09/2011
05. එච් ඩී එන් චිත්‍රා මිය	සැලසුම් ශිල්පී	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	08/11/2011
06.එල් එස් අයි සිල්වා මිය	සැලසුම් ශිල්පී	සිවිල් ඉංජිනේරු	15/11/2011
07.එච් ඒ ජයවර්ධන මයා	කම්කරු	සිවිල් ඉංජිනේරු	16/12/2011

පහත සඳහන් කාර්ය මණ්ඩලය 2011 වර්ෂය තුළදී මධ්‍යස්ථානයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

නම	**තනතුර**	**දෙපාර්තමේන්තුව**	**විශ්‍රාම ගිය දිනය**
01.ඩබ් ආර් සෝවිස් මයා	පර්යේෂණ ඉංජිනේරු	තාක්ෂණ උද්‍යානය	28/04/2011
02.ආචාර්ව ටී බී අධිකාරිනායක මයා	අංශ ප්‍රධානී/ප්‍රධාන පර්යේෂණ විද්‍යාර්ත	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	25/07/2011
03..එම් වී එස් කේ පෙරේරා මයා	අංශ ප්‍රධානී	තාක්ෂණ අලෙවි	03/08/2011
05. එස් ඒ ඩී හේමචන්ද්‍ර මයා	කම්කරු	පාලන	29/01/2011
06.කේ එස් පී සිල්වා මයා	කාර්යාල කාර්ය සහයක	පාලන	03/02/2011
07.ඒ බී කමලානන්ද මයා	මෝටර් කාර්මික	වාහන නඩත්තු	23/12/2011 (මියයන ලදී)

පහත සඳහන් නිලධාරී මහත්ම මහත්මීන් 2011 වසරේදී මධ්‍යස්ථානයේ සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

නම	**තනතුර**	**දෙපාර්තමේන්තුව**	**ඉල්ලා අස්වූ දිනය**
01.ජේ සී රාජගුරු මයා	පර්යේෂණ ඉංජිනේරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	01/05/2011
02.ඩබ් එම් අයි පී දිවාරත්න මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකට්‍රොනික් ඉංජිනේරු	01/07/2011
03.ජී එම් සාලිය අපෝන්සු මයා	කම්කරු	පාලන	12/07/2011
04. .ඩී.සී.එස්.යූ. දිසානායක මයා	පර්යේෂණ ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	26/09/2011
06.එච් එම් ඩී ටී කේ පලාපත්වල මිය	සැලසුම් ශිල්පී	සිවිල් ඉංජිනේරු	22/10/2011
07.අචාර්ය එම් නාරායන මයා	පර්යේෂණ විද්‍යාර්ත	පුනර්ජනක බලශක්ති	11/12/2011

5.1 කුසලතා ගොඩනැගීමේ/නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන්

5.1.1 අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සම්පත් දායකත්වයෙන් 9001:2008 අන්තර් ජාතික ප්‍රමිති තත්ව පාලන ක්‍රමය පිළිබඳව තෙදින පුහුණු වැඩසටහනක් මධ්‍යස්ථානයේ සියලුම ඉංජිනේරු සහ විධායක නිලධාරී කාර්ය මණ්ඩලය සඳහා 2011ජනවාරි මස 11සිට 13 දක්වා මධ්‍යස්ථානය තුළදී පවත්වන ලදී.

- මධ්‍යස්ථානයේ සෙසු සියලුම කාර්යය මණ්ඩලය සඳහා 9001:2008 අන්තර් ජාතික ප්‍රමිති තත්ව පාලන ක්‍රමය පිළිබඳව දින භාගයක දැනුවත් කිරීමේ වැඩසටහනක් 2011 පෙබරවාරි මස 15 දින මධ්‍යස්ථානය තුළදී පවත්වන ලදී.

- ඉහත වැඩසටහන් දෙක පවත්වන ලද්දේ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලයට දැනුම ලබාදීම මගින් 9001:2008 අන්තර් ජාතික ප්‍රමිති තත්ව පාලන සහතිකය අපගේ ප්‍රධාන නිෂ්පාදන හා සේවා සඳහා ලබාගැනීමේ අරමුණ ඇතිවය. මධ්‍යස්ථානයේ සියලුම තාක්ෂණ හා අනෙකුත් අංශ නියෝජනය කරමින් කාර්යය මණ්ඩලය ඇතුළත් කර කමිටුවක් මධ්‍යස්ථානය විසින් මේ වන විටත් පත්කර ඇති අතර එම කමිටුව අපේක්ෂිත ප්‍රතිඵලයන් ලබාගැනීමේ අරමුණෙන් මධ්‍යස්ථානයේ තත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය, හඳුනාගත් සේවා සහ ක්‍රියාකාරකම් සඳහා ක්‍රමවේදයන් ඇතුළත් සංග්‍රහයක් (Procedure manual) කෙටුම්පත් කර ඇත.

- ජාතික වෘත්තිය සුදුසුකම් ලබාගැනීමට (NVQ) පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ජාතික වෘත්තිය පුහුණු අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2011 පෙබරවාරි 24 දින මධ්‍යස්ථානය තුළ පවත්වන ලදී .

  මෙම වැඩසටහන් පවත්වන ලද්දේ ජාතික වෘත්තිය නිපුණතා වලට සුදුසුකම් ලබාගැනීමේ වැදගත්කම අවධාරණය කිරීමේ අරමුණ ද සහිතවය. පෙදරේරු, වඩුකාර්මික, විදුලි විද්‍යුත්, පරිඝණක සහ වෑද්දුම් යන ක්ෂේත්‍ර ආවරණය කරමින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර එම කරුණු පැහැදිලි කිරීමේ වැඩසටහන් තුළින් මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලයට අදාළ වෘත්තිය නිපුණතා මට්ටම් ලබාගැනීමේ පරීක්ෂණ වලට පෙනීසිටීම සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් විය.

- මධ්‍යස්ථානය සෑම විටම එහි කාර්යය මණ්ඩලයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධව අවධානය යොමු කරන ලබන අතර හදිසි අනතුරු සහ වෘත්තිය රෝගවලින් ආරක්ෂාව සලසා දීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. ඒ සම්බන්ධව 2011 ජූනි මස 28 වන දින දින භාගයක වැඩමුළුවක් කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා දිස්ත්‍රික්ක කර්මාන්තශාලා පරීක්ෂකවරුන්ගේ සහයෝගය ඇතිව පවත්වන ලදී. එම වැඩසටහනේදී වැඩහල්වල විනය පවතවාගෙන යාම සම්බන්ධව එනම් ආරක්ෂක හස්වැසුම්, සපත්තු පැළඳවීම, හදිසි අවස්ථාවකදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග යනාදි වැදගත් කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරුණි. දේශන ක්‍රමය, පරිඝණකයෙන් ඉදිරිපත් කිරීම(Powerpoint Presentation), සංවාද, පත්‍රිකා බෙදාහැරීම, වීඩියෝ දර්ශන යනාදී ක්‍රමවේදයන් තුළින් එම වැඩසටහන් වලට සහභාගීවූවන්ගේ අවධානය අදාළ කාලය මුළුල්ලේම යොමුකර ගැනීමට සමත්විය. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) හා කළමනාකරණ සහකාර (තාක්ෂණ) සහ ප්‍රාථමික කාර්යය මණ්ඩලය මෙම වැඩසටහන සඳහා සහභාගී විය.

- කාර්යාලීය කටයුතු සඳහා භාවිතා කරන MS-Word සහ MS-Excel මෘදුකාංග භාවිතය පිළිබඳ පරිඝණක වැඩසටහනක් මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) කාර්යය මණ්ඩලය සඳහා සෙනසුරාදා දින 11 තුල අභ්‍යන්තර සම්පත් දායකත්වයෙන් මධ්‍යස්ථානය තළදී පවත්වන ලදී. පරිඝණක දැනුම භාවිතා කිරීම තුළත් එදිනෙදා රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටුකරගැනීමේ අරමුණින් මෙම වැඩසටහන් පවත්වන ලදී.

5.1.2 දේශීය පුහුණු/නිපුනතා සංවර්ධන වැඩසටහන්

නර්ඩ් මධ්‍යස්ථානය සෑම විටම එහි කාර්යය මණ්ඩලය පුහුණු අවස්ථා සඳහා යොමුකිරීමටත් එමගින් ඔවුන් හට වර්තමානයට අවශ්‍ය දැනුම ලබාදීම මගින් ප්‍රශස්ථ සේවාවක් ලබාගැනීමේ අරමුණින් අදාළ පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම සිදු කරනු ලැබේ.

2011 වර්ෂය තුළදී මධ්‍යස්ථානය මගින් දේශීය පුහුණු අවස්ථා අසූතුනක් (83) මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා ලබාද ඇති අතර ඒ සඳහා මධ්‍යස්ථානය රුපියල් හාරලක්ෂ හැටපන්දහස් හත්සිය පනහක රු.465,750/- පරිවැයක් දරා ඇත.

නර්ඩ් මධ්‍යස්ථානය දේශීය පුහුණු වැඩසටහන් සඳහා අවස්ථාවන් ලබාදෙන අතර එහි සාමාජිකයන් 15 දෙනෙකු සඳහා විදේශීය පුහුණු අවස්ථා සලසා දී ඇත. විදේශ වැඩසටහන් සඳහා යොමුකිරීම මගින් ලබාගන්නා දැනුම හා කුසලතාව අපගේ වැඩ ක්‍රමයන් සඳහා අදාළ කර ගැනීමට හැකිවීම වැදගත් කරුණකි.

2011 වර්ෂයේදී නර්ඩ් මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලයට දේශය පුහුණු අවස්ථා ලබාදීමට අදාළ කරුණු පහත ආකෘතියෙන් නිරූපණය වේ.

කාර්ය මණ්ඩල ගණන	සංඛ්‍යාව
ඉංජිනේරු කාර්යමණ්ඩලය	29
අනෙකුත් විධායක නිලධාරීන්	10
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	9
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	11
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	6
එකතුව	**65**



Skilled Development Programmes - 2011

අංක	නම	තනතුර	දෙපාර්තමේන්තුව	වැඩසටහන	කාලය	පුහුණු ආයතනය	පාඨමාලා ගාස්තුව
1	සියළුම ඉංජිනේරු සහ විධායක කාර්ය මණ්ඩලය			අන්තර් ජාතික ප්‍රමිති තත්ව පාලනය තත්ව සහතිකය ISO 9001-2008 තත්ව කළමනාකරණය සඳහා අදාළ තත්ව සංග්‍රහය සහ අභ්‍යන්තර විගණනය සඳහාවූ ආයතනික පුහුණු වැඩසටහන	දින 03 (2011/01/11-2011/01/13)	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	රු. 84,000.00
2	කේ.බී.එච්.එල්. ලෙයිටන් මිය	කළමනාකරණ සහකාර	පරිපාලන	ඉදිරි පෙළ කාර්යමණ්ඩලය සඳහා ඵලදායී දුරකථන හැකියාව	2011/01/14	කාර්මික තාක්ෂණ කළමනාකරණ ආයතනය	රු. 4,037.75
3	පී.ජී.එන්. චිත්‍රලතා මිය	කළමනාකරණ සහකාර	පරිපාලන	ඉදිරි පෙළ කාර්යමණ්ඩලය සඳහා ඵලදායී දුරකථන හැකියාව	2011/01/14	කාර්මික තාක්ෂණ කළමනාකරණ ආයතනය	රු. 4,037.75
4	ජේ.පී.ඒ.ඩී.එස්.අයි. ජයසේකර මිය	අධ්‍යක්ෂිකා (මානව සම්පත්)	පරිපාලන	මානව සම්පත් කළමනාකරණය සඳහා පරිපාලන නීති පිළිබඳ පුහුණු වැඩසටහන	දින 02 (2011/01/21-2011/01/22)	කාර්මික තාක්ෂණ කළමනාකරණ ආයතනය	රු. 6,283.20
5	බී.පී. සුසන්ත කුමාර මයා	අභ්‍යන්තර විගණක	අභ්‍යන්තර විගණන	ඉංග්‍රීසි පුහුණු වැඩසටහන		ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය	රු. 10,000.00
6	විධායක නොවන සියළුම කාර්ය මණ්ඩලය			"ISO 9001-2008 තත්ව කළමනාකරණ ප්‍රතිපත්තිය පිළිබඳ දැනවත්කිරීමේ ආයතනික වැඩසටහන "	දින 1/2 (2011/02/15)	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	රු 25,200.00
7	ඩී එස් සී වන්නිආරච්චි මිය	කළමනාකරන සහකාර	පරිපාලන	පරිපාලන නීති සහ මානව සම්පත් සංවර්ධනය	2011/03/04	ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන මධ්‍යස්ථානය	රු 3,000.00
8	එල්.කේ. වසන්තා නිල්මිණි මිය	කළමනාකරන සහකාර	පරිපාලන	පරිපාලන නීති සහ මානව සම්පත් සංවර්ධනය	2011/03/04	ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන මධ්‍යස්ථානය	රු 3,000.00
9	ශ්‍යාමලී ප්‍රියංගිකා මිය	කළමනාකරන සහකාර	පුනර්ජනක බලශක්ති	පරිපාලන නීති සහ මානව සම්පත් සංවර්ධනය	2011/03/04	ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන මධ්‍යස්ථානය	රු 3,000.00
10	එන්.එල්. ජයවික්‍රම මයා	විදුලි කාර්මික	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	ඩීසල් විදුලි උත්පාදක යන්ත්‍ර පිළිබඳ එක්දින වැඩසටහන	2011/03/05	කාර්මික තාක්ෂණ කළමනාකරණ ආයතනය	රු 3,998.40
11	ඉංජි. ඩී.ආර්. පුල්ලපෙරේරු මයා	සභාපති		බලශක්ති විගණනය සඳහා ප්‍රවේශය සම්බන්ධ වැඩමුළුව	2011/03/11	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	රු 500.00
12	ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා	අංශ ප්‍රධානී/ බලශක්ති හා පාර්සරික කළමනාකරණ	බලශක්ති හා පාර්සරික කළමනාකරණ	බලශක්ති විගණනය සඳහා ප්‍රවේශය සම්බන්ධ වැඩමුළුව	2011/03/11	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	රු 1,000.00
13	එන්.පී.ටී. පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාර්සරික කළමනාකරණ	බලශක්ති විගණනය සඳහා ප්‍රවේශය සම්බන්ධ වැඩමුළුව	2011/03/11	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	රු 1,000.00

අංක	නම	තනතුර	දෙපාර්තමේන්තුව	වැඩසටහන	කාලය	පුහුණු ආයතනය	පාඨමාලා ගාස්තුව
14	ඉංජි. ඩබ් කේ ආර් පීරිස් මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ	රෝද හතරේ ට්‍රැක්ටර් සම්බන්ධ තාක්ෂණ සැසිය	25/03/2011	ශ්‍රී ලංකා කෘෂි යන්ත්‍රෝපකරණ නිෂ්පාදන හා සැපයුම් ආයතනය	රු. 2,000.00
15	ඒ.එම්.ඒ.කේ. දිගල මිය	තාක්ෂණ නිලධාරී	සිවිල් ඉංජිනේරු	ජලනල හා ජලාප්‍රවාහන පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව	දින 3 21-23 March 2011	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු. 13,800.00
16	ජී.කේ.කේ.ඒ.ද සිල්වා මයා	නි. අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	ඉහළ කළමනාකාරිත්වය	සුළු හා මධ්‍ය පරිමාණ අංශ සඳහා මූල්‍ය වැඩසටහන	26/03/2011	ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය	රු. 4,286.00
17	ඉංජි. එම්.ඒ.එම්. ප්‍රනාන්දු මයා	පර්යේෂණ විද්‍යාර්ථී	තාක්ෂණික අලෙවි	සුළු හා මධ්‍ය පරිමාණ අංශ සඳහා මූල්‍ය වැඩසටහන	26/03/2011	ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය	රු. 4,286.00
18	ඩී.වී. විමලසේන මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	තාක්ෂණික අලෙවි	සුළු හා මධ්‍ය පරිමාණ අංශ සඳහා මූල්‍ය වැඩසටහන	26/03/2011	ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය	රු. 4,286.00
19	ඩී.පී. එදිරිසිංහ මෙනවිය	කාර්මික සහකාර	සිවිල් ඉංජිනේරු	සුළු හා මධ්‍ය පරිමාණ අංශ සඳහා මූල්‍ය වැඩසටහන	26/03/2011	ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය	රු. 4,286.00
20	එච්.එම්.එල්.යූ. හේරත් මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	විනයානුකූල කළමණාකරණය තුලින් මානව සම්පත් සංවර්ධනය	දින 2 (06/07 May 2011)	වනයානුකූල කළමණාකරන අධ්‍යයන මධ්‍යස්ථානය	රු. 7,000.00
21	එච්.ඩී.ටී.ඒ.එස්. ජයසිංහ මයා	විද්‍යා හා තාක්ෂණ නිලධාරී	තාක්ෂණ උද්‍යානය	විනයානුකූල කළමණාකරණය තුලින් මානව සම්පත් සංවර්ධනය	දිනෑ (06/07 May 2011)	වනයානුකූල කළමණාකරන අධ්‍යයන මධ්‍යස්ථානය	රු. 7,000.00
22	එල්.කේ.ඩී.සී.ඒ. කරුණාරත්න මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	වැඩ කිරීමේදී අඩු පළදායී පුද්ගලයින් අභිප්‍රේරණය කරන්නේ කෙසේද	එක්දින (07/06/2011)	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 5,143.00
23	මහේෂි විජේතුංග මෙනවිය	කළමනාකරණ සහකාර	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	"MS Excel" පාඨමාලාව	දින 04 (10-13 May 2011)	මූල්‍ය අධ්‍යයනය පිළිබඳ විද්‍යායාතනය	රු. 6,500.00
24	එච්.එම්.එල්.යූ. හේරත් මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	හයිඩ්‍රොලික් පද්ධති වල දෝශ නිර්ණය කිරීම	සෙනසුරාදා දින 5 June 2011	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු. 9,500.00
25	එච්.එම්.ඩී.ටී.කේ. පලාපත්වල මිය	සැළසුම් ශිල්පී	සිවිල් ඉංජිනර්රු	ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව	දින 26 from June 2011	ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන මධ්‍යස්ථානය	රු. 25,000.00
26	එච්.එම්.අයි.පී. දිවාරත්න මයා	පර්යේෂණ ඉංජිනේරරු	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	ලෝක ප්‍රතීත දින පිළිබඳ සම්මන්ත්‍රණය	09/06/2011	ශ්‍රී ලංකා ප්‍රතීත මණ්ඩලය	රු. 5,000.00
27	එස්.එම්. හඳගල මයා	පර්යේෂණ ඉංජිනේරරු	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	ලෝක ප්‍රතීත දින පිළිබඳ සම්මන්ත්‍රණය	09/06/2011	ශ්‍රී ලංකා ප්‍රතීත මණ්ඩලය	රු. 5,000.00

අංක	නම	තනතුර	දෙපාර්තමේන්තුව	වැඩසටහන	කාලය	පුහුණු ආයතනය	පාඨමාලා ගාස්තුව
29	පී එම් වයි යමුනා පතිරාජ මිය	පර්යේෂණ ඉංජිනේරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය	ධනාත්මක ආකල්ප සහ අභිප්‍රේරණය සංවර්ධනය කිරීමේ වැඩමුළුව	07/06/2011	ශ්‍රී ලංකා පුද්ගල කළමනාකරණ ආයතනය	රු. 5,865.00
30	එල් එම් එස් ජී පෙරේරා මිය	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	ධනාත්මක ආකල්ප සහ අභිප්‍රේරණය සංවර්ධනය කිරීමේ වැඩමුළුව	07/06/2011	ශ්‍රී ලංකා පුද්ගල කළමනාකරණ ආයතනය	රු. 5,865.00
31	එන් එස් ගමගේ මයා	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	ධනාත්මක ආකල්ප සහ අභිප්‍රේරණය සංවර්ධනය කිරීමේ වැඩමුළුව	07/06/2011	ශ්‍රී ලංකා පුද්ගල කළමනාකරණ ආයතනය	රු. 5,865.00
32	එන් පී ටී පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	පිච්චුරු නිෂ්පාදන තක්සේරු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වැඩමුළුව	දින 7 from 20 June 2011	ජාතික පිච්චුරු නිෂ්පාදන මධ්‍යස්ථානය	රු. 25,000.00
33	බී පී සුසන්ත කුමාර මයා	අභ්‍යන්තර විගණක	අභ්‍යන්තර විගණන	නව බදු හා නීතිරීති ප්‍රවර්ධන සම්මන්ත්‍රණය	18/06/2011	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 3,500.00
34	ඒ ජී එන් පී ටී අත්තෙට්ටිගම මිය	ගණකාධිකරණ සහයක	මුදල්	නව බදු හා නීතිරීති ප්‍රවර්ධන සම්මන්ත්‍රණය	18/06/2011	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 3,500.00
35	ඉංජි. එන් ජී ඩී විජේසිරිවර්ධන	අංශ ප්‍රධානී විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	කළමනාකරණ වෙනස්වීම් වල සාර්ථකත්වය පිළිබඳ වැඩසටහන	24/06/2011	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 8,011.43
36	ඉංජි. ජී කේ කේ ද සිල්වා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	ඉහළ කළමනාකාරිත්වය	ජලය රඳවාගැනීමේ ව්‍යුහාත්මක පූර්ව සමළව	දින 2 18/19 June 2011	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	රු. 10,000.00
37	බී ඩී ආර් කේ ජයවර්ධන මයා	විද්‍යුත් කාර්මික	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	විදුලිය ස්ථාපනය සහ නඩත්තු වැඩසටහන	දින 3 02/03 July 2011	කාර්මික තාක්ෂණ කළමනාකරණ ආයතනය	රු. 5,500.00
39	ආර් කුෂියන්තන් මයා	තාක්ෂණ නිලධාරී	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	සංස්ථාපිත ලිවීම පිළිබඳ වැඩමුළුව	01/07/2011	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	රු. 4,000.00
40	බී පී සුසන්ත මයා	අභ්‍යන්තර විගණක	අභ්‍යන්තර විගණන	වෘත්තියන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව පියවර (3)	සති 18 30/06/2011	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	රු. 15,000.00
41	ඩී ටී එස් යූ දිසානායක මයා	පර්යේෂණ ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	2011/07/30,31 (දින 02)	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	රු. 10,000.00
42	ආර් කුෂියන්තන් මයා	තාක්ෂණ නිලධාරී	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	ජාත්‍යන්තර තාක්ෂණික වැඩමුළුව	2011/07/29	Institution of Incorporated Engineers Sri Lanka	රු. 1,500.00
43	කේ ඊ ජේ ප්‍රනාන්දු මයා	විදුලි කාර්මික	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	විදුලිය නඩත්තු සහ මෙකැට්‍රොනික් උපකරණ නිර්මාණය පිළිබඳ පාඨමාලාව	2011/08/08 - 2011/08/12 (දින 05 days)	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු. 9,000.00
44	බී පී සුසන්ත මයා	අභ්‍යන්තර විගණක	අභ්‍යන්තර විගණන	එළදායි ජාත්‍යන්තර විගණනය පිළිබඳ සම්මන්ත්‍රණය	2011/08/20	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 3,500.00
45	ලක්ෂිකා විජයන්ති මිය	කළමනාකරණ සහකාර	අභ්‍යන්තර විගණන	එළදායි ජාත්‍යන්තර විගණනය පිළිබඳ සම්මන්ත්‍රණය	2011/08/20	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 3,500.00

අංක	නම	තනතුර	දෙපාර්තමේන්තුව	වැඩසටහන	කාලය	පුහුණු ආයතනය	පාඨමාලා ගාස්තුව
46	සී එන් වර්ණකුලසූරිය මිය	කළමනාකරණ සහකාර	අභ්‍යන්තර විගණන	පළුදායි ජාත්‍යන්තර විගණනය පිළිබඳ සම්මන්ත්‍රණය	2011/08/20	නිපුණතා සංවර්ධන අරමුදල	රු. 3,500.00
47	ජේ පී ඒ ඩී එස් අයි ජයසේකර මිය	අධ්‍යක්ෂ (මානව සම්පත්)	පාලන	විනයානුකූල කළමනාකරණය තුළින් මානව සම්පත් කළමනාකරණය	2011/08/19,20	විනයානුකූල කළමනාකරණ අධ්‍යයන ආයතනය	රු. 7,500.00
48	කේ යූ සී පෙරේරා මෙනවිය	පර්යේෂණ ඉංජිනේරු	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය	ISO/ IEC 17025:2005 තත්ව පාලනය, මිණුම් සහ ක්‍රමාංකවල දෝශ නිර්ණය කිරීමේ වැඩසටහන	2011/09/01,02	ශ්‍රී ලංකා ප්‍රතීත මණ්ඩලය	රු.7,000.00
49	එල් බී ඇරුණ ශාන්ත මයා	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු	ගොඩනැගිලි උපකරණ නඩත්තු කිරීම පිළිබඳ පාඨමාලාව	2011/08/22 - 2011/08/26 (දින 05)	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු.16,000.00
50	ඒ කේ දිගල මිය	තාක්ෂණ නිලධාරී	සිවිල් ඉංජිනේරු	ලංසු ඇගයීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව (ප්‍රායෝගික අධ්‍යයන ආශ්‍රයෙන්)	08/25/2011	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය	රු.3,900.00
51	ප්‍රභා පරණවිතාන මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු	ලංසු ඇගයීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව (ප්‍රායෝගික අධ්‍යයන ආශ්‍රයෙන්)	08/25/2011	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය	රු .3,900.00
52	ඉංජි. ඩබ් කේ ආර් පීරිස්	පර්යේෂණ විද්‍යාර්ථ	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය	නැනෝ තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුව	09/30/2011	ලංකා රසායන විද්‍යා ආයතනය	රු.4,000.00
53	එස් ජී ජේ යූ සමරසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	නැනෝ තාක්ෂණය භාවිතය පිළ්බඳ වැඩමුළුව	09/30/2011	ලංකා රසායන විද්‍යා ආයතනය	රු .4,000.00
54	එස් ඒ රුවන් නිශාන්ත මයා	PL 3	වාහන නඩත්තු	ගොඩනැගිලිවල වායුසමීකරණ පද්ධතිවල නඩත්තුව පිළිබඳ පාඨමාලාව	2011/09/17,18,24,25 (දින 04)	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු.9,500.00
55	අයි ප්‍රියශාන්ත පෙරේරා මයා	PL 3	වාහන නඩත්තු	ගොඩනැගිලිවල වායුසමීකරණ පද්ධතිවල නඩත්තුව පිළිබඳ පාඨමාලාව	2011/09/ 17,18,24,25(දින 04)	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු.9,500.00
56	එම ඩී ෂෙමිල් නිලන්ත මයා	PL 3	වාහන නඩත්තු	ගොඩනැගිලිවල වායුසමීකරණ පද්ධතිවල නඩත්තුව පිළිබඳ පාඨමාලාව	2011/09/17,18,24,25 (දින 04)	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු.9,500.00
57	එල් එම් එස් ඩී පෙරේරා මිය	පර්යේෂණ ඉංජිනේරු	පුනර්ජනක බලශක්ති	පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ වැඩමුළුව	2011/09/19 - 2011/09/23 (දින 05)	ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය	රු.10,000.00
58	නිපුන්කා ගමගේ මිය	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	කර්මාන්ත සහ සේවා ආයතන වල විදුලි බලශක්තිය සංරක්ෂණ පිළිබඳ පාඨමාලාව	2011 සැප්තම්බර් මස 23 සහ 24 දිනයන්හි	කාර්මික තාක්ෂණ ආයතනය	රු .6,283.20
59	ඒ කේ දිගල මිය	තාක්ෂණ නිලධාරී	සිවිල් ඉංජිනේරු	ගොඩනැගිලි අමුද්‍රව්‍ය වල තත්ව සහතික පිළිබඳ වැඩමුළුව	09/27/2011	The Chamber of Construction Industry	රු.7,980.00
60	ඩබ් පී ආර් ඩී වීරසිංහ මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	ඉදිකිරීම් වලදී දැව භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය	10/27/2011	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය	රු.2,000.00
61	එස් එම් හැඳගල මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	ශුද්ධ පාලන පද්ධති පිළිබඳ වැඩසටහන	15/10/2011	ලංසු ඇගයීම සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළුව (IFIAFS)	රු.6,000.00
62	එල් කේ ඩී සී ඒ කරුණාරත්න මයා	පර්යේෂණ ඉංජිනේරු	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්	රොබෝටෙක් සහ රොබට් නිර්මාණ	16/10/2011	ලංසු ඇගයීම සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළුව (IFIAFS)	රු.6,000.00

අංක	නම	තනතුර	දෙපාර්තමේන්තුව	වැඩසටහන	කාලය	පුහුණු ආයතනය	පාඨමාලා ගාස්තුව
63	කේ ජී එන් රත්නායක මයා	සහකාර අධ්‍යක්ෂ (පාලන)	පාලන	ටයිවියෝනා සත්වැදෑරුම් අපද්‍රව්‍ය ව්‍යාපෘතිය පිළිබඳ සම්මන්ත්‍රණය	25/10/2011	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	රු. 1,950.00
64	එම් ඩී සහර්ඩීන් මයා	පර්යේෂණ ඉංජිනේරු	බලශක්ති හා පාරිසරික කළමනාකරණ	ජලය ශුද්ධ කිරීමේ පද්ධතියක් ඉදිකිරීම සම්බන්ධ වැඩමුළුව	2011 නොවැම්බර් 04 සිට 06 දක්වා	ඉදිකිරීම් උපකරණ පුහුණු ආයතනය	රු. 13,800.00
65	ප්‍රබා පරණවිතාන මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු	MS Office හා Excel පරිඝණක පාඨමාලාව	2011 ජුලි 30, අගෝස්තු 06, අගෝස්තු 20 සහ සැප්තැම්බර් 10	නර්ඩ් ආයතනය	රු. 15,000.00
66	කේ එස් එස් වීරසිංහ මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු				
67	ඩී එච් පී කල්‍යානසිරි මයා	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු				
68	එල් බී ඇරුණශාන්ත මයා	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු				
69	බී ජේ එච් සුමනරත්න මයා	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව				
70	කේ කේ ඩී පුෂ්පසිරි මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	පුනර්ජනක බලශක්ති	MS Office Excel පරිඝණක පාඨමාලාව	26th Sep, 28th Sep. 30th Sep, 03rd Oct., 14th Oct, 17th Oct, 19th Oct. 2011	නර්ඩ් ආයතනය	රු. 5,750.00
71	එන් ඒ ඒ ඩී ප්‍රසන්න මයා	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය				
72	එච් ඩී සී හෙට්ටිආරච්චි මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්				
73	ඩී පී එදිරිසිංහ මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සිවිල් ඉංජිනේරු				
74	ඒ කේ දගල මිය	තාක්ෂණ නිලධාරී	සිවිල් ඉංජිනේරු				
75	එන් ටී රාජපක්ෂ මිය	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය				
76	එම එස් බණ්ඩාර මයා	වැඩපරීක්ෂක (විදුලි)	විදුලි, විද්‍යුත් සහ මෙකැට්‍රොනික්ස්				
77	ඉංජි. ඩබ් ඩබ් පී කේ පෙරේරා	ප්‍රධාන පර්යේෂන ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	ව්‍යුහාත්මක ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් සහ කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	2011 දෙසැම්බර් 15 - 17	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	රු. 15,000.00
78	ඉංජි. ඩබ් ඩබ් පී කේ පෙරේරා	ප්‍රධාන පර්යේෂන ඉංජිනේරු	සිවිල් ඉංජිනේරු	ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගේ සංගමයේ වර්ෂාරම්භ රැස්වීම	22/11/2011	ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගේ සංගමය	රු. 1,500.00
79	ජේ එම් ආර් එස් ජයසිංහ මයා	ගණකාධිකාරී	මුදල්	අයවැය 2012 පිළිබඳව සම්මන්ත්‍රණය	30/11/2011	කාර්මික සංවර්ධන මණ්ඩලය	නොමිලේ
80	ජේ ඩී දර්ශණී මෙනෙවිය	මුදල් අයකැමි	මුදල්	අයවැය යෝජනා 2012 පිළිබඳ සම්මන්ත්‍රණය	30/11/2011	කාර්මික සංවර්ධන මණ්ඩලය	නොමිලේ
81	ඒ එච් පියසිරි මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)	ඉහල කළමනාකාරිත්වය	සංයුක්ත සැලසුම් කිරීම හා අයවැය සකස් කිරීම පිළිබඳ වැඩසටහන	01st # 02nd Dec. 2011	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	රු. 10,000.00
82	ඩී වී එස් පෙරේරා මිය	මුදල් කළමනාකාර	මුදල්	සංයුක්ත සැලසුම් කිරීම හා අයවැය සකස් කිරීම පිළිබඳ වැඩසටහන	01st # 02nd Dec. 2011	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	රු. 10,000.00
83	කේ ජී එන් රත්නායක මයා	සහකාර අධ්‍යක්ෂ (පාලන)	පාලන	විනය කළමණාකරණය තුළින් මානව සම්පත් සංවර්ධනය	14th ස 15th Dec. 2011	විනය කළමනාකරණ අධ්‍යයන මධ්‍යස්ථානය	රු. 7,500.00

FOREIGN SCHOLARSHIPS/SEMINARS/TRAINING-PROGRAMMES/WORKSHOPS - 2011

අංකය	නම	තනතුර	වැඩසටහනේ නම	කාලපරිච්ඡේදය	රට	අනුග්‍රහය දක්වන ආයතනය
1	ඒ ඒ එස් පී ජයසිංහ මයා	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	සී එන් සී හා ලේත් මැෂින් ක්‍රියාකරවීම පිළිබඳ පුහුණුව	04/04/2011-09/04/2011	තායිවානය	වික්ටර් ට්‍රේඩින් යන්ත්‍රෝපකරණ ආයතන, තායිවානය
2	ජී කේ ජී ජේ එම් එස් පී ජයතිලක මයා	සැළසුම් නිර්මාණ හා උපදේශකත්ව	සී එන් සී හා ලේත් මැෂින් ක්‍රියාකරවීම පිළිබඳ පුහුණුව	04/04/2011-09/04/2011	තායිවාන්	වික්ටර් ට්‍රේඩින් යන්ත්‍රෝපකරණ ආයතන, තායිවානය
3	කේ ටී ජයසිංහ මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	දියුණු වෙමින් පවතින රටවල බලශක්ති විගණනය බලශක්ති වෘත්තියන් සඳහා පුහුණු වැඩසටහන	04/05/2011-14/05/2011	ඉන්දියාව	NAM විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය ඉන්දියාව හා බලශක්ති හා ප්‍රතිපත්ති විශ්ලේෂණ මධ්‍යස්ථානය, ඉන්දියාව
4	ඉංජි. එන් කේ එදිරිසිංහ	අධ්‍යක්ෂ/ පුනර්ජනක බලශක්ති	දකුණු සහ දකුණු දිග ආසියා කලාපයේ ජීව ඉන්ධන ශක්තීන් සඳහා ව්‍යාපෘති විධිබලකිරීමේ ධාරිතාව සඳහා තිරසාර ක්‍රමවේදයක් ඇති කිරීමේ සමුළුව (ISO 13065)	19/04/2011-21/04/2011	නේපාලය	සුවීඩනයේ ප්‍රමිති ආයතනය
5	ඉංජි. එන් කේ එදිරිසිංහ	අධ්‍යක්ෂ/ පුනර්ජනක බලශක්ති	දකුණු සහ දකුණු දිග ආසියා කලාපයේ ජීව ඉන්ධන ශක්තීන් සඳහා ව්‍යාපෘති විධිබලකිරීමේ ධාරිතාව සඳහා තිරසාර ක්‍රමවේදයක් ඇති කිරීමේ පූර්ව සමුළුව ISO PC248/WG රැස්වීම	14/05/2011-20/05/2011	ජර්මනිය	සුවීඩනයේ ප්‍රමිති ආයතනය
6	ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්	අධ්‍යක්ෂ ජනරාල්	ස්පාක් දුවර නැමති විදුලි පහන් ප්‍රතිපත්ති පිළිබඳ 3වැනි සමුළුව	06/06/2011-09/06/2011	ඔස්ට්‍රේලියා	ඔස්ට්‍රේලියානු රජය
7	සී ඒ යූ දල්පදාදු මයා	ගෘහනිර්මාණ ශිල්පී	කොරුයානු විද්‍යා හා තාක්ෂණ උද්‍යාන පිළිබඳ වැඩසටහන	29/08/2011-09/08/2011	කෝරියාව	නොරියානු නවීකරණ පදනම (KICF)
8	එම එස් බණ්ඩාර මයා	වැඩපරික්ෂක (විදුලි)	ස්වයංක්‍රීයව බැටරි පරික්ෂා කිරීමේ උපකරණ පිළිබඳව වැඩමුළුව	19/09/2011-23/09/2011	ජර්මනිය	ඩීගේට්‍රන් කර්මාන්ත
9	කේ වයි එච් ඩී ශාන්ත මයා	අධ්‍යක්ෂ / කෘෂි ඉංජිනේරු සහ පසු අස්වනු තාක්ෂණ අංශය	දකුණු දිග රටවල තාක්ෂණ ව්‍යවසායකත්වය පිළිබඳව වැඩමුළුව	26/09/2011-30/09/2011	මලයාසියාව	ජාතික විද්‍යා, තාක්ෂණ සහ නවීකරණ ආයතනය (ISTIC)
10	ඉංජි. එන් කේ එදිරිසිංහ	අධ්‍යක්ෂ/ පුනර්ජනක බලශක්ති	පූර්ව සම්මන්ත්‍රණය සහ අන්තර් ජාතික ප්‍රමිති රැස්වීම	02/10/2011-06/10/2011	කෙන්යාව	සුවීඩනයේ ප්‍රමිති ආයතනය
11	ඉංජි. ඩී ආර් පුල්ලපෙරුම	සභාපති	තාක්ෂණ පැවරුම් සඳහා විශ්ව විද්‍යාලය හා කර්මාන්ත සහයෝගිතාවය පිළිබඳ WIPO වැඩමුළුව	02/11/2011-04/11/2011	වියට්නාමය	ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනය (WIPO)
12	ජේ ඒ ඒ ඩී ජයසූරිය මයා	අංශ ප්‍රධානී/ බලශක්ති හා පාරිසරික කළමනාකරණ	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා බලශක්ති කළමනාකරණ සහ පිවිතුරු නිෂ්පාදන සඳහා වැඩමුළුව	31/10/2011-02/12/2011	නෙදර්ලන්තය	නෙදර්ලන්ත අධිශිෂ්‍යත්ව වැඩසටහන (NFP)

අංකය	නම	තනතුර	වැඩසටහනේ නම	කාලපරිච්ඡේදය	රට	අනුග්‍රහය දක්වන ආයතනය
13	ඩී එම් පුංචිබණ්ඩාර මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	දේශගුණික විපර්යාස සම්බන්ධ හරිත වර්ණ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රගුණ වැඩසටහන	10/10/2011-19/10/2011	කොරියාව	කොරියානු අන්තර් ජාතික සහයෝගිතා ආයතනය (KOICA)
14	එන් ටී රාජපක්ෂ	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	සොලිඩ් වර්ක් මෘදුකාංගය භාවිතයෙන් ත්‍රිමාණකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	06/11/2011-14/01/2012	ඉන්දියාව	ඉන්දියානු රජය
15	එන් පී කුමාරසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	සූර්ය බලශක්ති තාක්ෂණය හා එහි භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන	14/11/2011-03/12/2011	ඉන්දියාව	ඉන්දියානු රජය
16	ජී කේ කේ ද සිල්වා මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	ආසියා කලාපයේ පර්යේෂණ සහ සංවර්ධන ආයතන වල නවඋත්පාදනයන් පැවරීම හා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලීයේ සමස්ථ කලාපීය වැඩමුළුව	28/11/2011-01/12/2011	පිලිප්පීනය	අන්තර් ජාතික පරමානු බලශක්ති ආයතනය (IAEA)
17	ඉංජි. එම ඒ එම් ප්‍රනාන්දු මයා	අධ්‍යක්ෂ/තාක්ෂණ අලෙවි	බුද්ධිමය දේපල ආර්ථිකව හා ප්‍රායෝගිකත්වය සම්බන්ධ WIPO/UNESCAP කලාපීය වැඩමුළුව	08/12/2011-09/12/2011	තායිලන්තය	ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO)
18	ජේ ඒ ඒ ඩී ජයසූරිය මයා	අංශ ප්‍රධානී/ බලශක්ති හා පාරිසරික කළමනාකරණ	සූර්ය බලශක්ති සම්බන්ධව සාක් සම්මන්ත්‍රණය	20/12/2011-22/12/2011	මාලදිවයින	සාක් බලශක්ති ආයතනය

06. 2011 වසර තුළදී මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (නර්ඩ් මධ්‍යස්ථානය) රටෙහි ආර්ථික හා සාමාජීය තත්වය වැඩි දියුණු කිරීම සඳහා වටිනා යෙදවුම් සපයන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් කහිපයක නියැලී සිටියි. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රධාන ප්‍රථිපල සහ නිමැවුම් ලෙස නව නිෂ්පාදන සහ තාක්ෂණයන් නිර්මාණය කර එමගින් කාර්මික හා කෘෂි කාර්මික අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට උපකාර කිරීම සිදු කරනු ලබයි. නර්ඩ් මධ්‍යස්ථානය මගින්, මධ්‍යස්ථානයේ අරමුණු හා අභිමතාර්ථ සහ රාජ්‍යය සංවර්ධන සැලසුම් වලට අනුව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අමුද්‍රව්‍ය සඳහා වන අධික වියදම, විවිධ කර්මාන්තයන්හී ශ්‍රමික හිගය සහ කෘෂිකාර්මික හා වැවිලි ක්ෂේත්‍රයේ බල ශක්ති අර්බුද සහ විරැකියාව ආදී ගැටලු විසඳීම කේන්ද්‍රකරගත් ව්‍යාපෘතීන්ට අනුව පර්යේෂණ සහ සංවර්ධන හා තාක්ෂණය පැවරීමේ කාර්යයන් සිදු කරනු ලබයි.

ජනාධිපති ලේකම් කාර්යාලයේ මගපෙන්වීම යටතේ, නර්ඩ් වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය උපයෝගී කර ගනමින් මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් සඳහා පුස්තකාල ගොඩනැගිලි කිහිපයක් ඉදිකිරීම නර්ඩ් මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදී. මෙම ක්‍රමවේදයම ව්‍යාප්ත කරමින් සහ 2011 දැයට කිරුළට සමගාමීව සිවිල් ආරක්ෂක බලකායේ සහයෝගය සහිත ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසල් 27ක් සඳහා ඉහත ආකාරයේම පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීමට සැළසුම් කර ඇත. මෙම තාක්ෂණයන්ගේ ඵලදායීතාවය සැලකිල්ලට ගෙන වියදම් පිරිමැසුම්දායක නිවාස ඉදිකිරීමේ තාක්ෂණය සියලු පළාත් සභා වෙත හදුන්වාදීම සඳහා ශ්‍රී ලංකා මුදල් කොමිසමෙහි ආධාර ඇතිව පියවර ගන්නා ලදී. එහි මූලික පියවරක් ලෙස පළාත් අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යංශ යටතේ ගොඩනැගිලි කීපයක් ඉදිකිරීමට තීරණය කරන ලදී.

තේ වියලීමේ කර්මාන්තයේදී ඉන්ධන ප්‍රභවයක් ලෙස දර කැබලි යොදා ගැනීම පුනර්ජනක බලශක්ති ක්ෂේත්‍රයේ ලද විශාල ජයග්‍රහණයකි. මෙම ක්‍රමවේදය සංවර්ධනය කර ඇති අතර තාක්ෂණය පැවරීමේ ක්‍රමවේදය ආරම්භකර ඇත. තාක්ෂණය පැවරීමත් සමග, තේ වියලීම සඳහා යොදා ගන්නා බල ශක්තිය විශාල ලෙස පිරිමසාගැනීමට තේ කම්හල් හිමියන්ට අවස්ථාව උදාවනු ඇත.

2011 වසරේ නර්ඩ් මධ්‍යස්ථානය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් සැකෙවින් පහත දැක්වේ.

1. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන
2. සංවර්ධිත තාක්ෂණයන් ජනතාව අතර ප්‍රචලිත කරවීම
3. තාක්ෂණය පැවරීමේ ක්‍රියාවලියන්
4. නියමු ව්‍යාපෘතීන් ස්ථාපනය හා ඉදිකිරීම
5. ඉදිකිරීම් ව්‍යාපෘතීන්
6. උපදේශක සේවාවන්
7. යටිතල පහසුකම් සංවර්ධනය

6.1 පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන්

ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය කර්මාන්ත සඳහා පුනර්ජනක බලශක්ති භාවිතය, පරිසර දූෂණය අවම කිරීම, ඉදිකිරීමේ කර්මාන්ත සඳහා විකල්ප ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතය, කෘෂි කාර්මික හා ආහාර සැකසීමේ කර්මාන්තයේ ඵලදායීතාවය වැඩි කිරීම ආදී රටෙහි ප්‍රධාන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් නව තාක්ෂණයන් හා නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් හී නිරතවී සිටී.

මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනලද වැදගත් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් පහත දැක්වේ.

i. **ව්‍යාපෘතිය - තේ වියලීමේ කර්මාන්තය සඳහා කුඩා දර කැබලි පාලනයකින් යුතුව ඇතුල් කිරීමේ පද්ධතිය - ගම්පොළ - ඩීන්සයිඩ් තේ කම්හල**

ව්‍යාපෘතියේ අරමුණු : නර්ඩ් මධ්‍යස්ථානය විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස ගම්පොල පිහිටි ඩීන් සයිඩ් තේ කර්මාන්ත ශාලාවේ පිහිටුවන ලද යාන්ත්‍රික ක්‍රමයන් අනුව දර ඇතුල් කිරීමේ පද්ධතිය විශාලනය හා වැඩිදියුණු කිරීම.

ප්‍රතිලාභ:

- අවම වශයෙන් 20% ක දර පිරිමැසීමේ හැකියාව
- අඩු වගා කාලසීමාවක් ඇති ග්ලිරිසීරියා වැනි ශාක දර කැබලි ලෙස තේ වියලීමට යොදාගතහැකි වීම මගින් තේ නිෂ්පාදනය ස්ථිරසාර කර්මාන්තයක් බවට පත්කිරීමට ඇති හැකියාව
- දැනට පවතින උදුන් නවීකරණය කිරීමට අවශ්‍ය නොවීම
- පද්ධතියේ ක්‍රියාකාරීත්වය අවශ්‍ය ඕනෑම විටක නැවත සම්ප්‍රදායික පද්ධතියකට පරිවර්තනය කිරීමට ඇති හැකියාව
- එම පිරිවැය නැවත ගෙවීමේ කාල සීමාව වසර 2 ට අඩුවීම
- දර භාවිතයෙන් ක්‍රියා කරන උදුන් සහිත සියලු තේ කර්මාන්ත ශාලා සඳහා මෙම තාක්ෂණය භාවිත කළහොත්, ජාතික මට්ටමෙන් සැලකිය යුතු දර ප්‍රමාණයක් ඉතිරි කරගත හැක.

ii. **ව්‍යාපෘතිය - ජීව පදාර්ථ මගින් ක්‍රියා කරන අඩු වියදම් වියලනය**

ව්‍යාපෘතියේ අරමුණු : කර්මාන්තයන්හී භාවිතය සඳහා ජීව පදාර්ථ භාවිතා කරමින් නවතම සහ අඩු වියදම් වියලනය සංවර්ධනය හා පරීක්ෂාව.

ප්‍රතිලාභ

- ජීව පදාර්ථ ඉන්ධනයක් ලෙස සාදාගනු ලබන තාප ජනන පද්ධතියක් හඳුන්වාදීම
- භ්‍රමණ චලනයක් සහිත බැවින් රත්වූ වාතය සමග ගැටීම වැඩිවීමෙන් වියලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම වීම
- රත්වූ වාතය මගින් කෙලින්ම වියලීම සිදු කරන බැවින් දර භාවිතය අවම වීම
- වියලීම සිදුවන අතර පෙරණයක් ලෙස ක්‍රියා කරමින් සියුම් අංශු ඉවත් කිරීමද සිදු කරනු ලබයි.

iii. ව්‍යාපෘතිය - ගෘහස්ථ පරිභෝජනය සඳහා ජීව වායු පද්ධතිය

ව්‍යාපෘතියේ අරමුණු : ගෘහස්ථ භාවිතයේදී මළ අපද්‍රව්‍ය හා මුළුතැන්ගෙයින් පිටවන අපද්‍රව්‍ය එකවර ජීරනය කිරීම සඳහා වූ ජීව වායු ජීරකයක ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.

ප්‍රතිලාභ

ආහාර පිසීම සඳහා ගෘහස්ථ මට්ටමින් භාවිතා කරනු ලබන L P වායුව 80% කින් පමණ අඩු කිරීම සඳහා මෙම තාක්ෂණයම යොදාගැනීමේ හැකියාව.

iv. ව්‍යාපෘතිය - කි.වො 100ක බලශක්ති උත්පාදන පද්ධතියක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම

ව්‍යාපෘතියේ අරමුණු : බලශක්ති උත්පාදන පද්ධතියක්, ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම හා එහි ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලය වනුයේ ජීව පදාර්ථ උපයෝගීකර ගෙන විදුලි බලය නිපදවීමයි.

v. **ව්‍යාපෘතිය - ගම්මිරිස් අස්වනු පෙළීමේ යන්ත්‍රයක් වැඩි දියුණු කිරීම**

ව්‍යාපෘතියේ අරමුණු : ගම්මිරිස් ඇට නාරටියෙන් වෙන් කිරීම සඳහා යන්ත්‍රයක් හඳුන්වා දීම.

ප්‍රතිලාභ

- නිශ්පාදනවල තත්වය උසස් වීම
- ඉහල නිෂ්පාදන ධාරිතාව
- වැඩි ඵලදායීතාවය

(ක්ෂේත්‍ර පරීක්ෂණ ක්‍රියාත්මකයි)

vi. **ව්‍යාපෘතිය - තිරස් උපපෘෂ්ඨ ගැලීමට අනුව ඉදිකරනලද, තෙත් බිම් මගින් ගෘහස්ථ අපජලය පිරිපහදුව සඳහා ඇති අවකාශය අධ්‍යනය කිරීමේ නියමු ව්‍යාපෘතිය**

ප්‍රතිලාභ

ගෘහස්ථ අපජලය පිරිපහදුව සඳහා මෙම පද්ධතිය යොදාගත හැක. මෙමගින් ජනතාව සඳහා සෞඛ්‍ය සම්පන්න වටපිටාවක් නිර්මාණය කර ගත හැක. ඉහල ජන ඝනත්වයක් පවතින ප්‍රදේශ සඳහා මෙය වඩා ප්‍රයෝජනවත් තාක්ෂනයකි.

vii. **ව්‍යාපෘතිය - බීජ තෙල් නිස්සාරණ ඒකකය**

ව්‍යාපෘතියේ අරමුණු : පාරම්පරික අයුර්වේද වෙදකමේ ඉල්ලීම් සපුරාලීම සඳහා දේශීය සාම්පදායික බීජ සහ කොළ වලින් තෙල් නිස්සාරණයට යන්ත්‍රයක නිෂ්පාදනය කිරීම.

ප්‍රතිලාභ

මෙම යන්ත්‍රය මගින් නිස්සාරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව වැඩි කිරීම.

viii. **ව්‍යාපෘතිය - නියර සැකසීමේ යන්ත්‍රය**

ව්‍යාපෘතියේ අරමුණු : අවම ශ්‍රමයක් භාවිතා කර කුඹුරෙහි නියර සැකසීමේ යාන්ත්‍රික ක්‍රියාවලියක් සැකසීම.

ප්‍රතිලාභ

මෙමගින් කුඹුරු අස්වැද්දීමේ ක්‍රියාවලියේදී මිනිස් ශ්‍රමය භාවිතය අවම කර ගත හැක.

ix. ව්‍යාපෘතිය - වල් පැළ නෙළනය

ව්‍යාපෘතියේ අරමුණු : ගොයම් වගාවේ වල් පැළ නෙලීම සඳහා යන්ත්‍රයක් හඳුන්වාදීම මගින් මිනිස් ශ්‍රමය යොදාගැනීම අවම කිරීම.

6.2. නර්ඩ් තාක්ෂණයන් ජනතාව අතර ප්‍රචලිත කිරීම

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහය ඇතිව දිවයින පුරා පවත්වන ලදී. මෙම ක්‍රියාකාරකම් බොහොමයක් දිවි නැගුම හා දැයට කිරුළ ආදී රාජ්‍ය සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව සිදු කරන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ මුදල් අමාත්‍යාංශයේ මුදල් කොමිසමෙහි මගපෙන්වීම යටතේ නර්ඩ් මධ්‍යස්ථානය විසින් රාජ්‍ය හා පළාත් සභා නිලධාරීන් සඳහා පුහුණු සහ ආදර්ශන වැඩසටහන් සංවිධානය කිරීම 2011 වසරේදී ආරම්භ කරන ලද අතර එමගින් නර්ඩ් තාක්ෂණය අනාගතයේදී රාජ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට අවස්ථාව සැලසේ.

නර්ඩ් බලපත්‍ර

නර්ඩ් මධ්‍යස්ථානය මගින් තාක්ෂණික බලපත්‍ර ප්‍රදානය කර ඇති බලපත්‍රලාභීන් ප්‍රමාණය රටෙහි ඉල්ලුම සපුරා ලීමට ප්‍රමාණවත් නොවේ. වියදම් පිරිමැසුම්දායක නිවාස ඉදිකිරීමේ තාක්ෂණය සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානය විසින් ඉංජිනේරුවන්, සැලසුම් ශිල්පීන් සහ මේසන්වරුන් වෙනුවෙන් 2011 වසරේදී පුහුණු කිරීමේ වැඩ සටහන් 03ක් සංවිධානය කරන ලදී.

විශේෂ පුහුණු පාඨමාලාව (ක්ෂේත්‍රය තුළදී)- කරවඩ්ඩි

උතුරු පලාතේ කරවඩ්ඩි විදාතා මධ්‍යස්ථානයේදී තිස් දෙනෙකුගේ සහභාගිත්වයෙන් පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වූයේ තිස් වසරක් තිස්සේ පැවති ත්‍රස්තවාදී ක්‍රියා වලින් හානියට පත් ගොඩනැගිලි නැවත ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා මෙම තාක්ෂණ ක්‍රමය යොදා ගැනීමට අවස්ථාව සැලසාදීමය.

නර්ඩ් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද අන්තර්ජාතික පාඨමාලා

I. ***ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම පිළිබද සාක් සමුළුව***

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සාක් මහලේකම් කාර්යාලය සහ තාක්ෂණ හා පර්යේෂණ ආමත්‍යාංශයේ සහයෝගීත්වය ඇතිව 2011 මැයි මස 03දින සිට 05දින දක්වා මෙම වැඩසටහන පවත්වන ලදී.

භූතානය, ඉන්දියාව, නේපාලය යන රටවලන් සාමාජිකයින් අට දෙනෙක් සහ දේශීය සාමාජිකයින් හය දෙනෙක් මෙම වැඩමුලුව සඳහා සහභාගී වූහ. පළමු දින දෙක තුලදී ශ්‍රී ලාංකීය සම්පත් දායකයින් නව දෙනකු විසින් ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම වල පවතින තාක්ෂණික ලක්ෂණ පිළිබදව ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. මෙම කාල සීමාව තුල සාමාජිකයින් හට තම අත්දැකීම් හුවමාරු කරගැනීමටද අවස්ථාව උදා විය.

වැඩමුළුවේ අවසන් දිනයේදී රත්නපුරයේ ස්ථාපිත කර ඇති සුළු පරිමාණයේ විදුලිබල යෝජනා ක්‍රමයද පරීක්ෂා කරන ලදී.

II. **IOR-ARC වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද කලාපීය වැඩමුළුව**

වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද දින දෙකක ජාත්‍යාන්තර වැඩමුළුවක් නර්ඩ් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද අතර පළමු දිනයේදී වියදම් පිරිමැසුම්දායක නිවාස තාක්ෂණයේ විවිධ ක්ෂේත්‍ර පිළිබදව ශ්‍රී ලාංකීය සම්පත් දායකයින් හය දෙනෙකු විසින් ඉදිරිපත්කිරීම්ද දෙවන දිනයේ‍ නර්ඩ් මධ්‍යස්ථානයේ තාක්ෂණික උද්‍යානයේදී එම අවස්ථාවට සහභාගී වූවන් සඳහා තාක්ෂණ ක්‍රියාකාරකම් වැඩසටහනක් ද පවත්වන ලදී.

මෙමගින් සහභාගී වූවන් අතර දැනුම සහ වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය පිළිබද අත්දැකීම් හුවමාරු කරගැනීමට හැකිවිය.

III. ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වැඩසටහන

මෙම වැඩසටහන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජීය කොමිසමේ ආසියානු හා ශාන්තිකර තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය, ආසියා ශාන්තිකර ආර්ථික හා සාමාජීය කොමිසමෙහි හි මූල්‍ය දායකත්වයෙන් නර්ඩ් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, හා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලදී.

අරමුණු

පුනර්ජනක බලශක්ති තාක්ෂණයන් භාවිතය සඳහා ව්‍යාපාරිකයන් අතර සම්බන්ධතාවය ගොඩනැගීම.

ප්‍රතිඵල

නර්ඩ් මධ්‍යස්ථානයේ විශේෂඥයින් විසින් පුනර්ජනක බලශක්තිය හා ඒ ආශ්‍රිත තාක්ෂණය පිළිබඳව දැනුම හුවමාරු කරගන්නා ලදී. එමෙන්ම පුනර්ජනක බලශක්ති භාවිතයට ශ්‍රී ලංකාවේ ඇති අවස්ථා පිළිබඳ අදහස් හුවමාරුව මගින් සහභාගීවූවන් ප්‍රතිලාභ ලැබීය.

තේ කර්මාන්තය සඳහා වූ වැඩමුළුව

තේ කර්මාන්තයේ බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාව වැඩිකිරීම සඳහා ඇති අවස්ථා යන මැයින් එක් දින වැඩමුළුවක් රත්නපුරේදී පවත්වන ලදී. මෙහිදී තේ වියළීම සඳහා කුඩා දර කැබලි ඇතුල් කිරීමේ පද්ධතිය හඳුන්වා දීම සිදු කරන ලදී. මේ සඳහා තේ කර්මාන්තය නියෝජනය කරමින් 116 දෙනෙක් සහභාගී වූහ.

දැනුවත් කිරීමේ වැඩසටහන්

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අභිමතාර්ථ පහත දැක්වේ.

1. අදාල තාක්ෂණයන් ලබාගැනීමට පැමිණි ව්‍යවසායකයන් හඳුනා ගැනීම.
2. රටෙහි විවිධ ප්‍රදේශ වල අවශ්‍යතා සහ පවත්නා සම්පත් වලට අනුකූලව අවශ්‍ය තාක්ෂණයන් හඳුනා ගැනීම.

දිනය	පැවැත්වූ දැනුවත්කිරීමේ වැඩසටහන්	සහභාගීත්වය
2011.03.10	මහ නගරසභා, නගරසභා සහ ප්‍රාදේශීය සභා වල සැලසුම්කරුවන් හා තාක්ෂණික නිලධාරීන් සඳහා නර්ඩ් අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (දින 1/2)	45
2011.07.04	වයඹ පලාතේ නිලධාරීන් සඳහා නර්ඩ් තාක්ෂණයන් පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන	200
2011.08.05	ඌව පලාතේ නිලධාරීන් සඳහා නර්ඩ් තාක්ෂණයන් පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන	125
2011.09.21	ප්‍රාදේශීය සභා ප්‍රධාන ලේකම් සහ සහකාර ප්‍රධාන ලේකම් වරුන් සඳහා මුදල් අමාත්‍යාංශයේ පැවති නර්ඩ් වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන	30
2011.09.27	දකුණු පලාතේ නිලධාරීන් සඳහා නර්ඩ් තාක්ෂණයන් පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන	102
2011.12.12	මුදල් කොමිසමෙහි සහයෝගීත්වයෙන් සියලු පලාත්සභා වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	59
2011.12.15	පයාගල විද්‍යාතා මධ්‍යස්ථානයේ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	54

පුහුණු පාඨමාලා

විවිධ ආයතනවල ඉල්ලීම පරිදි පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වන ලදී.

දිනය	පැවැත්වූ පුහුණු කිරීමේ වැඩසටහන්	සහභාගීත්වය
2011.08.11	කොන්ක්‍රීට් දෙර ජනෙල් රාමු නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන -හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2012 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව)	49
2011.09.09	සැලසුම් ශිල්පීන් සඳහා වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද පුහුණු වැඩසටහන	36
2011.09.16	සැලසුම් ශිල්පීන් සඳහා වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද පුහුණු වැඩසටහන	30
2011.09.27	සැලසුම් ශිල්පීන් සඳහා වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද පුහුණු වැඩසටහන	56
2011.11.17	සිවිල් ඉංජිනේරුවන් සඳහා වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය පිළිබද පුහුණු වැඩසටහන	06

ප්‍රදර්ශන

ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය 2011 වසරේදී රටේ විවිධ ප්‍රදේශවල පැවති පහත සඳහන් ප්‍රදර්ශණ සඳහා සහභාගී විය. එමගින් පොදු ජනතාවගෙන් ඵලදායී පසු විපරම් තොරතුරු ලබාගැනීමට ආයතනයට හැකිවිය.

දිනය	ප්‍රදර්ශණයේ නම හා ස්ථානය
2011.02.04-10	2011 දැයට කිරුළ ප්‍රදර්ශනය - බුත්තල
2011.04.01-03	කිතුලට වරුණ ප්‍රදර්ශනය - විහාර මහා දේවී උද්‍යානය, කොළඹ. තාක්ෂණික අලෙවි අංශය විසින් සංවිධානය කරන ලද අතර කෘෂි ඉංජිනේරු සහ පස අස්වනු තාක්ෂණ අංශය සහභාගී විය
2011.04.10-12	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ ප්‍රදර්ශනය 2011 - BMICH
2011.06.24-26	INCO 2011 ප්‍රදර්ශනය - BMICH
2011.07.07-08	මීගමුව, පිටිපන ශාන්ත මරියා විද්‍යාලයේ ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සපයන ලදී.
2011.07.08-11	2011 පලාත් කර්මාන්ත ප්‍රදර්ශනය, නැගෙනහිර පලාත, ත්‍රිකුණාමලය
2011.08.11-14	විදුල්කා ප්‍රදර්ශනය - BMICH, බලශක්ති කළමනාකරණ හා පුනර්ජනක බලශක්ති අංශය සහභාගී විය
2011.09.07-09	කෘෂිකර්ම ප්‍රදර්ශනය - 2011, යාපනය කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානය
2011.09.14-16	info@ Ruwanpura , 2011, අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය, කහවත්ත රුවන්පුර ජාතික අධ්‍යාපනික ආයතනය
2011.10.07-09	2011 ටෙක්නෝ ප්‍රදර්ශනය
2011.10.24-25	තාක්ෂණ අලෙවි සැල- BMICH
2011.12.17	හික්කඩුව, සීනිගම දේවාලයේ පැවති ප්‍රදර්ශනය
2011.12.25-31	පනස්වන විදු අරුනළු - 2011, අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය, කිරිදිවැල

2011 ටෙක්නෝ ප්‍රදර්ශනය - රන් සම්මානය

2011 Techno ප්‍රදර්ශනයේදී වඩාත් නිර්මාණශීලී භාණ්ඩ සහිත වෙළඳ කුටිය සඳහා වූ රන් සම්මානය නර්ඩ් ආයතනය විසින් දිනා ගන්නා ලදී.

THE INSTITUTION OF ENGINEERS, SRI LANKA

NATIONAL ENGINEERING AND TECHNOLOGY AWARDS 2011

ENGINEERED FOR EXCELLENCE

This is to Certify that

National Engineering Research & Development Centre

received the GOLD award

for the

Most Innovative Stall

at the

National Engineering and Technology Exhibition 2011

Eng. (Prof.) A K W Jayawardane
President
The Institution of Engineers, Sri Lanka

Eng. (Brig.) Ananda Ranasinghe
President - Elect
Chairman Techno 2011
The Institution of Engineers, Sri Lanka

techno

26th ANNIVERSARY YEAR

දිවි නැගුම වැඩසටහන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දිවි නැගුම වැඩසටහනේ සාර්ථකත්වය සඳහා නර්ඩ් ආයතනය විසින් මහගු මෙහෙයක් ඉටු කරනලදී. ගෘහස්ත කර්මාන්ත හා සාමූහික වැඩසටහන් යටතේ, යෝජිත ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා, නර්ඩ් මධ්‍යස්ථානය මගින් සංවර්ධිත තාක්ෂණයන් අතරින් ඉහල ඉල්ලුමක් ඇති බවට හදුනාගත් තාක්ෂණයන් තෝරා ගැනීම සඳහා වූත්, සුදුසු ප්‍රතිලාභීන් හදුනා ගැනීම සඳහා වූත්, අවශ්‍යතා තක්සේරු කිරීම් මෙහිදී සිදු කරන ලදී. මේ යටතේ දිවි නැගුම වැඩසටහනින් හදුනාගත් සුපිරිසිදු පොල්තෙල් නිස්සාරණ යන්ත්‍රය වැනි තාක්ෂණයන් පැවරීම සඳහා කටයුතු ක්‍රියාවට නංවා තිබේ.

6.3. තාක්ෂණය පැවර්මේ ක්‍රියාවලිය

පුවත් පත් දැන්වීම් හරහා තෝරාගත් ව්‍යවසායකයින් සඳහා පහත තාක්ෂණයන් පැවරීම සිදු කරන ලදී.

- මඤ්ඤොක්කා පෙති කපනය / එළවළු පෙති කපනය
- කාර්මික දර උදුන

මඤ්ඤොක්කා පෙති කපනය

මෙම යන්ත්‍රය 2011 වසර තුලදී හඳුන්වාදුන් අතර එමගින් එළවළු, පලතුරු හා මඤ්ඤොක්කා උසස් ප්‍රමිතියෙන් සහ ඉහල වටිනාකමින් යුතුව නිශ්පාදනය කල හැක.

කාර්මික දර උදුන

ජීව පදාර්ථ ඉන්ධනයක් ලෙස යොදාගෙන වියදම් පිරිමැසුම්දායී ලෙස ආහාර පිසීම සඳහා මෙම උදුන යොදාගත හැක.

පේටන්ට් බලපත්‍ර සම්බන්ධ ක්‍රියාකාරකම්

2011 වසර තුලදී නර්ඩ් මධ්‍යස්ථානය මගින් සංවර්ධනය කරන ලද පහත තාක්ෂණයන් සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට කටයුතු සැලසුම් කරන ලදී.

1. ගම්මිරිස් ඇට වෙන් කිරීමේ කුඩා පරිමාණයේ යන්ත්‍රය
2. තේ කර්මාන්තය සඳහා යාන්ත්‍රික සහ කාර්යක්ෂම කුඩා දර ඇතුල් කිරීමේ යන්ත්‍රය

ඉදිරිපත් කරල ලද ලිපි හා ප්‍රකාශන

2011 වසර තුලදී පහත සඳහන් තාක්ෂණික ලිපි හා ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.

ලිපිය	කතෘ	ඉදිරිපත් කලේ	ප්‍රසිද්ධ කලේ
ස්ථාවර දහන පද්ධතිවල මුළු අවලම්භිත අංශු ප්‍රමාණය හා විෂ වායු පරීක්ෂාව	කේ.ටී ජයසිංහ	IESL	IESL සඟරාව - 44 වෙළුම2011 ඔක්තෝබර්
විදුලි උත්පාදනය සඳහා දර වායු ජනකයේ උත්පාදන වායුවේ තත්වය උසස් කිරීම	ඊ.එන්.කේ. එදිරිසිංහ	විදුල්කා, පුනර්ජනක බලශක්ති සම්මේලනය, සූනිත්‍ය බලශක්ති අධිකාරිය	
දර වායු ජනකයේ වායුව පිරිසිදු කිරීම	ඊ.එන්.කේ. එදිරිසිංහ	105 වෙනි වාර්ෂික සමුළුව, IESL, 2011 ඔක්තෝබර් 24	

තාක්ෂණ අලෙවි සල

නර්ඩ් මධ්‍යස්ථානය සහභාගීවූ එක් ප්‍රධානතම කාර්යයක් වනුයේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් බන්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද තාක්ෂණ අලෙවි ප්‍රදර්ශනය. මෙම ප්‍රදර්ශනයට සහභාගී වීමෙන් මධ්‍යස්ථානය සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගත් අතර මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් ඉදිරිපත් කිරීමටද හැකියාව ලැබින.

මුදල් කොමිසමෙහි සහයෝගීත්වයෙන් පැවති පලාත් සභා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තීරකයන් දැනුවත් කිරීමේ වැඩසටහන - 2011

මුදල් කොමිසමෙහි අනුග්‍රහය ඇතිව මෙම වැඩසටහන නර්ඩ් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. පලාත් නවය නියෝජනය කරමින් ප්‍රධාන ලේකම් වරු සහ අනෙක් ජ්‍යේෂ්ඨ නිලධාරීන් සමග ඉහල කළමණාකරණ මට්ටමේ නිලධාරීන් 59 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගී විය.

2011.12.12 දින පැවති මෙම වැඩමුළුවේදී පහත තීරණ වලට එලඹෙන ලදී.

1. 2012 වසරේදී නියමු ව්‍යාපෘතීන් ලෙස සෑම පලාතක් විසින්ම නර්ඩ් වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය යොදා අවම වශයෙන් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම.
2. මහ ජනතාවට පහසුවෙන් දැක බලා ගතහැකි ලෙස සුදුසු ස්ථානවල මෙම නියමු ව්‍යාපෘති ස්ථානගත කිරීම.
3. ඉදිකිරීම් අධීක්ෂණය සඳහා නර්ඩ් මධ්‍යස්ථානයේ සහයෝගය ලබා ගැනීම සහ කොන්ත්‍රාත් කරුවන් හා අමුද්‍රව්‍ය සපයන්නන් සමග සම්බන්ධීකරණය සඳහා සහය ලබාදීම.
4. ප්‍රදේශයේ ජනතාව තුල මෙම තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්, පුහුණු කම්කරුවන්, තාක්ෂණික නිලධාරීන් සහ ඉංජිනේරුවන් පුහුණු කිරීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානයේ සහයෝගය ලබා ගැනීම. මේ සඳහා පලාත් සභා නිලධාරීන් නර්ඩ් මධ්‍යස්ථානය සමග ඍජුව සම්බන්ධවී, එවන් පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සිදු කළ යුතුය.

පුවත්පත් සඳහා ලිපි සහ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්

2011 වසරේදී නර්ඩ් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීම සහ ජනතාව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදා ගන්නා ලදී.

6.4. නියමු ව්‍යාපෘති ස්ථාපනය/ඉදිකිරීම

1. අඩි පාලම ඉදිකිරීම

මොණරාගල දිස්ත්‍රික්කයෙහි පොල්ලෙබඩ ගමෙහි අඩි පාලමක් ඉද කරන ලදී.

භාවිතා කරන ලද තාක්ෂණය :ෆෙරෝ සිමෙන්ති තාක්ෂණය

ප්‍රතිලාභ

- සුළු කාලයකින් සාදා නිම කිරීමට හැකි වීම
- නඩත්තුව අවම වීම හා ගැමියන් හටම නඩත්තු කටයුතු සිදු කිරීමට හැකි වීම
- පවුල් 25ක් සඳහා ගමනාගමන පහසුකම් ලැබීම

2. ජල ටැංකි ඉදිකිරීම

ලීටර 5000 ජල ටැංකියක් වෙහෙරගල, බන්ඩාරගල ප්‍රදේශයේ ඉදිකිරීම

පෙරසවි ෆෙරෝ සිමෙන්ති තාකෂණය යොදා ගනිමින් ලීටර 5000 ජල ටැංකියක් තණමල්විල, වෙහෙරගල ප්‍රදේශයේ ඉදිකරනලදී.

ප්‍රතිලාභ

- අඩු වියදම
- සුළු කාලසීමාවකින් ඉදිකිරීමට හැකිවීම

වියදම - රු 35,000.00

6.5. ඉදිකිරීම් ව්‍යාපෘතින්

- වියදම් පිරිමැසුම් තාක්ෂණය යොදාගත් ඉදිකිරීම්
- නර්ඩ් මධ්‍යස්ථානය විසින් හඳුන්වාදෙන් තාක්ෂණයන් පැහැදිලි කිරීම සඳහා, රටෙහි විවිධ පලාත්වලින් ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් භාරගෙන වැඩ අවසන් කරනලදී.

ව්‍යාපෘති අංක 01

බෝයගනේ හමුදා කදවුරෙහි දියරමය අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිර්වායු ජීරකයක් ඉදි කිරීම.

ධාරිතාව - මීටර් කියුබ් 20

ප්‍රතිලාභ

අදාල කදවුරෙහ මුලුතැන්ගෙයෙහි ආහාර පිසීම සඳහා ජීව වායුව උත්පාදනය.

ව්‍යාපෘති අංක 02

යාපනය, කරවඩ්ඩිහි විදාතා ගොඩනැගිල්ල ඉදි කිරීම.

කරවඩ්ඩි ප්‍රදේශීය ලේකම් කාර්යාලය සඳහා නව විදාතා ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

<u>භාවිත කල තාක්ෂණය</u>

- පෙර සවි කුළුණු
- කොන්ක්‍රීට් දොර ජනෙල් රාමු
- නර්ඩ් ස්ලැබ් ක්‍රම

පිරිවැය - මිලියන 5.2

කාල සීමාව - මාස 03

ව්‍යාපෘති අංක 03

පොලොන්නරුව රෝහලෙහි හෙද නේවාසිකාගාරය ඉදිකිරීම.

බිම් ප්‍රමාණය - ව.අ 11,000

පිරිවැය - මිලියන 25

භාවිත කල තාක්ෂණය

- සිමෙන්ති පස් ගල් - කපරාරුව අවශ්‍ය නොවේ
- පෙර සවි කුළුණු
- කොන්ක්‍රීට් දොර ජනෙල් රාමු

6.6. උපදේශක සේවාවන්

නර්ඩ් මධ්‍යස්ථානය විසින් සපයනු ලබන උපදේශක සේවා ප්‍රධාන වශයෙන් මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් හා අනෙකුත් පාර්ශවයන්ගෙන් ජනතාවට දැරියහැකි වියදමකට සේවා ලබාදීමට නොහැකි විශේෂිත ගැටළු වලට අදාල තාක්ෂණයන් කේන්ද්‍ර කරගෙන සිදු කරයි. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් ලබාදෙන උපදේශක සේවා ඉදිකිරීම් කර්මාන්තය, කෘෂි කාර්මික අංශය, පසු අස්වනු තාක්ෂණය, පුනර්ජනක බලශක්තිය, බලශක්ති කළමනාකරණ හා පරිසර දූෂනය අවම කිරීම ආදී ක්ෂේත්‍ර මුල් කරගෙන සිදු කරයි.

උපදේශක සේවා ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර පහත පරිදිවේ.

1. සිවිල් ඉංජිනේරු
2. බලශක්ති හා පාරිසරික කළමනාකරණ
3. පුනර්ජනක බලශක්ති
4. විදුලි, විද්‍යුත් හා මෙකට්‍රොනික්ස්
5. සැලසුම් නිර්මාණ හා කර්මාන්ත සඳහා උපදේශකත්වය

1. සිවිල් ඉංජිනේරු

වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය යොදා ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ උපදේශක සේවා

a) වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය යොදා මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් 22ක් සඳහා පුසතකාල ගොඩනැගිලි ඉදි කිරීම

විශේෂ ලක්ෂණ

නර්ඩ් අත්තිවාරම, පෙර සවි කුළුණු, පෙර සවි කොන්ක්‍රීට් කාප්ප හා බාල්ක , සිමෙන්ති පස් ගල් යන ආදිය භාවිතය.

b) ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති සිමෙන්ති පස් ගල් පිළිබද පැහැදිලි කිරීමේ වැඩසටහනින් පසු ජනාධිපති ලේකම්තුමා විසින් දැයට කිරුළ 2012 වැඩසටහනට සමගාමීව ව්‍යාපෘතීන් කිහිපයක් යෝජනා කරන ලදී.

c) විද්‍යාතා මධ්‍යස්ථාන සඳහා උපදේශක සේවා

සිවිල් ඉංජිනේරු අංශය විසින් සැලසුම් සැකසීම, ඇස්තමේන්තු හා අධීක්ෂණය මගින් නර්ඩ් තාක්ෂණය යොදාගෙන විද්‍යාතා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා උපදේශක සේවා සපයන ලදී. මේ සඳහා පැල්මඩුල්ල, කහවත්ත, වැලිගපොළ, ඕපනායක, ඇහැලියගොඩ, ඉඹුල්පේ, නිවිතිගල, හාලිඇල හා කිරිඇල්ල විද්‍යාතා මධ්‍යස්ථාන සම්බන්ධ යොදා ගනියි.

ව්‍යාපෘතියේ මුළු පිරිවැය - මිලියන 75 , ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර ඇත.

2. බලශක්ති හා පාරිසරික කළමණාකරණ අංශය (E&MC)

බලශක්ති හා පාරිසරික කළමණාකරණ අංශය විසින් කර්මාන්ත සඳහා උපදේශක සේවා සැපයීම පහත අංශ යටතේ සිදු කරන ලදී.

- බලශක්ති විගණනය
- විද්‍යාගාර පරීක්ෂාව
- කර්මාන්ත සඳහා පාරිසරික බලපෑම් පාලනයට විසඳුම් සැපයීම
- පාරිසරික රෙගුලාසි වලට අනුව මිනුම් කටයුතු සිදු කිරීම
- බොයිලේරු තත්ව පරීක්ෂාව හා දුම් පරීක්ෂාව
- කාර්යක්ෂම බලශක්ති භාවිතය සඳහා සැලසුම්
- කර්මාන්ත ක්‍රියාවලි පරීක්ෂාව හා උපදේශනය

2011 වසරේදී සැපයූ සේවාවන්හී වටිනාකම රු.6,465,605/-.

පාරිසරික ගැටළු සඳහා විසඳුම් සැපයීම

වැලි පිරිසිදු කිරීමේ කර්මාන්තයේදී සිදුවන පහත සඳහන් පාරිසරික ගැටළු නිරාකරණය සඳහා ඉල්ලීම් ඉදිරිපත්විය.

- කර්මාන්තයෙන් නිකුත්වන මඩ වතුර මගින් ප්‍රදේශයේ භූගත ජලය දූෂණය වීම හා මහජනයාට අහිතකර තත්වයක් නිර්මාණය වීම
- සේදීමෙන් පසු එකතුවන රොන් මඩ ආසන්නයේ පිහිටි ඉඩම් වලට ගැටළු ඇති වීම

විසඳුම්

පෙරීමේ පද්ධතියක් මගින් මඩ වතුර නැවත භාවිතයට ගැනීම හා රොන් මඩ වැලි හාරන ලද වලවල් නැවත ගොඩ කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණික පද්ධතියක් ආයතනය විසින් සැලසුම් කරන ලදී.

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

1. භාවිත කරන ලද ජලය නැවතත් ක්‍රමවත් ආකාරයට වැලි සේදීමේ කියාවලිය සඳහා ගැනීම
2. භාවිත ජලය නැවත ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා බැවින් භූගත ජලය භාවිතයට ගැනිම අවම කර ගත හැකි වීම හා වාෂ්පීකරණයෙන් පමණක් හැකිවේ.
3. කොන්ක්‍රීට් තට්ටුවක් යොදා පද්ධතිය පොළවෙන් වෙන් කර ඇති බැවින් භූගත ජලය දූශණය වීමක් සිදු නොවීම
4. වියලි රොන්මඩ හා මඩ, බිම් සැකසුම් සඳහා අලෙවිකළ හැකි වීම

3. පුනර්ජනක බලශක්ති අංශයන් සපයන උපදේශක සේවා

පුනර්ජනක බලශක්ති අංශය මගින් සපයන ලද උපදේශක සේවා පහත දැක්වේ.

- භෂ්මකයෙහි දුම් කවුලුව ප්‍රතිසංස්කරණය

කුරුණෑගල රෝහලෙහි අඩි 45ක් උස, අඩි 1.5 විශ්කම්භයන්ගෙන් පරිධියෙන් යුත් භෂ්මකයේ දුම් කවුලුව ප්‍රතිසංස්කරනය සඳහා මධ්‍යස්ථානය විසින් සේවා සපයන ලදී.

- රාගම රෝහලෙහි භෂ්මකයේ LP ගෑස් දහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම. ස්වයංක්‍රීය කාර්මික දහන පද්ධතිය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරන ලදී.

4. විදුලි, විද්‍යුත් හා මෙකට්‍රොනික්ස් අංශයෙන් සපයන උපදේශක සේවා

මෙම අංශය මගින් පහත අංශ යටතේ උපදේශක සේවා සපයන ලදී.

- PLC පිළිබඳ මූලික පුහුණුව
- පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

පරීක්ෂණ ක්‍රමාංකනය සහ පරීක්ෂණාගාර සේවා

නර්ඩ් මධ්‍යස්ථානය විසින් 2011 වසර තුළදී පරීක්ෂණාගාර සේවා හා අනෙකුත් පරීක්ෂාවන් සඳහා පහසුකම් කර්මාන්ත සඳහා සපයන ලද.

2011 වසරේදී සිදුකරන ලද පර්යේෂණාගාර සේවා වලින් ලැබූ මුලු ආදායම රු. 5,841,024/-

5. සැලසුම් නිර්මාණ හා උපදේශකත්ව සේවා අංශය විසින් සිදුකරන ලද උපදේශක සේවාවන් පහත දැක්වේ.

- රබර් කර්මාන්තය සඳහා නව අච්චු සැකසීම
- සැලසුම් නිර්මාණ සඳහා දළ සැලසුම් ඇඳීම
- ජිනසේන ආයතනය සඳහා CAD, CAM පිළිබඳ තාක්ෂණික ඥානය සැපයීම හා අච්චු සැකසීම.

2011 වසරේදී සිදුකරන ලද සේවා සඳහා ලැබූ මුලු ආදායම රු. 1,629,634/-

6.7 යටිතල පහසුකම් සංවර්ධනය

- වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම
- මධ්‍යස්ථානයේ සෞඛ්‍යාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම සඳහා වැසිකිලි හයකින් යුත් පද්ධතියක් ඉදිකරන ලදී.

භාවිතා කළ තාක්ෂණය - නර්ඩ් මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරන ලද සිමෙන්ති පස් ගල් ඇතුලු වියදම් පිරිමැසුම්දායක තාක්ෂණය.

07. සාමූහික සමාජ වගකීම්

7.1 ප්‍රජාව සඳහා ලබාදෙන සේවාවන්

මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය මගින් 2011 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සංවිධානය කෙරුණි.

- අභාවප්‍රාප්ත ඩී ඒ රාජපක්ෂ මහතා අනුස්මරණ කරමින් ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබූ 2011.09.05 වෙනි දින සිට දින 8ක් දක්වා මුලතිව් දිස්ත්‍රික්කයේ පැවති ඒලලේ තරඟාවලිය සඳහා සහභාගීවිය.
- මධ්‍යස්ථානය සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටුකළ මධ්‍යස්ථානයේ ආරම්භක සභාපතිවරයෙකු වූ අභාවප්‍රාප්ත විද්‍යා ජෝති ඒ එන් එස් කුලසිංහ මහතා අනුස්මරණය කරමින් ලේ දන්දීමේ වැඩසටහනක් 2011.10.26 දින පවත්වන ලදී

7.2 ආගමික සංගම්

නර්ඩ් මධ්‍යස්ථානයේ බෞද්ධ සංගමය සහ කතෝලික සංගමය යනුවෙන් ආගමික සංගම් දෙකක් පිහිටුවා ඇති අතර එම සංගම් මගින් මධ්‍යස්ථානයේ සියළුම කාර්ය මණ්ඩලයේ මානසික හා අධ්‍යාත්මික යහපත සඳහා වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. ආයතනයේ සෑම සාමාජිකයෙකුම පාහේ මෙම ආගමික කටයුතු සඳහා ස්වේච්ඡාවෙන්ම සහභාගී වීමත් අදාළ සංගම්වල සාමාජිකත්වය ලැබීමත් සුවිශෙෂී ලක්ෂණයකි.

2011 වර්ෂයේදී මෙම සංගම් මගින් පහත සඳහන් ආගමික ක්‍රියාකාරකම් සංවිධානය කෙරුණි.

7.2. 1 බෞද්ධ සංගමයේ ක්‍රියාකාරකම්

- 2011 ජනවාරි 03 වෙනි දිව සෙත්පිරිත් සජ්ජායන වැඩසටහනෙන් මධ්‍යස්ථානයේ නව වසරේ වැඩකටයුතු සුභ මොහොතින් ආරම්භ කරන ලදී.
- වැලිගම්පිටිය ජා-ඇල නගරයේ පිහිටුවා ඇති ජයවර්ධන ළමා නිවාසයේ තනන ලද ජලටැංකිය අසල ප්‍රදේශය පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් 2011.04.09 දින පවත්වන ලදී.
- 2600 සම්බුද්ධ ජයන්තිය අනුස්මරණය කරමින් ජා-ඇල ශාෂනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛාධිකාරී පූජ්‍ය බෝගොඩ පියනන්ද හිමියන් වැඩමවා ධර්මදේශනයක් 2011.05.12 වෙනි දින පවත්වන ලදී.
- වෙසක් උත්සවය හිමිකරගෙන 2011 මැයි මාසයේ අළුතින් සාදන ලද වතුරටැංකිය වැලිගම්පිටිය ජා-ඇල පිහිටි ජයවර්ධන ළමානිවාසය වෙත භාරදෙන ලදී.
- පොසොන් උත්සවය අනුස්මරණය කරමින් ධර්මදේශනාවක් පූජ්‍ය නාවල පියනන්ද හිමියන් වැඩමවා 2011.06.14 දින පවත්වන ලදී.
- 2011 අගෝස්තු 27 සහ 28 යන දෙදින වන්දනා චාරිකාවක් පොළොන්නරුවේ සිද්ධස්ථාන බැලීම සඳහා සංවිධානය කෙරුණි.
- මධ්‍යස්ථානයේ ආරම්භක සභාපතිවරයෙකු වූ අභාවප්‍රාප්ත විද්‍යා ජෝති ආචාර්ය ඒ එන් එස් කුලසිංහ මහතා අනුස්මරණය කරමින් “බෞද්ධයා” ගුවනවිදුලි නාලිකාව මගින් 2011.10.25 දින ධර්මදේශනයක් විකාශනය කිරීමට කටයුතු කරන ලදී.
- 2011.12.16 දින වැලිගම්පිටිය, ජා-ඇල නගරයේ පිහිටි ජයවර්ධන ළමානිවාසය සඳහා දානමය වැඩසටහනක් සංවිධානය කෙරුණි.

7.2.2 කතෝලික සංගමය

මධ්‍යස්ථානයේ කතෝලික සංගමය මගින් වාර්ෂික නත්තල් දේවමෙහෙය 2011.12.22 දින සීදුව සුපුවත් අරණෙහි ගරු ඩැරල් කුඤ්ඤ පියතුමා විසින් පවත්වන ලදී.

08. ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

<u>ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය</u>

<u>ගිණුම්කරණ ප්‍රතිපත්තීන්</u>

01. මූලික ගිණුම් ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කරමින් ඓතිහාසික පිරිවැය සංකල්පය අනුව ඒකාකාරී පදනමක් මත ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන සහ 2011.12.31 දිනට ශේෂ පත්‍රය ඉදිරිපත් කොට ඇත.

02. ස්ථාවර වත්කම් හා තක්සේරු පදනම

ස්ථාවර වත්කම්

මහා භාණ්ඩාගාරය මගින් ස්ථාවර වත්කම් ප්‍රතිපාදනය කරලීමට මූල්‍යකරණය කර ඇත. ස්ථාවර වත්කම් වල දළ සංයුතික අගය සැකසී ඇත්තේ ගැණුම් මිලට හෝ පිරිවැය, රක්ෂණය, නිෂ්කාශණ ගාස්තු, පරිවහන ගාස්තු හා අනෙකුත් දේශීය වියදම් වලින් සමන්විත වර්තමාන තත්වයට ගෙන ඒම සඳහා දරණ ලද සියලුම වියදම් වලිනි.

පහත සඳහන් ප්‍රතිශතයන් මත සරල මාර්ග ක්‍රමය පදනම් කොට ක්ෂය කිරීම් කර ඇත.

		%
ගොඩනැගිලි	-	2.5
කාර්යාල උපකරණ	-	15
උපකරණ	-	15
ප්‍රදර්ශනාත්මක භාණ්ඩ	-	15
පරිගණක යන්ත්‍ර	-	33.33
රථ වාහන	-	15
ලී බඩු උපකරණ		10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්		15
පුස්තකාල පොත්	-	5
යටිතල පහසුකම්		15

- ප්‍රධාන වශයෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ස්ථාවරවත්කම් මිලදී ගෙන ඇත.

2011.01.21 දින අංක 01-2011 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල අංක 3.2 අයිතමය ප්‍රකාරව ලබාදෙන ලද ස්ථාවර වත්කම් හා යටිතල පහසුකම් ප්‍රත්‍යාගනනය කරලීමේ අනුමැතියට අනුව 2007.12.31 දිනට ගොඩනැගිලි හා යටිතල පහසුකම් ප්‍රත්‍යාගනනය කර ඇත.

SLAS ප්‍රමිති අංක 18අනුව 2010 වර්ෂයේදි ප්‍රත්‍යාගණනය සිදු කල අතර එම ප්‍රත්‍යාගණනයෙන් වැරදීමකින් ගිලිහුණු පහත ගොඩනැගිලි නැවත එම කයාදාමයට පහත පරිදි යොමු කර ඇත.

වත්කම්	මුළු පිරිවැය 31.12.2007	සමුච්චිත ක්ෂය 31.12.2007	ලියාහල අගය 31.12.2007	ප්‍රත්‍යාගනිත අගය 31.12.2007	ප්‍රත්‍යාගනිත අතිරික්තය (ඌනතාවය)
ශ්‍රවණාගාර ආකෘතිය				165,002.00	165,002.00
අමතර විදුලි උත්පාදකය රැදවුම්හල				990,000.00	990,000.00
කෘෂි ඉංජිනේරු අංශ ගොඩනැගිල් ල	231,239.20				231,239.20
Photosphere Meter එක සඳහා යලි තීන්තාලේපය	6,900,886.24	5,383,221.95	1,517,664.29	2,000,000.00	482,335.71
2011 වර්ෂය සඳහා මුළු ප්‍රත්‍යාගනිත අගය වැඩිවීම					1,868,576.91

NERDC

ඒ අනුව රු. 350,060,917.20 වන ප්‍රත්‍යාගනන සංචිතයක් උත්පාදනයව ඇත.
ප්‍රවර්තන වර්ෂය තුලදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් චක්‍රලේඛණ 155 යටතේ මෝටර් කාර් රථයක් හා වෑන් රියක් මධ්‍යස්ථානය වෙත වෙන් කර ඇත. පහත සඳහන් පිරිවැය අංගයන් ගෙන් මේවායේ පිරිවැය සමන්විතව තිබුනි. මෙම වාහන මධ්‍යස්ථානය වෙත නිකුත් කරලනු ලබනුයේ සී/ස ටොයෝටා ලංකා සමාගමය.

අගය රුපියල්

වාහන අංක	WP KR 5435	WP NB 1631	එකතුව
මහා භාණ්ඩාගාරය නිකුත් කල වාහන 02 හි පිරිවැය	6,750,000.00	9,100,000.00	15,850,000.00
රක්ෂණ	92,491.72	65,054.17	157,545.89
බලපත්‍ර ගාස්තු	3,410.00	4,538.00	7,948.00
එකතුව	6,845,901.72	9,169,592.17	16,015,493.89

ආයතනය විසින් අත්පත් කර ගන්නා ලද ස්වාධීකාර හා වෙළද ලකුණු ශේෂ පත්‍රයෙහි වෙන් වෙන් වශයෙන් ස්වාධිකාර හා වෙළද ලකුණු යටතේ දක්වා ඇත.

03. තොග

අගය කිරීමේ පදනම

අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ වල පිරිවැය ගණනය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන ක්‍රම දෙකෙන් අඩු අගයටය. තොග නිකුත් කරලීම් කර ඇත්තේ පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයටය.

නිමි තොග හා කෙරීගෙන යන වැඩ - සිවිල් අංශයේ කෙරීගෙන යන වැඩ වල අගය ගණනය කිරීමේදී භාවිතා කල අමුද්‍රව්‍ය, ශ්‍රමය හා පොදු කාර්ය්‍යා පිරිවැය ගනන් ගෙන ඇත.

04. ඉදිකිරීම් කොන්ත්‍රාත්

- නර්ඩ් තාක්ෂණය ජනතාව අතරට ප්‍රචලිත කිරීමේ ඵලදායී පියවරක වශයෙන් රාජ්‍ය අංශය වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු මධ්‍යස්ථානය විසින් බාරගනු ලැබේ.

- එවන් ව්‍යාපෘතියක අතිරික්තය / ඌනතාවය ගණනය කරනුයේ ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු අදාල බිල්පත් සහතික කිරීමට යටත්වය.

- එවන් ව්‍යාපෘතියක කෙරීගෙන යන වැඩ අගයනුයේ සේවක වැටුප් හා පොදුකාර්ය වියදම් ඇතුලත්ව පිරිවැය පදනම් කරගෙනය.

05. ප්‍රතිලාභ

1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනතට අනුව මධ්‍යස්ථානයේ වර්ෂයක් සේවය සපුරාලන සේවකයින් සඳහා වෙන් කිරීම් කර ඇත. පාරිතෝෂික ගෙවීම සඳහා වාර්ෂික අවශ්‍යතාවය භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රතිපාදනය තුලින් ඉටු කෙරේ. මෙම ප්‍රතිපාදනය ගණනය කරනුයේ අවසන් වරට ලබා ගත් මූලික වැටුප හා ජීවන වියදම් දීමනාවෙන් හරි අඩක් වූ පිරිවැය, වැඩ කල සම්පූර්ණ වර්ෂ ප්‍රමාණයේ ගුණිතයක් ලෙස ගෙනය.

සේවක ප්‍රතිලාභ

මධ්‍යස්ථානය මගින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක්ද සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා 3%ක් ලෙසද දායකත්වයන් සපයනු ලබයි.

06. තාවකාලික කැදවුම් තැන්පතු

ICAMS ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුනාවූ අගයන් ලංකා බැංකුවේ පවත්වාගෙන යන රාජ්‍ය ව්‍යවසායන්හි තාවකාලික අතිරික්තය අරමුදලට බැර කර ඇත.

ගණුදෙනුකරුවන්ගෙන් බාරගත් වැඩ සඳහා ගණු ලැබූ අත්තිකාරම් තාවකාලික කැදවුම් තැන්පතු ආකාරයෙන් තබාගෙන ඇත. ඒවා ආදායම් බවට පරිවර්තනය වන තෙක් ඒ මත උපයන පොලිය අමතර ආදායම් ලෙස දක්වා ඇත.

07. රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදාන වෙන් වශයෙන් හදුනා ගෙන ඇත. ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ පුනරාවර්තන ප්‍රදාන වන අතර මෙය මෙහෙයුම් වාර්තාවේ ප්‍රධාන ආදායම ලෙස බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදාන ස්ථාවර වත්කම් ක්ෂය සඳහා අදාල ගැලපුමට යටත්ව සමුච්චිත අරමුදලට බැර කර ඇත. රජය මගින් ලබාදෙන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත ආදායමක් සේ ගෙන ඇත.

08. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු වත්කම්

ණය ගැතියන් හා අනෙකුත් ලැබිය යුතු දෑ බොල්ණය හා අඩමාණ ණය ගැලපීමෙන් පසු ශුද්ධ උපලබ්ධි කල හැකි අගයට දක්වා ඇත. අවුරුදු 5 ක් ඉක්මවන ණයගැතියන් සඳහා 100% ද, අනෙකුත් ණයගැතියන් සඳහා 5% ලෙස වෙන්කර ඇත. තවද අයකර ගැනීමට නොහැකි බවට තහවුරුව ඇති ණයගැතියන් ආදායම් ප්‍රකාශන වලින් කපා හැර ඇත.

09. වෙන්කරලීම්

පසුගිය සිද්ධියක් හා සම්බන්ධිත (නෛතික හෝ උත්පාදක) වර්තමාන බැදියාවන් සඳහා වෙන්කරලීම් කර ඇත්තේ බැදියාවට අදාලව නිවැරදි ඇස්තමේන්තු සැකසිය හැකි වන විටදී හා සිදධියට අදාල ආර්ථික ප්‍රතිලාභ හා අදාල වන සම්පත් පිටතට යාම් ප්‍රවාහයන් පවතින විටදීය.

10. ණයහිමියෝ

මධ්‍යස්ථානය වෙත භාණ්ඩ ලබාදෙන අවස්ථාවේදීම වෙළඳ ණයහිමියන් හදුනා ගන්නවා ඇත.

11. අසම්භාව්‍ය වගකීම්

1942 අංක 45 දරණ කර්මාන්ත පනත හා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත මෙන්ම පරිපාලන රෙගුලාසි අංක XII පරිච්ඡේදයේ 09 වගන්තිය ප්‍රකාරව පුනර්ජනනීය බලශක්ති අංශයේ සේවයේ නියුතු එම් පී ඩබ් පි කුලසේකර මහතාගේ හදිසි අනතුර සඳහා ආසන්නව රු.500,000.00 ක වන්දි මුදලක් ගෙවීමට අපේක්ෂිතය.

හිටපු සේවකයෙකු වූ එස් සිල්වේරා මහතාගේ වත්තල කම්කරු විනිශ්චය සභාවේ අංක 31/194/2005 තීන්දුවට එරෙහිව ඔහු විසින් ගම්පහ අධිකරණයේ ගොනු කෙරුනු අංක 44/2010 යන නඩු කටයුත්ත ගොනු කර ඇත.

12. ආදායම

ප්‍රධාන ආදායම් ප්‍රභවය වන්නේ භාණ්ඩාගාරයෙන් ලබාදෙන පුනරාවර්තන ප්‍රදානයන්ය.

13. අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් සංයුක්ත වන්නේ සම්පූර්ණ කරන ලද වාණිජ ව්‍යාපෘති වල ශුද්ධ ආදායම, නැවත ලබා නොදෙන තැන්පතු මුදල්, සැපයුම්කරුවන් ලියාපදිංචි ගාස්තු, හානිවූ තොග විකුණුම්, ස්ථාවර වත්කම් බැහැර කරලීම් අතිරික්තය, පොදු කාර්ය පිරිවැය ආවරණය කර ගැනීම් යනාදය උපචිත සංකල්පය මතය. 2011.07.01 සිට පොදු කාර්ය පිරිවැය සෘජු ශ්‍රමය මත 100% සිට 35% දක්වා කළමනාකාරිත්වයේ තීරණයක් මත අඩු කර ඇත.

14. විලම්භීත ආදායම්

විලම්භීත ආදායම් ලෙස ගැනෙනුයේ රාජ්‍ය ප්‍රදානයන් මත ගොඩනැංවුනු ස්ථාවර වත්කම් වලට අදාල ක්ෂය වෙන් කරලීම්ය.

15. වියදම්

ආදායම් ප්‍රකාශනයන්හි වියදම් ලෙස හඳුනා ගනු ලබන්නේ යම්කිසි ආදායමක් උත්පාදනය කරලීම උදෙසා දායකත්වයක් සපයන පිරිවැය වේ. ආදායම් ප්‍රකාශනයන්හි නිරූපණය වනුයේ වාර්ෂික ක්ෂය ඇතුළු සියළුම වියදම්ය. නඩත්තු කටයුතු සඳහා ශ්‍රමය හා පොදු කාර්ය පිරිවැය අදාල නොකිරීමට කළමණාකාරිත්වය තීරණය කර ඇත.

16. සේවකයන්ගෙන් ලැබෙන ප්‍රවාහන ආදායම

2011.09.28 දින අංක 09-2011අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 6.1 ට අනුව MM කාණ්ඩයෙන් පහල සේවකයන්ගෙන් අය කරනු ලබන ප්‍රවාහන කුලී ප්‍රතිපූරණය අතහැර දමා ඇත. ඒ අදාල චක්‍ර ලේඛ ප්‍රකාරව විධායක නොවන නිළධාරීන් හට කාණ්ඩගත ප්‍රවාහන හිමිකම් නොමැති බව අවධාරනය වීමෙනි. මෙය ක්‍රියාත්මක කරලීමට පෙර කළමනාකාරීත්වයට නිසි ප්‍රවාහන පිළිවෙතක් සෑදීමට උපදෙස් දෙනු ලැබීය. ඒ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ඇතුළු අනවශ්‍යා සේවක කැළඹීම් වළක්වනු පණිසය.

17. පර්යේෂණ සහ සංවර්ධන වියදම්

මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබෙන පර්යේෂණ හා සංවර්ධන වියදම් වල ආදායම් ප්‍රතිපත්තිය වනුයේ අදාල වියදමට හිලව් කරලීමය. පර්යේෂණ සහ සංවර්ධන වියදම් පිරිවැය කරලීමේදී සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා 2011.02.01 සිට සෘජු ශ්‍රමයෙන් 35% ක් වන පොදු කාර්ය පිරිවැයද අඩංගුය. 2011.07.01 දිනට පෙර පොදු කාර්ය අවශෝෂණ අනුපාතය වූයේ සෘජු ශ්‍රමයෙන් 100% ගැනීමේ පදනමය.

NERDC

9. 2011.12.31 දිනට ගිණුම් වලට අදාල සටහන්

1. බොල්ණය ණය වෙන් කර ලීම

අගය (රු.)

ගණුදෙනුකරු	ණයගැති ශේෂය	යොදාගත් අනුපාතය	බොල්ණය වෙන්කරලීම
පහත සදහන් ණය ගැතියන් මත 100% බොල් ණය වෙන්කර ඇත			
ඇක්සසරීස් නෙට් වර්ක්ස් (පුද්ගලික) සමාගම	197,625.00	100%	197,625.00
හිරියාල ආර්ථික මධ්‍යස්ථානය	4,466,423.22	100%	4,466,423.22
D F CC බැංකුව	45,717.53	100%	45,717.53
පාතදුම්බර ප්‍රාදේශීය සභාව	221,513.00	100%	221,513.00
වැව්ලි මානව සංවර්ධන භාරය	214,810.00	100%	214,810.00
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	210,320.35	100%	210,320.35
උතුරු නැගෙනහිර නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	100,000.00	100%	100,000.00
ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	185,183.10	100%	185,183.10
පසු අස්වනු තාක්ෂණික ආයතනය	65,251.00	100%	65,251.00
පහත සදහන් ණය ගැතියන් මත 5% බොල් ණය වෙන්කර ඇත			
හිරියාල ආර්ථික මධ්‍යස්ථානය	663,837.15	5%	33,191.86
පරිසර අමාත්‍යාංශය	6,148.45	5%	307.42
උතුරු කොළඹ ශික්ෂණ රෝහල	270,786.65	5%	13,539.33
හමුදා මූලස්ථානය (South Wing)	1,588,098.77	5%	79,404.94
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	107,381.43	5%	5,369.07
පැලවත්ත ඩේරි (පුද්ගලික) සමාගම	371,152.65	5%	18,557.63
පහත සදහන් ණය ගැතියන් මත බොල්ණය වෙන් නොකෙරුනි			
සම්පූර්ණ නොවූ වැඩ ඇණවුම් පත් -2011	2,575,291.95	0%	
විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය	4,950.00	0%	
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	108,931.08	0%	

NERDC

2011.12.31 දිනට පූර්ව වර්ෂ ගැලපිම අගය (රු.)

කාරණය	මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම

2.1 N/RED/TT/287/2009

මීනුවන්ගොඩ ආදාහනාගාරය අළුත්වැඩියා කරලීම

2009 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කරන විට සී/ස ලියනගේ (පුද්ගලික) සමාගම වෙත ගෙවිය යුතු වූ රු.76,000.00 අතහැරී තිබීම

ගැලපීමෙන් පසු ව්‍යාපෘතියේ තත්ත්වය	2009/12/31 දිනට ව්‍යාපෘතිය	2011/12/31 දිනට ව්‍යාපෘතිය
ආදායම	469,297.13	469,298.13
වියදම	357,151.30	433,151.30
වියදම ගැලපූ පසු ආදායම	112,145.83	36,146.83

මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම
(76,000.00)	ණයහිමි ශේෂය රු.76,000.00 කින් වැඩි වීම.

2.2 N/CVL/TT/87/2005

කැස්බෑව විද්‍යාත මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා උපදේශක සේවාව

2006 වසරේ ව්‍යාපෘතිය නිමා කරන විට අදාල කොන්ත්‍රාත්තුව සඳහා රු.201,088.00 ක ඌන වෙන්කරලීමක් තිබීම.

ගැලපීමෙන් පසු ව්‍යාපෘතියේ තත්වය	2005	2006	2007	එකතුව
ආදායම	1,173,329.16	495,670.96	2,446,018.15	4,115,018.27
වියදම	369,937.45	475,273.85	2,641,755.87	3,486,967.17
	803,391.71	20,397.11	(195,737.72)	628,051.10

මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම
(189,364.53)	ණයහිමි ශේෂය රු.189,364.53 කින් ඉහල යාම

2.3 පාරිතෝෂික සඳහා ඌන වෙන්කරලීම

2010 වර්ෂයේදී පහත සේවකයින් සඳහා පාරිතෝෂික ඌන වෙන් කරලීමක් සිදුව තිබිනි.

	2010 වෙන්කරලීම	නිවැරදි කල වෙන්කරලීම	වෙනස
අයි.ඒ බී කමලානන්ද		213,150.00	213,150.00
ඩී සී එස් සිල්වා	203,470.00	222,860.00	19,390.00
ඩී ඩී ඒ නාමල්	683,870.00	779,185.00	95,315.00
	887,340.00	1,215,195.00	327,855.00

මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම
(327,855.00)	රු. 327,855.00 කින් පාරිතෝෂික වෙන්කරලීම ඉහල යාම

පත්වීම් දිනයන්හි නිවැරදි කරලීම් මත පාරිතෝෂික වෙන්කරලීම වෙනස් වීම 521,223.00

මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම
(521,223.00)	රු. 521,223.00 කින් පාරිතෝෂික වෙන්කරලීම ඉහල යාම

2.4 EMC/TT/2/2008

ගණුදෙනුකරුවන් හට පාරිසරික විගනන සේවා සැපයීම

රු.1,955.00 සහ රු.3,600.00 වන පිළිවෙලින් නොගෙවන ලද සී/ස යුනිලීවර් සමාගමේ හා සී/ස මිල්කෝ සමාගමේ රදවාගත් බදු අදාල ව්‍යාපෘති වලට අවශෝෂනය කර ගැනීම

	2008/12/31 දිනට ව්‍යාපෘතිය	2011/12/31 දිනට ව්‍යාපෘතිය
ආදායම	2,528,136.66	2,522,581.66
වියදම	1,624,628.37	1,624,628.37
	903,508.29	897,953.29

මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ට වූ බලපෑම	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම
(5,555.00)	ණයගැතියන් රු.5,555.00 කින් අඩුවීම

2.5 RED/COM/136/2004

සාලියපුර ජීවවායු ජීරකය
සාලියපුර ජීවවායු ජීරකය වෙනුවෙන් කල අළුත්වැඩියාව නිම කරලීම.

	2005/12/31 දිනට ව්‍යාපෘතිය	2011/12/31 දිනට ව්‍යාපෘතිය
ආදායම	1,434,423.00	1,434,423.00
වියදම	1,056,267.00	1,898,088.10
	378,156.00	(463,665.10)

(841,821.10)

තාක්ෂණ පැවරුම් ව්‍යාපෘති වෙනුවෙන් කෙරී ගෙනයන වැඩ රු.841,821.10) කින් අඩු වීම

2.6 2010.01.21දින පැවති No 1-2010 අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 4.2 යටතේ කටයුතු සම්පූර්ණව ඇතත් ආදායම්ගත නොවී දිගු කාලයක් අත්තිකාරම් වශයෙන් පැවති ගණුදෙනු ආදායම් බවට පත් කිරීම

ගණුදෙනුකරු	වර්ෂය	මුදල
ඊ වී මේරියන්	2005	1,750.00
එච් ඒ බී ඩේවිඩ්	2005	1,312.50
එච් ඒ පෙරේරා	2005	1,750.00
ඇග්‍රෝ ටෙක්නිකා ආයතනය	2005	875.00
ටොන් කේන් කන්ස්ට්‍රක්සන්ස්	2005	875.00
එම් ධර්මදාස	2005	21,875.00
එම් ධර්මදාස	2005	17,937.50
කාර්මික සංවර්ධන අධිකාරිය	2005	15,750.00
එම් ඩී ටී රොෂාන්	2005	1,750.00
මහවැලි ලිව්ස්ටොක්	2005	6,562.50
ඕ ඒ ටී ගුණරත්න	2005	1,750.00
ආර් මාලිගේ	2005	1,312.50
ආර් වී ආර් එම් රණසිංහ	2005	1,312.50
ආර් ඩබ් ලියනගේ	2005	1,750.00
CECB	2005	393.75
ටී බී ජීරසිංහ	2005	350.00
ලින්ක් ඉංජිනියරින්	2005	6,704.28
ඕල්ඩ් ෆැෂන් රෙස්ටුරන්ට්	2005	7,000.00
කෝට්ෆීල්ඩ්ස් ක්ලෝතින් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	2006	205,462.25
පහල හොරවඩුන්න මරණාධාර සමිතිය	2006	4,025.00
බුද්ධි එන්ටර්ප්‍රයිසස්	2006	885.50
විමලසේන	2006	5,685.31
ඊ ඒ ශාන්ති	2006	1,750.00
ඩබ් ඒ ජේ කේ සේනාධීර	2006	7,500.00
ඒ එම් බී ප්‍රියන්ත	2006	1,328.25
ගැමුණු විජේසිංහ	2006	7,437.50
පනාගොඩ හමුදා කඳවුර	2006	1,312.50
එෆ හේවාකුරුප්පු	2006	21,875.00
එස් ඒ සී එස් සුබසිංහ	2006	8,050.00
කමල් ජයවර්ධන	2006	4,375.00
අනුරාධ ප්‍රින්ටර්ස් ලිමිටඩ්	2006	892.50
චන්න ද සොයිසා	2006	17,500.00
ඩී එන් එච් අමරසරිය	2006	17,500.00

වසර 2010 ට පෙර රු.659,179.77 සහ 2010 වසරට රු.28,568.75

රු.687,748.52 කින් ගණුදෙනුකාර අත්තිකාරම් අඩු වීම

සුසිත් ඉන්ඩස්ට්‍රීස්	2006	1,500.00		
සමරසිංහ වින්ස්ක්‍රීන්	2007	10,062.50		
අජිත් කුමාර	2007	218.75		
සෙලින්කෝ ඩිවලොපර්ස් ලිමිටඩ්	2007	1,811.25		
I C D L ඉන්ඩස්ට්‍රීස්	2007	2,716.88		
I C D L ඉන්ඩස්ට්‍රීස්	2007	452.81		
කල්හාර බිල්ඩර්ස්	2007	1,750.00		
කේ සී එම් කන්ස්ට්‍රක්සන්ස්	2007	4,980.94		
පී එල් බී සේනාරත්න	2007	1,750.00		
රූම් ටු රීඩ් ශ්‍රී ලංකා	2007	25,156.25		
ඒ ජී ඒ ආර් පෙරේරා	2007	17,500.00		
I B S F කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්	2007	5,250.00		
මුත්තයියා සහ පුත්‍රයෝ	2007	8,750.00		
ආර් පී සී කන්ස්ට්‍රක්සන්ස්	2007	3,062.50		
එස් ටී බුලත්ගම	2007	437.50		
U.S.S. ඉන්ජිනියරින් පුද්ගලික සමාගම	2007	905.63		
කේ එස් ජේ කන්ස්ට්‍රක්සන්ස්	2007	11,018.44		
පී ගුණවර්ධන	2007	15,312.50		
ටෙක් මාස්ටර් ප්‍රයිවට් ලිමිටඩ්	2007	13,125.00		
කේ එල් සුරංග පීරිස්	2007	10,500.00		
මෙල් බ්‍රාස් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්	2007	875.00		
එන් ජී බී සඳරුවන්	2007	8,050.00		
එස් එල් එක්ස්පෝට් ප්‍රයිවට් ලිමිටඩ්	2007	40,862.50		
වෘත්තීය පුහුණු අධිකාරිය	2008	32,906.75		
එච් ඒ ජයරත්න	2008	25,187.50		
සහින් පෙරේරා	2008	4,375.00		
ටාජිට් ඇන්ඩ් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්	2009	6,918.40		
සිල්වමිල් කොකෝ වෙන්චර් ප්‍රයිවට් ලිමිටඩ්	2009	7,412.57		
සබරගමුව පලාත් සභාව	2009	2,741.76		
එස් එස් අබේසේකර	2009	10,000.00		
කාර්මික සංවර්ධන මණ්ඩලය	2010	10,193.75		
යුනිලිවර් ශ්‍රී ලංකා ලිමිටඩ්	2010	18,375.00		
		687,748.52		

<table>
<tr><th>කාරණය</th><th>මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම</th><th>මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට වූ බලපෑම</th></tr>
<tr><td>

2.7 ස්ථිර වත්කම් ප්‍රත්‍යාගනනය - ගොඩනැගිලි

ප්‍රත්‍යාගනන දිනය වන 2008/1/1 දිනට පහත ගොඩනැගිලි අතහැරී තිබුණි.

ශ්‍රවනාගාර ආකෘතිය 165,002.00
විදුලි උත්පාදකාගාරය 990,000.00
1,155,002.00

ක්ෂයවීම්

2008 28,875.05
2009 28,875.05
2010 28,875.05

</td><td>2010 වසරට පෙර පැවති ලාභය රු.57,750.10 කින් අඩුවීම හා 2010 වර්ෂයේ ලාභය රු.28,875.05 කින් අඩුවීම</td><td>2007/12/31 දිනට ගොඩනැගිලි අගය රු.1,155,002.00 කින් වැඩිවීම හා රු.1,155,002.00 කින් ප්‍රත්‍යාගනන සංචිතය වැඩිවීම.

සමුච්ච ක්ෂය වෙන් කරලීම රු.86,625.15 කින් වැඩිවීම</td></tr>
<tr><td>

2.8 අයතිවාසිකම් නොකියන ලද ණයහිමි ශේෂ

<table>
<tr><th>ණය හිමියෝ</th><th>අගය (රු.)</th><th>අධ්‍යක්ෂ මණ්ඩල තීරණ යොමුව</th><th>වෙනත්</th></tr>
<tr><td>ආර් ආර් කන්ස්ට්‍රක්සන්ස</td><td>12,650.23</td><td rowspan="2">අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 7-2011 තීරණ 4.6</td><td>C/20/849-ව්‍යාපෘති... බෙන්තොට ප්‍රාදේ... සභාවේ විදුලි පා... පරිපථය සාදනුවස් 2... වසරේ සිට වූ රදවා... මුදල්</td></tr>
<tr><td>ෆෙන්ටන්ස් ලිමිටඩ්</td><td>26,060.00</td><td>A/12/780- 2002 සි... සුබසාධන ගොඩනැගිල්ල</td></tr>
<tr><td>නිර්මන්ති ටිම්බර් ස්ටෝර්ස්</td><td>4,800.00</td><td>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 8-2011 තීරණ 4.6</td><td>2006 සිට පැවතෙන මිළයට ගැනීමේ ගනුදෙනුව</td></tr>
<tr><td>කල්හාර බිල්ඩර්ස්</td><td>11,723.47</td><td></td><td>වර්ෂ 2005 දී වෙනම අත්තිකාරමක් නොපැවතීම</td></tr>
<tr><td></td><td>55,233.70</td><td></td><td></td></tr>
</table>

</td><td>2010 ට පෙර පැවති ලාභය රු.12,650.23 කින් වැඩිවීම

2010 ට පෙර පැවති ලාභය රු.26,060.00 කින් වැඩිවීම

2010 ට පෙර පැවති ලාභය රු.4,800.00 කින් වැඩිවීම</td><td>රදවා ගැනීම රු.12,650.23 කින් අඩුවීම

රදවා ගැනීම රු.26,060.00 කින් අඩුවීම

රු.4,800.00 කින් ණය හිමි ශේෂය අඩුවීම</td></tr>
<tr><td>

2.9 දිරි දීමනා සඳහා අධි වෙන්කරලීම

2009 වර්ෂයේදී දිරි දීමනා අධි වෙන් කරලීම

</td><td>2010 ට පෙර පැවති ලාභය රු.2,194.52 කින් අඩුවීම</td><td>ගෙවිය යුතු වියදම් රු.2,194.52 කින් අඩුවීම.</td></tr>
<tr><td>

2.10 පශු තාක්ෂණ අංශයේ ගොඩනැගිලි ක්ෂය අධි වෙන් කරලීම

පශු තාක්ෂණ ගොඩනැගිලි පිරිවැය තුල උපචිතව තිබූ රු.289,048.98 ක් වන කොන්ත්‍රාත්කරු වන ඉෂානි ඩයස්ගේ අගය 2011-8 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 4.6 තීරණය අනුව නැවත මධ්‍යස්ථානයේ පොත් වලට ලියා හල බැවින් එහි බලපෑම ප්‍රත්‍යාගනිත ගොඩනැගිලි හා ක්ෂය වෙන් කරලීමෙන් ගැලපීම. ඒ අනුව ප්‍රත්‍යාගනිත සංචිතය රු.231,239.20 කින් වැඩිවීම.

</td><td>රු.57,809.78 කින් 2010 ට පෙර ලාභය වැඩිවීම</td><td>සුළු ණයහිමියන් රු.289,048.98 කින් අඩුවීම හා ප්‍රත්‍යාගනිත සංචිත රු.231,239.20 කින් වැඩිවීම.</td></tr>
<tr><td>

2.11 ගණුදෙනුකාර අත්තිකාරම්

ගණුදෙනුකරුවෙකු වන අරුණ පතිරගේ මහතා විසින් ලබා දෙන ලද රු.5000.00 ක අත්තිකාරමට 2008 සිට අයිතිවාසිකම් නොකිවූ බැවින් එය ආදායමට ගැනීම සඳහා කළමනාකාරීත්වය තීරණය කරලීම.

</td><td>2010 ට පෙර පැවත ලාභය රු.5000.00 කින් වැඩිවීම</td><td>ගණුදෙනුකාර අත්තිකාරම් රු.5000.00 කින් අඩුවීම.</td></tr>
<tr><td>

2.12R/19/867 - බහුතල සුළං පොම්පයක් සෑදීමේ නියමු ව්‍යාපෘතිය

2002 වර්ෂයේදි බහු තල සුළං පොම්පයක් සාදා දෙන ලද හා පසුව අයිතිවාසිකම් නොකියන ලද රු.32,812.50 ආදායම්ගත කිරීමට 2011 අංක 9 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 4.8 අනුව ක්‍රියාකරලීම.

</td><td>2010.01.01 ට පෙර පැවති ලාභය රු. 32,812.50 කින් වැඩි වේ.</td><td>ගණුදෙනුකාර අත්තිකාරම් රු.37,500.00 කින් අඩු කරලීම සහ දේශීය ආදායම් බදු කොටසක්ද රු.4687.50 කින් වැඩි කරලීම.</td></tr>
</table>

2.13 වාහන කුලියට ගැනීම සඳහා ඌන වෙන්කරලීම 2009 වර්ෂයේදී මිලාන් ටුවර්ස් වෙත ගෙවිය යුතු වූ වාහන කුලිය ඌන වෙන් කරලීම. **2.14 ණය හිමියන් වැඩියෙන් සටහන් වීම** 2010 වර්ෂයේදි වික්ටෝරියා ඉලෙක්ට්‍රිකල්ස් නමැති ණය හිමියා පියවීම වෙනුවට අදාල මුදල වන රු.1,800.00 ගොඩනැගිලි නඩත්තු වියදමට ගොස් තිබීම.	2010.01.01 ට පෙර පැවති ලාභය (රු. 2,820.00) කින් අඩු වේ. 2010 වර්ෂයේදී ලාභය රු.1800.00 කින් ඉහල යාම	රු.2,820.00 කින් උපචිත වියදම් වැඩිවීම ණයහිමි ශේෂය රු.1,800.00 කින් අඩුවීම
2.15 එම් ජේ එන් කේ එගොඩවෙල වෙතින් දිය යුතුව තිබූ ශේෂය 2011/11/22 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 11/2011හි තීරණ අංක 5.2 මගින් අනුමැතිය ලබාගත් හිටපු සේවක එම් ජේ එන් කේ එගොඩවෙලගෙන් ලැබිය යුතු අගය පොත් වලින් කපා හැරීම.	2009 වසරේ ලාභය රු.6,824.33 කින් අඩු කිරීම	ණයගැති අගය රු.6,824.33 කින් අඩු කිරීම
2.16 සුනාමි ණය ශේෂ 2008 ජනවාරි මස සේවක බී කේ ඒ යූ රොද්‍රිගු පියවන ලද සුනාමි ණය වාරිකය වැරදීමකින් වැටුප් පාලන ගිණුමට යෑම නැවත නිවැරදි කරලීම.	2009 වර්ෂයට පෙර පැවති ලාභය රු.1,569.00 කින් අඩුවීම	ණය ගැති ශේෂය රු.1,569.00 කින් අඩු වීම
2.17 සේවක ඒකාබද්ධ කරලීම මත පැන නැගුණු හිඟ වැටුප් වෙන් කරලීම DMS 30 ට අනුව සේවක ඒකාබද්ධ කරලීම හා ප්‍රතිව්‍යුහගත කරලීම මත ඇති වූ හිඟ වැටුප්	2010 වර්ෂයේ හිගය රු.1,500,000.00 කින් වැඩිවීම	හිඟ වැටුප් වෙන්කරලීම රු.1,500,000.00 කින් වැඩි කිරීම
2.18 2010 වර්ෂයේ වැටුප් සංශෝධනය සේවක ජී එම් අපෝන්සු මහතාගේ 2010 වර්ෂයේ වැටුප් ආපසු ගිණුම් ගත නොකිරීම	2010 වර්ෂයේ ලාභය රු.6,390.00 කින් වැඩිවීම	සේවක ණය ශේෂය රු.6,390.00 කින් වැඩිවීම

	ශේෂය ඉ/ගෙ 2010/1/1	2010 වර්ෂයට ලාභය
ශේෂය ඉ/ගෙ	(109,765,381.89)	(3,902,793.73)
2.1	(76,000.00)	
2.2	(201,088.00)	
2.3		(849,078.00)
2.4		(5,555.00)
2.5	(841,821.10)	
2.6	659,179.77	28,568.75
2.7	(57,750.10)	(28,875.05)
2.8	55,233.70	
2.9	2,194.52	
2.10	57,809.78	
2.11	5,000.00	
2.12	32,812.50	
2.13	(2,820.00)	
2.14		1,800.00
2.15	(6,824.33)	
2.16	(1,569.00)	
2.17		(1,500,000.00)
2.18		6,390.00

3. චලනය නොවන සහ හානිවූ තොග වෙන්කරලීම

2011 වර්ෂයේදී චලනය නොවන තොග රු.1,842,849.57 කින් ඉහල යාම.

4. මධ්‍යස්ථානයේ භාවිතය සඳහා නොවන මුදල් හා මුදල් සමාන දෑ

සී/ස ටොයෝටා ලංකා සමාගම වෙත තබන ලද රු.75,000.00 ක බැංකු සුරැකුමක් සඳහා අංක C/33734579 - 507908 යටතේ වූ ලංකා බැංකුවේ කැදවුම් තැන්පතු සහතිකය සුරක්ෂිතයක් ලෙස තැබීම.

10. 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (අගය - රුපියල්)

විග්‍රහය	2011	2010
මෙහෙයුම් මත ජනිත වූ මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය කටයුතු වලින් ලද අතිරික්තය/ඌනතාවය	(24,792,432.34)	(6,249,543.03)
මූල්‍යමය නොවන වෙනස්වීම්		
ක්ෂය	72,450,217.17	70,081,492.39
බොල් ණය වෙන් කිරීම (වැඩිවීම/අඩු වීම)	430,200.88	(169,328.92)
ගෙවිය යුතු බිල් වල (වැඩි වීම/අඩු වීම)	3,770,834.24	(6,061,644.98)
ණය ගැනීම් වල (වැඩිවීම/ අඩුවීම)	14,355,132.80	(16,543,021.63)
සේවක පිරිවැය මත (වැඩිවීම/අඩුවීම)	4,984,076.00	1,389,352.50
දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් මත වූ (ලාභ/අලාභ)	51,999.00	1,394.24
අනෙකුත් ජංගම වත්කම් වල (වැඩිවීම/ අඩුවීම)	2,265,350.96	1,709,431.64
ප්‍රත්‍යාගනනය මත ආයෝජන වලින් වූ (වැඩි/ අඩු)	482,335.71	-
අයවිය යුතු (වැඩි/ අඩු)	(15,526,354.56)	(5,935,964.36)
පෙර වර්ෂ වල ගැලපීම		(375,642.26)
මෙහෙයුම් වලින් ජනිත වු ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	58,471,359.86	37,846,525.59
ආයෝජන කටයුතු වලින් ජනිත වු මුදල් ප්‍රවාහය		
යන්ත්‍රෝපකරණ මිලයට ගැනීම්	(64,906,956.18)	(30,302,209.27)
උපකරණ විකුණුම්	(52,000.00)	(4,375,.00)
ආයෝජන වලින් ජනිත වු ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(64,958,956.18)	(30,306,584.27)
මූල්‍ය කටයුතු වලින් ජනිත වු මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	82,257,610.40	34,308,000.00
පර්යේෂණ ආදායමෙන් මාරුකරලීම්	(10,337,000.00)	
විලම්බිත ආදායමෙන් මාරුකරලීම්	(64,883,663.18)	(31,300,437.79)
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	7,036,947.22	3,007,562.21
මුදල් හා මුදල් සහ සමාන වත්කම් වල (වැඩිවීම්/අඩුවීම්)	549,350.90	10,547,503.53
කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන වත්කම්	79,563,825.31	69,016,321.78
කාල පරිච්ඡේදය අවසන් දිනට මුදල් හා මුදල් හා සමාන වත්කම්	80,113,176.21	79,563,825.31

11. 2011.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(අගය - රුපියල්)

විස්තරය	පිටු අංකය	2011	2010 ප්‍රතිශෝධිත
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන වතකම්	1	80,113,176.21	79,563,825.31
ලැබිය යුතු දෑ - වෙළඳ හා වෙනත්	2	83,503,351.38	68,407,197.70
භාණ්ඩ තොග	3	10,638,407.59	12,772.034.40
ඉදිරි ගෙවීම්	4	173,933.14	305,657.29
		174,428,868.32	161,048,714.70
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	5	445,408,927.96	437,710,830.60
අනෙකුත් මූල්‍ය වත්කම්	6	51,209,802.44	66,451,159.79
		496,618,730.40	504,161,990.39
මුළු වත්කම්		671,047,598.72	665,210,705.09
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	7	18,736,247.89	16,046,851.04
උපචිත වියදම්	8	11,245,634.63	10,164,197.24
		29,981,882.52	26,211,048.28
ජංගම නොවන වගකීම්			
විලම්භිත ආදායම්	9	170,212,660.26	155,857,527.46
ාරිතෝෂික සඳහා වෙන්කිරීම්	10	62,717,094.25	57,733,018.25
		232,929,754.51	213,590,545.71
මුළු වගකීම්		262,911,637.03	239,801,593.99
මුළු ශුද්ධ වත්කම්		408,135,961.69	425,409,111.10
ශුද්ධ වත්කම් / හිමිකම			
සමුච්චිත අරමුදල	11	408,135,961.69	425,409,111.10
ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව		408,135,961.69	425,409,111.10

NERDC

....	....	....
ඉංජී. ඩී. ආර්. පුල්ලපෙරුම	ඉංජී ඩී ඩී ඒ නාමල්	ඩී. වී. එස්. පෙරේරා
සභාපති	අධ්‍යක්ෂ ජනරාල්	මූල්‍ය කළමනාකරු

12. 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රතිඵල වාර්තාව

(අගය - රුපියල්)

විස්තරය	පිටු අංකය	31/12/2011	31/12/2010 ප්‍රතිශෝධිත
මෙහෙයුම් ආදායම			
පුනරාවර්තන දීමනා	1	139,687,000.00	137,642,000.00
විලම්බිත ආදායම්	2	50,528,530.38	47,843,459.42
අනෙකුත් ආදායම්	3	24,098,577.70	23,942,329.75
මුළු ආදායම		214,314,108.08	209,427,789.17
මෙහෙයුම් වියදම්			
සේවක වැටුප් හා වේතන	4	109,268,559.10	97,368,082.20
ගමන් හා යැපීම් දීමනා	5	1,039,292.92	419,229.63
සැපයුම් හා පාරිභෝජන භාණ්ඩ	6	9,284,739.75	8,802,230.81
නඩත්තු	7	5,794,479.43	9,622,868.14
ගිවිසුම්ගත ගෙවීම්	8	16,666,909.25	13,808,572.14
පර්යේෂණ සහ සංවර්ධන වියදම්	9	20,398,056.28	13,920,753.65
ක්ෂය කිරීම්	10	72,450,217.17	70,081,492.39
අනෙකුත් මෙහෙයුම් වියදම්	11	4,079,157.46	1,487,146.99
මූල්‍ය වියදම	12	125,129.06	166,956.25
මුළු මෙහෙයුම් වියදම්		239,106,540.42	215,677,332.20
වසර සඳහා (වැඩිවීම/අඩු වීම)		(24,792,432.34)	(6,249,543.03)

NERDC

13. 2011.12.31 දිනෙන් අවසන් වර්ෂයට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - අගය (රු.)

	ආරම්භක සමුච්චිත අරමුදල	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන අතිරික්තය	සමුච්චිත අතිරික්තය / ඌනතාවය	මුළු එකතුව	ප්‍රතිශෝධිත ශේෂය 2010.12.31
2009.12.31 දිනට ශේෂය	1,000,000.00	36,763,006.92	119,985,089.87	349,743,581.49	(110,141,024.15)	397,350,654.13	403,690,371.84
2010 වර්ෂය තුල ලැබීම්		34,308,000.00				34,308,000.00	11,940,000.00
ප්‍රත්‍යාගනන සංචිතයේ වැඩිවීම							
වර්ෂයේ අතිරික්තය / ඌණතාවය					(6,249,543.03)	(6,249,543.03)	(18,279,717.71)
විලම්භිත ආදායම් ගිණුමට මාරු කිරීම							
ප්‍රතිශෝධිත ශේෂය 2010.12.31	1,000,000.00	71,071,006.92	119,985,089.87	349,743,581.49	(116,390,567.18)	425,409,111.10	397,350,654.13
පෙර වර්ෂ ගැලපීම					(0.00)	(0.00)	
විලම්භිත ආදායමට මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන		(64,883,663.18)				(64,883,663.18)	
ආදායමට මාරු කරන ලද පර්යේෂණ ප්‍රදාන		(10,337,000.00)				(10,337,000.00)	
ප්‍රාග්ධන ලැබීම් 2011		82,257,610.40				82,257,610.40	34,308,000.00
ප්‍රත්‍යාගනන අතිරික්තය/ඌනතාවය				482,335.71		482,335.71	
වර්ෂයේ අතිරික්තය/ ඌනතාවය					(24,792,432.34)	(24,792,432.34)	(6,249,543.03)
2011.12.31 දිනට ශේෂය	1,000,000.00	78,107,954.14	119,985,089.87	350,225,917.20	(141,182,999.52)	408,135,961.69	425,409,111.10

NERDC

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No : ඊඑල්/ඒෆ්/එන්ඊආර්ඩී/ඒෆ්ෂ්/2011	ඔබේ අංකය / உமது இல / Your No.	දිනය / திகதி / Date : 2012 ජුනි 08 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය.

<u>ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තියේ හා 1 උප වගන්තිය අනුව සහ 1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මධ්‍යස්ථානයේ සභාපති වෙත 2012 මාර්තු 28 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

2:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස, දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිත 09 ට අනුව රු.5,239,980 ක් වූ මාස 03 ට වැඩි ස්ථාවර තැන්පතු මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

(ආ) ප්‍රමිත 16 ට අනුව සේවක පාර්තෝෂික ගෙවීම සඳහා රු.62,717,094 ක මුදලක් වෙන්කර තිබුණද එම මුදල සඳහා ආයෝජනයක් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2006 - 2010 දක්වා කාලපරිච්ඡේදය තුළදී මිලදී ගන්නා ලද රු.952,160 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ස්ථාවර වත්කම් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මෙම තොගයේ පොත් අගය රු.576,288 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද මෙය නිවැරදි කිරීමට හෝ පොත් වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී නිම වූ කෞතුකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය හා ඊට සම්බන්ධ තවත් ව්‍යාපෘති 15 ක කටයුතු නිම වී ඇතත් දීර්ඝ කාලයක සිට කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබූ අතර රු.50,166,931 ප්‍රාග්ධනිත කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) රු.5,961,229 ක් වටිනා සන්දින ඇමතුම් තැන්පතු සහතික 07 ක් හා රු.200,000 ක වටිනාකමැති ස්ථාවර තැන්පතු 02 ක් බැංකු ඇපකර ලෙස තබා ඇතත්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) නර්ඩ් මධ්‍යස්ථානය සතු යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම රු.111,770,056 ක් වූ අතර රු.1,517,633 ක අළුත්වැඩියා වටිනාකමක් ඇති යන්ත්‍රයක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.මෙම යන්ත්‍රය ප්‍රත්‍යාගණනය කිරීමට පදනමක් හෝ කමිටුවකින් සිදු කිරීම වෙනුවට එම අංශයේ ප්‍රධානියා විසින්ම සිදු කර තිබුණි.

(ඉ) තාක්ෂණ උද්‍යාන ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා දරන ලද රු.77,827 ක පුනරාවර්තන වැය ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ණයගැති ගිණුමේ ශේෂය රු.11,403,421 ක් වූ අතර වර්ෂ 5-8 ත් අතර කාලයක් පැරණි ශේෂය රු.5,542,695 ක් විය.තවද වර්ෂ 3-5 ත් අතර රු.592,665 ක හිඟ ණය ශේෂයක්ද, වර්ෂ 1-3 ත් අතර රු.618,261 ක හිඟ ණය ශේෂයක්ද විය.

(ආ) රු.2,060,329 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුල අවුරුදු 4ට වැඩි රු.128,730 ක ශේෂයක්ද විය.

(ඇ) 2004 වර්ෂයේ සිට හිරියාල ආර්ථික මධ්‍යස්ථානයෙන් අයවිය යුතු රු.5,130,260 ක් ද ඇයසර් නෙට්වර්ක් සමාගම වෙතින් අයවිය යුතු රු.197,625 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඈ) මධ්‍යස්ථානය විසින් විවිධ ව්‍යාපෘති සඳහා සේවාදායකයින්ගෙන් ලබාගෙන ඇති රු.10,837,474 ක අත්තිකාරම් මුදල් වර්ෂ ගණනාවක සිටම නොපියවා ඇති අතර, ඉන්වොයිස් නිකුත් නොකිරීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ශේෂය තුළ වර්ෂ 5 කට වැඩි ශේෂ රු.67,500 ක්ද, වර්ෂ 3-5 අතර ශේෂ රු.496,498 ක්ද , වර්ෂ 01 වැඩි ශේෂ රු.141,426 ක්ද විය.

(ඉ) සේවයෙන් ඉවත් වු නිලධාරීන් 24 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම සඳහා දීර්ඝ කාලයක සිට රු.807,818 ක් වෙන්කර තිබු අතර, එම මුදල නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

විෂයය	වටිනාකම (රු)	ඉදිරිපත් නොවූ සාක්ෂි
ස්ථාවර වත්කම්	444,965,739	සමීක්ෂණ මණ්ඩල වාර්තා
ණයහිමියෝ	2,060,329	අදාල පාර්ශවයන් විසින් ශේෂ සනාථ කිරීම්
ණයගැතියෝ	11,403,421	
සත්දින ඇමතුම් තැන්පතු	5,961,229	තැන්පතු සහතික
ස්ථාවර තැන්පතු	200,000	

2.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකුල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) මුදල් රෙගුලාසි 570	තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක කාලයක් තුළදී හිමිකම් නොපාන ඉකුත් තැන්පතු ආදායමට ගත හැකි වුවත් රු.32,800 ක් වටිනාකමැති ආපසු ගෙවිය යුතු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු ක ර නොතිබුණි.
(ආ) 2009 මැයි 26 දිනැති හා අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යවසාය දෙපා. චක්‍රලේඛයේ 8.3.3 ඡේදය	සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ගෙවීම සඳහා මධ්‍යස්ථානය රු.1,568,786 ක් වැයකර තිබුණද, උක්ත චක්‍රලේඛය ප්‍රකාර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2009 නොවැම්බර් 13 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ 438(2) අ(i), (ii), (iii) , (iv) මු.රෙ.756,756(4) 771(2)

මධ්‍යස්ථානය සතු රු.6,136,266 ක වටිනාකමැති අපහරනය කළයුතු තොග සම්බන්ධයෙන් චක්‍රලේඛයේ දෙවන ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2004 ජුනි 29 දින හා අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2006 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් අංක පීඑෆ්/පීඊ/9

අදාල අමාත්‍යවරයාගේ එකඟතාවය හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රු.2,600,748 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

2.2.6 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මධ්‍යස්ථානයට ගනුදෙනුකරුවන් විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තැන්පත් කර ඇති රු.64,809,474 ක මුදලක් 2004 වර්ෂයේ සිට සත්දින ඇමතුම් තැන්පත් වල ආයෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු. 24,792,432 ක ඌණතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 6,249,543 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 18,542,889 ක ඌනතාවයේ වැඩිවීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතු වූයේ පෞද්ගලික පඩි නඩි මිලියන 12 කින් වැඩිවීමත් පර්යේෂණ හා සංවර්ධන වියදම් මිලියන 6 කින් වැඩිවීමත් වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිවිල් අංශය

(i) 2011 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මට අනුව සිවිල් අංශය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 12 ක් සඳහා රු. 2,940,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර, එම ව්‍යාපෘති 2011 වර්ෂය තුළදී ආරම්භ කර නොතිබුණි.

(ii) ක්‍රියාකාර සැලැස්මට අනුව සිවිල් අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී නිපුණතා පුහුණු වැඩ සටහන් පැවැත්වීමෙන් රු. 8,800,000 ක්ද අඩු වියදම් තාක්ෂණ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් රු. 10,000,000 ක්ද ඉපැයීමට අපේක්ෂිත වුවද, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා අපේක්ෂිත ආදායම් ලැබී නොතිබුණි.

(ආ) තාක්ෂණ අලෙවි අංශය

	ඉලක්කය	ඉලක්කය කරා ළඟා නොවීම
	-----------	-----------------------
(i)	දිවයින පුරා නිවාස සැලසුම් ශිල්පීන් 80 ක් පත් කිරීම	සැලසුම් ශිල්පීන් පත්කර නොතිබුණි.
(ii)	විද්‍යාත මධ්‍යස්ථානවල දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පැවැත්වීම.	දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි.
(iii)	විද්‍යාත මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් 4 ක් පැවැත්වීම.	පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි.
(iv)	විද්‍යාත ප්‍රදර්ශන 10 කට සහභාගිවීම.	ප්‍රදර්ශන සඳහා සහභාගී වී නොතිබුණි.
(v)	විද්‍යාත සම්පත් මධ්‍යස්ථානවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි.

8

(vi) ඉංජිනේරු කෞතුකාගාරය

ළමා උද්‍යාන පහසුකම් සැලසීම	ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නැත
කෞතුකාගාර දේශනාගාරය නවීකරණය කිරීම	නවීකරණ කටයුතු සිදු කර නොතිබුණි.
කෞතුකාගාරය සඳහා උපදෙස් පත්‍රිකාවක් සකස් කිරීම හා දේශනාගාරය විවෘත කිරීම	උපදෙස් පත්‍රිකාව සකස් කර නොතිබුණු අතර විවෘත කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) කෘෂිකාර්මික හා පසු අස්වනු නාශක අංශය

ඉලක්කය	ඉලක්කය කරා ළඟා නොවීම
ජීව ඉන්ධන මගින් ක්‍රියාකරන ශීතාගාරය වැඩි දියුණු කිරීම	ආහාර කල්තබා ගැනීම සඳහා ජීවවායු ශීතකරන කාමරයක් සෑදීම ව්‍යාපෘතියේ අරමුණ වූ අතර ව්‍යාපෘතිය ආරම්භ කර නැත.
හතු කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ජීව වායුව යොදා ගැනීම	රු.433,343 ඇස්තමේන්තුගත අගයක් වූ මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.
පොල් වගාව සඳහා පොහොර යෙදීම පිණිස යන්ත්‍රයක් හඳුන්වා දීම	රු.248,912 ක පිරිවැයක් දරා උපකරණය සකස් කරන ලද අවශ්‍යතාවයට නුසුදුසු බව නිරීක්ෂණය විය.
තනි රෝදයේ ට්‍රැකටරය ප්‍රචලිත කිරීම	රු.474,308 ක පිරිවැයක් දරා උතුරු නැගෙනහිර ප්‍රචලිත කිරීම නියම වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළද සාර්ථක නොවීය.
පෙරසවි අංගනයක් සඳහා වානේ කම්බි ආතති ගැන්වීමේ හයිඩ්‍රොලික් යන්ත්‍රය නිපදවීම	රු.770,792 ක් වැයකර යන්ත්‍රය සෑදුවද මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) පුනර්ජන බලශක්ති අංශය

ඉලක්කය	ඉලක්කය කරා ළඟා නොවීම
ජීව ඉන්ධන මගින් ක්‍රියාත්මක වන මධ්‍යම ප්‍රමාණයේ තාපකය වැඩි දියුණු කිරීම	ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.
අන්තරාදායක අපද්‍රව්‍ය හා රෝහල්වල අපද්‍රව්‍ය සඳහා දාහකාගාරයක් නිර්මානය කිරීම හා සංවර්ධනය කිරීම	ව්‍යාපෘති වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි.
තේ වියලීම සඳහාඩීසල් මගින් ක්‍රියාත්මක වන පෝරණුවක්, දැව ඉන්ධන මගින් ක්‍රියා කරවීම	- එම -
දැව කැබලි කරන යන්ත්‍රයක් නිර්මානය කිරීම	එම

4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉන්ධන වශයෙන් දැව භාවිතා කරන විදුලි උත්පාදන පද්ධතියක් ක්‍රියාත්මකකර විදුලිය නිපදවා ජාතික විදුලිය පද්ධතියට සම්බන්ධ කිරීම

(i) ඉන්ධන වශයෙන් දැව භාවිතා කරන විදුලි බල උත්පාදන පද්ධතියක් ක්‍රියාකර විදුලිය නිපදවීම හා එය ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර එමගින් විදුලිය සඳහා වැය වන වියදම අවම කර ගැනීම ව්‍යාපෘතියේ අරමුණ විය. 2004 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක වී 2011 දෙසැම්බර් 31 දින වන විට රු.32,913,445 ක් වැය කර තිබුණද, මෙතෙක් ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුවේදී විදුලි උත්පාදන පද්ධතියේ අළුත්වැඩියා කටයුතු නිම කර තිබූ අතර නොවැම්බර් මාසයේදී ජනනය කළ විදුලිය පර්යේෂණ මට්ටමින් ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර තිබුණද, මෙම යන්ත්‍රයෙන් විදුලිය නිපදවීම සඳහා දිනකට පිරිවැය රු.24,480 ක් වැනි ඉහල අගයක් ගෙන තිබුණි. නිපදවනු ලබන විදුලිය ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කිරීමෙන් දිනකට රු.33,300 ක ආදායමක් ලබාගත හැකි බව මධ්‍යස්ථානයේ සභාපතිවරයා විගණනයට දැනුම් දී තිබුණද ඒ බව සනාථ කරන ලද ගිවිසුමක් හෝ වෙනත් ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නර්ඩ් මධ්‍යස්ථානයට ආපසු ප්‍රතිපූර්ණය කරගතහැකි රු.29,358,044 ක් වු එකතු කළ අගය මත බදු මුදල දිර්ඝ කාලයක සිට අය කරගෙන නොතිබුණි

(ආ) ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම

ව්‍යාපෘතිය	දරන ලද වියදම	නිරීක්ෂණ
	රු.	
සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා ජීව වායු ජනකයක් සෑදීම	1,898,088	ව්‍යාපෘතියේ අරමුණ වූ ජීව වායුව නිපදවීම සිදු නොවීම
කෙසෙල් ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම	855,782	කෙසෙල් ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා මල්ලක් නිපදවීම ව්‍යාපෘතියේ අරමුණ වුවද මේ සඳහා නිපදවූ මල්ල ගොවීන් අතර ප්‍රචලිත වී නොතිබුණි.

(ඇ) 2007 හා 2010 වර්ෂවලදී ආරම්භ කළ රු.2,637,857 ක් පිරිවැය දැරූ ව්‍යාපෘති 04 ක් පර්යේෂණ වියදම් ලෙස ගිණුම් වලින් ලියාහැර තිබුණද පර්යේෂණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වී තිබුණි. ඇතැම් ව්‍යාපෘති තාවකාලිකව අත්හැර දමා තිබූ අතර විධිමත් පරිදි අවසන් කර නොතිබුණි.

(ඈ) විදුලි ලාම්පු සම්බන්ධයෙන් අංක 2002:1231 හා 2002:.1225 යන ශ්‍රී ලංකා ප්‍රමිතීන් වල 4.6 ඡේදය අනුව විදුලි ලාම්පු පැය 2000 ක ආයුකාලය පසු කිරීමෙන් නිකුත් කරන කාර්ය සාධන පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා සාම්පල 801 ක් භාරදී තිබුණද කාර්ය සාධන වාර්තා 02 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඉ) තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානය වෙත ලැබුණු විදුලි ලාම්පු 338 න් කාර්ය සාධන වාර්තා නිකුත් කර තිබුණේ 14 ක් සඳහා පමණි.

(ඊ) විදුලි ලාම්පු පරීක්ෂණ වාර්තා ලබාගැනීමේ ප්‍රධාන සේවාදායකයා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියැදීන් සඳහා ඉන්වොයිසියක් නිකුත් කිරීමට මාස 4-19 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(උ) (i) මධ්‍යස්ථානයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් ලිපිකරුවෙකු 2007 වර්ෂයේදී විනය විරෝධී ක්‍රියාවක් හේතුකොටගෙන සේවයෙන් ඉවත් කර තිබුණි. එම සේවකයා කම්කරු විනිශ්චය සභාවේ පැවැරූ නඩුවක තීන්දුවට අනුව සේවයෙන් ඉවත් කළ දින සිට නැවත සේවයේ පිහිට වූ දිනය දක්වා වන්දි ලෙස රු.587,406 ක් ගෙවීමටත්, එම සේවකයා නැවත සේවයේ පිහිටුවීමටත් මධ්‍යස්ථානයට සිදුවිය. මෙහිදී කළමනාකරණය විසින් 2000 සැප්තැම්බර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයා සේවයෙන් ඉවත් කරන ලද 2007 අගෝස්තු 20 දින දක්වා වරින්වර කොන්ත්‍රාත් කාල සීමාව අඛණ්ඩව දීර්ඝ කර තිබුණි. මෙය කළමනාකරණයේ දුර්වලතාවය නිසා සිදුවූවක් නොවන බවත්, නඩු තීන්දුව අනුව වන්දි ගෙවීමට සිදුවූ බවත් සභාපතිවරයා දන්වා ඇත.

(ii) ආයතනයේ නීති උපදෙස් සඳහා නීති උපදේශකවරුයකු බඳවාගෙන තිබූ අතර නීති උපදේශකවරයෙකු සිටියදීත් මධ්‍යස්ථානයට නඩු සඳහා වන්දි ගෙවීමට සිදු වී තිබුණි. 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අග දක්වා නීති උපදේශකවරයාට නඩු ගාස්තු වලට අමතරව රු.1,179,000 ක් නීති උපදෙස් සඳහා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.153,000 ක් ගෙවා තිබුණි.

(ඌ) ආයතනයේ නිලධාරියෙකු බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් ලැබුණු රු.2,290,988 ක බැඳුම්කර ආදායම සන්දින ඇමතුම් තැන්පතුවල තැන්පත් කර තිබුණි. එම මුදල ඊට වැඩි ප්‍රතිලාභ ලැබෙන ස්ථාවර තැන්පතුවල අතිරික්ත භාර අරමුදලේ ආයෝජනය කිරීම සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි.

(එ) 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රදාන/සම්මාන වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු.1,083,995 ක් වූ අතර, වාර්ෂිකව ඉංජිනේරුවරුන්ට පිරිනමනු ලබන පර්යේෂණ හා සංවර්ධන සම්මාන/ප්‍රදාන 2010 හා 2011 වර්ෂවලදී පිරිනමා නොතිබුණි.

(ඒ) සේවාදායකයින් විසින් රඳවා ගැනීමේ බදු නොගෙවීම නිසා මධ්‍යස්ථානය විසින් රු.5,555 ක් ගෙවා තිබුණි.

4.3 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිපාලනයේදී සිදු වූ දෝෂයක් හේතුකොටගෙන මධ්‍යස්ථානයේ සේවකයෙකු මධ්‍යස්ථානයට විරුද්ධව පැවරූ නඩුවකින් එම සේවකයාට වන්දි ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.587,406 ක් ගෙවීමට සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට වගකීම් පැවරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිම වූ වාණිජ ව්‍යාපෘති පරීක්ෂාවේදී එම වාණිජ ව්‍යාපෘති 7ක් ක්‍රියාත්මක කිරීමෙන් මධ්‍යස්ථානයට රු.440,165 ක අලාභයක් සිදු වී තිබුණි. ව්‍යාපෘති වලින් ලැබූ ආදායම ඉක්මවා වියදම් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) 2006 වර්ෂයේදී පීඑම්එස්/30 වැටුප් පරිවර්තනයට අනුව වැටුප් ගෙවීමේදී වැඩිපුර ගෙවා ඇති රු.57,176 ක මුදල කොටස් වශයෙන් අය කර ගන්නා බව සභාපතිවරයා දන්වා ඇත.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කෝපායි වල විද්‍යා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමඟ 2010 වර්ෂයේදී රු.5,370,965 ක කොන්ත්‍රාත් අගයකට ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.448,343 ක පිරිවැයක් දරා තිබූ අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි.

(ආ) මධ්‍යස්ථානයට පද්ධති සහතික (ISO -9001) හඳුන්වාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.110,100 ක් වැය කර පුහුණු වැඩසටහන් පවත්වා ඇතත් ISO -9001 සහතිකය ලබාගෙන නොමැති අතර එම වියදම ආර්ථික නොවූ ගනුදෙනුවක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ,රු.11,283,085 ක් වැය කර 2008,2009,2010 වර්ෂවල ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 14 ක් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇතත් ව්‍යාපෘති වල අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඇතැම් ව්‍යාපෘති වලින් සාර්ථක ප්‍රතිඵලයක් ලබාගැනීමට නොහැකිව තිබූ අතර, අවසන් කල මෙම ව්‍යාපෘති නැවත වරක් අළුත් ව්‍යාපෘති සේ ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර එය කාලෝචිත නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2011 දෙසැම්බර් 31 දිනට පොදු තොගයෙන් (General) 40% ක් නියෝජනය වූ චලනය නොවන තොග රු.5,815,981 ක් ද හානි වූ තොග රු.320,285 ක්ද අවුරුදු 07 කට වඩා වැඩි කාලයක සිට ගබඩාවේ නිෂ්ක්‍රියව තිබුණි.

4.6 මධ්‍යස්ථානය සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතන සඳහා මුදාහැරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සඳහා කරවෙඩිඩි ප්‍රදේශයේ විද්‍යාතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් නර්ඩ් මධ්‍යස්ථානයේ ශ්‍රමය හා පොදු කාර්ය වියදම් දැරීමට එකඟ වී තිබූ අතර ඇස්තමේන්තුගත වියදම රු.3,194,626 ක් විය.නිලධාරීන්ගේ හා කම්කරුවන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලෙස ඇස්තමේන්තු කර තිබූ මුදල රු.930,450 ක් වූ අතර සත්‍ය වශයෙන් දරන ලද මුදල රු.1,957,358 ක් විය. මෙය ඇස්තමේන්තු ගත වියදමින් 110% ක වැඩි වීමකි.

(ආ) අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද ගිවිසුමට නර්ඩ් මධ්‍යස්ථානය දරනු ලබන වියදම ඇතුළත් කර නොතිබුණි.

4.7 මානව සම්පත් කළමණාකරණය

ඉංජිනේරුමය පර්යේෂණ කිරීම් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වුවද එම කාර්යයන් ඉටු කරලීම සඳහා අනුමත තනතුරු 38 ක් පුරප්පාඩුව පවතී.

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
පර්යේෂණ විද්‍යාර්ථී	05	03	02
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	13	08	05
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	16	01	15
පර්යේෂණ ඉංජිනේරු	21	15	06
පාලක - තාක්ෂණ උද්‍යාන	01	-	01
- කෞතුකාගාරය	01	-	01
- නඩත්තු	01	-	01

14

- කම්හල	01	-	01
කාර්මික නිලධාරි	05	02	03
කාර්මික සහකාර	15	12	03

			38
			===

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණ සිදු කෙරිණි.

(i) කළමනාකරණ විගණන චක්‍රලේඛ ඩීඑම්ඒ/2009(1) අංක හා 2009.06.09 දිනැති චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී වාර්ෂික ඇස්තමේන්තුව, ක්‍රියාකාර් සැලැස්ම, අයවැය යෝජනා ආදී සෑම අංශයකම කටයුතු ආවරණය වන පරිදි සකස් කළයුතු වුවත් එපරිදි සකස් කර නොතිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව ආයතනය තුළ ඵලදායී කාර්ය සාධනයක් තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනයට අමතරව, පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණය සහ විශේෂ විමර්ශන අංශ කෙරෙහි විගණන අංශය අවධානය යොමු කළයුතු වුවත් එම අංශ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර පාලනය

නර්ඩ් මධ්‍යස්ථානයේ ELE/COM/59/11 ව්‍යාපෘතිය යටතේ ආනයනික වාහන බැටරි සාම්පල ලබාගැනීම වැඩ ඇණවුම් සටහන් කිරීම, ඉන්වොයිස් කිරීම, පරීක්ෂාවන් සිදු කිරීම, වාර්තා සකස් කිරීම, වාර්තා නිකුත් කිරීම, නියැදීන් ආපසු ලබාදීම ආදී සියළුම කාර්යයන් එකම නිලධාරියෙකු මගින් සිදු කරන බැවින් ලැබෙන ආදායම් උපරිම කර ගැනීමට හෝ සිදු වියහැකි වැරදීම් වලක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2003 ජුනි 02 දිනැති හා පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 7:4:1 වගන්තිය ප්‍රකාර අවම වශයෙන් මාස 3 කට වරක්වත් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ විගණන කමිටු 03 ක් පමණි.

(ii) 2010 දෙසැම්බර් 14 දිනැති හා අංක 55 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගේ සේවය ලබාගැනීම අත්‍යාවශ්‍ය බව දැක්වුවද විගණන කමිටු රැස්වීම් සඳහා එම නියෝජිතයින් සහභාගි කරවා ගෙන නොතිබුණි.

06. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමු කරන ලදී.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ) ව්‍යාපෘති පිරිවැයකරණය හා කළමනාකරණය
(ආ) ණයගැතියෝ හා ණයහිමියෝ

එච්.ඒ.එස්. සමරවීර,
විගණකාධිපති.

15. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2011 දෙසැම්බර් 31 දිනෙන අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ අඩංගු නිරීක්ෂණයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පහැදිලි කිරීම.

මෙහි සඳහන් ශීර්ෂ සහ උපශීර්ෂ අංකයන් විගණකාධිපති තුමාගේ 2012.06.08 දිනැති ලිපිය හා බැදේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) එකඟවේ. කෙසේවෙතත් ප්‍රමිති අංක 9 ට අදාලව මාස 3 ක් ඉක්මවූ තැන්පතු 2012 වර්ෂයේ සිට මුදල් හා මුදල් සමාන දෑ යටතේ පෙන්නුම් නොකිරීමට කටයුතු කරනු ඇත.

(ආ) එකඟවේ. සේවක පාරිතෝෂිත ගෙවීම් සඳහා මුදල් ලබා ගනුයේ ගෙවීම් කරන අවස්ථාවේදී මහා භාණ්ඩාගාරයෙන් බැවින් ඒ සඳහා වෙනම ආයෝජනය කිරීමේ හැකියාවක් නොමැත. මෙම කරුණ මීට පෙර ඔබ විසින් පෙන්නුම් කර ඇති අතර ඒ සෑම විටකදීම අප විසින් ඉහත ආකාරයට පැහැදිලි කර ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) එකගවේ. අධ්‍යක්ෂ මණ්ඩල අංක 3-2012, අනු අංක 3.3 යටතේ පාලනාධිකාරිය විසින් ස්ථාවර වත්කම් විශ්ලේෂණය කර ස්ථාවර වත්කම් රෙජිස්ටරයන් යාවත්කාලීන කිරීමට නියමිත බැවින් එම නිර්දේශයන්ට අනුව මෙම භාණ්ඩ පාලනාධිකාරියෙන් පත් කරන ලද තක්සේරු කණ්ඩායම් වාර්තාවට අනුව එය ස්ථාවර වත්කම් වලින් ලියා හැරීමට කටයුතු කරනු ඇත.

(ආ) එකගවේ. කෞතුකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2012 වර්ෂයේදීත් සිදුවෙමින් පවතින අතර, එය 2012 වර්ෂයේදී ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) එකගවේ. රු.5,961,229 ක මුදලක් පහත දැක්වෙන ආකාරයට ඇපකරවල ආරක්ෂණ තැන්පතු වශයෙන් තැන්පත් කර ඇත.

1. පොලොන්නරුව හෙද නිවාස සෑදීමේ ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත 20% ක සංචලන අත්තිකාරමක් ලබා (mobilization advance) ගැනීම සඳහා කාර්ය සාධන බැදුම්කරය රු.1,126,000, කාර්ය සාධන බැදුම්කර අංක 3/2011 සහ ඇප සුරක්ෂිත ලිපිය No.16/2011 රු.4,504,000 තබා ඇත. මෙම කරුණ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමට මගහැරී ඇත. ඉදිරියේදී මෙය සිදු නොවීමට වගබලා ගන්නේමු.

11. Toyota Lanka ආයතනය වෙත රු. 75,000.00 ක ඇප සුරක්ෂිත ලිපියක් තබා ඇත.

මෙම ඇපකර සඳහා ආරක්ෂක තැන්පතු ලෙස රු.5,961,229 ක් සත් දින ඇමතුම් තැන්පතු සහතික 7 ක් හා රු.200,000 ක් වටිනාකම ඇති ස්ථාවර තැන්පතු දෙකක්ද තබා ඇත.

(ඈ) එකගවේ. මෙම යන්ත්‍රය අලුත් වැඩියා කරන විට එහි අගය ශූන්‍ය වී තිබූ බැවින් එම යන්ත්‍රය අලුත් වැඩියා කිරීමෙන් අනතුරුව එම යන්ත්‍රය පිළිබඳව නිපුණ දැනුමක් ඇති එම අංශයේ ප්‍රධානියාගේ නිර්දේශය මත ප්‍රත්‍යාගනනය කරන ලදී. නර්ඩ් මධ්‍යස්ථානයේ අනෙකුත් යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම ද ප්‍රත්‍යාගණනය කිරීම සඳහා දැනටමත් කමිටුවක් පත්කරනු ලැබ ඇත.

(ඉ) තාක්ෂණ උද්‍යානයේ ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සඳහා තීන්ත ගෑමට අවශ්‍ය වූ බැවින් ඒ සඳහා මුදල් යොදවනු ලැබුවේ ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමත කරන ලද ප්‍රාග්ධන මුදල්ය. එමනිසා, එය ගොඩනැගිලි ගිණුමට හරකර ඇත.

NERDC

2.2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) එකඟවේ. 2011.12.31 දිනට පැවති සියළුම ණය ගැතියන් සඳහා 2012.01.27 වන දින ශේෂය සනාත කරලීම් ලිපි විගණකවරුනටද පිටපත් සහිතව යවා ඇත. නමුත් කිසිවකු විසින් ශේෂ සනාථ කරලීම් ලිපි වල අපගේ පිටපත් නැවත එවා නොමැත. ණයගැති ශේෂ සනාථ කරලීම් මධ්‍යස්ථානයේ පාලනයෙන් පරිබාහිරව පවතින්නකි.

(ආ) එකඟවේ. අවුරුදු 4 කට වැඩි කාලසීමාවක ඇති රු.118,430.28 ක මුදල 2012 වර්ෂයේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි රු.10,300.00 ගෙවීමට අපොහොසත් වී ඇත්තේ මෙම ණය හිමියන් ලදුපත්වල මුල් පිටපත ඉදිරිපත් කිරීමක් කර නොමැති බැවිනි. 2012 වර්ෂයේ මෙයද අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නිසි ගිණුම් වලට ගැනීමට සිදු කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) එකඟවේ. මෙම වසර තුළදී නිරවුල් කිරීමට කටයුතු කරමි.

(ඈ) එකඟවේ. වර්ෂ 5 ට අධික රු.67,500.00 අත්තිකාරමක් පවතින්නේ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලයේ රත්නපුර ජල ටැංකිය ඉදිකිරීම සඳහා ලබා දී ඇති රු.67,500.00 ක මුදලකි. මෙම ව්‍යාපෘතිය 2006 වර්ෂයේ ආරම්භ කර ඇති අතර, මෙහි ඇස්තමේන්තුගත මුදල රු.90,000.00 වන අතර, ඉන් 75% ක වටිනාකමක් ගෙවා ඇති අතර, හිඟ මුදල ඉල්ලීම් කර ඇති නමුත්, ඔවුන් විසින් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි. නිමකර ඇති වැඩකොටස් අනුව ලැබි ඇති අත්තිකාරම් ඉන්වොයිස් ගත කිරීමට 2012 වර්ෂයේ කටයුතු කරනු ඇත.

මෙහි ඇති අනෙකුත් අත්තිකාරම් ගැන ද විශේෂ අවධානයක් යොමු කර ඒවා නිරාකරණය කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) 2012 වර්ෂයේදී මෙම සේවකයන් දැනුවත් කර මෙය ගෙවා අවසන් කිරීමට හෝ ආදායමට ගැනමට කටයුතු කරනු ඇත.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විෂයය	වටිනාකම (රු)	නොසැපයුමට හේතු
ස්ථාවර වත්කම්	444,965,739	එකඟවේ. විගණනය පැවැත්වෙන අවස්ථාවේ සමීක්ෂණ වාර්තා පිළියෙල වෙමින් තිබුණ බැවින් ඒ අවස්ථාවේදී විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. මෙම වාර්තාව දැනට අප සතුව ඇත.
ණය හිමියෝ	- 2,060,329	අදාල පාර්ශවයන් අප වෙත ශේෂය සනාථ කර දන්වා නැත.
ණය ගැතියෝ	- 11,403,421	
සත්දින ඇමතුම් තැන්පතු	-	5,961,229
ස්ථාවර තැන්පතු	- 200,000	එකඟවේ. දැනට සනාථ කිරීමේ වාර්තාවක් ගැනීමට කටයුතු කර ඇත.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) එකඟවේ. දැනට ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වනුයේ වසර 5 කට අධික ආපසු ලබා ගැනීමට කටයුතු නොකලහොත් ආදායමට ගැනීමේ ප්‍රතිපත්තිය ඒ අනුව වසර 5 ඉක්මවූ ලබා ගැනීම් ආදායමට ගැනීමට කටයුතු කෙරේ. නමුත් මු.රෙ.570 යටතේ දක්වා ඇති කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ඇත.

(ආ) චක්‍ර ලේඛණ MSD 39 යටතේ ගැනෙන්නේ රාජ්‍ය ආයතනවල වැටුප් හා දීමනා සංශෝධනය කිරීම වන අතර මෙහි දක්වා ඇති කරුණ නොවේ. නමුත් අප විසින් ගෙවා ඇති දිරි දීමනාව 1999 සිටම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ගෙවීම් සිදු කෙරුණි.

(ඇ) එකඟවේ. මෙම භාණ්ඩ වලින් අපහරණය කල යුතු තොග අංශ ප්‍රධානීන්ගේ නිර්දේශයන් අනුව 2012 වර්ෂයේදී අපහරණය කිරීමට කටයුතු කරනු ඇත.

(ඈ) එකඟවේ. මෙම තැන්පතු 1985 සිට විටින් විට තැන්පත් කර ඇති මුදල්ය. මෙම ස්ථාවර තැන්පතු වල ඇති මුදල් අදාල අනුමැතියන්ට යටත්ව ඉදිරියේදී රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්තභාර අරමුදලේ තැන්පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

එකඟවේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2 - 2012 සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 6.1, යටතේ මෙම තැන්පතු සඳහා අනුමැතිය ලබා ගෙන ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

මෙහි සඳහන් කරුණු සමඟ එකඟ වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරණ ලද්දේ ආයතනයට අවශ්‍ය සියළුම පර්යේෂණ ඉංජිනේරුවන් හා සහායකයින් බඳවාගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙනි. නමුත් මේ සඳහා අවශ්‍ය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් සහ සහායකයින් බඳවාගැනීමට අවකාශ නොලැබිණ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරුවන් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවුවත් කිසිදු අයදුම්පත්‍රයක් නොලැබිණ. එසේම 2011 දි බඳවාගත් පර්යේෂණ ඉංජිනේරුවන් 11 න් 02 දෙදෙනෙකු දැනට ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇත. එසේම 2011 වසරේදී ඉංජිනේරුවන් තිදෙනෙකු විශ්‍රාම ගොස් ද ඇත. මේ අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පර්යේෂණ ඉංජිනේරුවන් (ඉංජිනේරු සහ විද්‍යාඥ) 56 සිටිය යුතු අතර, 2011 වර්ෂයේ සිටිනුයේ 31 ක් පමණි. මෙසේ පර්යේෂණ ඉංජිනේරුවන් බඳවාගැනීමට අසීරුතාවය මත, පර්යේෂණ වලට අදාල සංවර්ධන කටයුතු (ගොඩනැගිලි ඉදිකිරීම, පර්යේෂණ ප්‍රතිපල ලබාගැනීම වැනි දේ සඳහා) තවදුරටත් අඩාල නොවන පරිදි MM 1-1 වැටුප් කාණ්ඩයේ ඉංජිනේරු තනතුරු 07ක් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. කෙසේවෙතත්, ඉහත කරුණු මත අප විසින් සැලසුම් කරණ ලද ක්‍රියාකාරකම් වල ඉලක්ක සපුරාගත නොහැකි වූ බව සැබෑය.

එසේම සැලසුම්පත් සැකසීමේදී වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් වලට අපගේ දායකත්වය ද ඒ ඒ අයිතමයන් සඳහා ඉදිරිපත් කර ඇත. උදාහරණ වශයෙන් විදාතා වැඩසටහන් අප අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරණ වැඩ සටහන් වන අතර, ඒ සඳහා අමාත්‍යාංශය විසින් යම් යම් අවස්ථාවලදි අපගේ දායකත්වය ලබාගනී. පසුගිය වසරවලදී ලබාගන්නා ලද දායකත්වය මත පදනම්ව අපගේ සැළසුම්ද කර ඇත. නමුත් එම ආයතන විසින් එම සැළසුම් ක්‍රියාත්මක නොකිරීම, අපගේ ඒ සම්බන්ධ ඉලක්ක ඉටු නොවීමට බලපා ඇත.

එසේම සැළසුම් කර ඇති සමහර කටයුතු ඉටු කිරීම අපගේ සේවා ඉල්ලුම මත රදා පවතී. උදාහරණ වශයෙන් බලශක්ති විගණන, කාර්මික සේවා සැපයීම, පාරිසරික සේවා සැපයීම, ඩයි හා අච්චු සැපයීම යනාදිය දැක්විය හැකිය. මෙවැනි වැඩකටයුතු සඳහා සේවා ඉල්ලුම අඩු වූ විට ඉලක්ක කරා ලඟා විය නොහැක. එසේම සමහර සේවාවන් සඳහා ඉල්ලුම වැඩි විට සැලසුම් ගත ඉලක්ක වලට වඩා වැඩිපුර සේවා ඉටු කරද ඇත.

තවද කළමනාකාරිත්වය විසින් ගන්නා ලද තීරණයක් අනුව මෙම කාර්ය සාධන සැකසීමේදී ඒ ඒ නිලධාරීන් දිරිමත් කිරීම සඳහා අපගේ ඉලක්ක එම නිලධාරීන් ඉදිරිපත් කළ ඉලක්ක වලට වඩා අසීරු කර ඇත. මෙය හුදෙක්ම ඔවුන් දිරිමත් කිරීම සඳහා ගත් ප්‍රයත්නයකි. මෙයද කාර්ය සාධන පරීක්ෂාවේදී බොහෝ අයිතමයන් ඉලක්ක කරා ලඟාවීමට නොහැකි වූ බවට පාදක වූ තවත් කරුණක් විය.

එමෙන්ම පර්යේෂණ ව්‍යාපෘතීන් වලටම ආවේණික ලක්ෂණයක් වන අවිනිශ්චිතතාවය අනුව සැලසුම් වෙනස්වීම සාමාන්‍ය දෙයකි. මේ අනුව පර්යේෂණ ව්‍යාපෘතිවලට අපේක්ෂිත ඉලක්ක ලගා නොවීම එහි ස්වභාවය අනුවම සිදුවන්නා වූ දෙයකි.

4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ) (i) එකඟනොවේ. මෙම ව්‍යාපෘතියේ අරමුණවූයේ දැව භාවිතා කොට වායු ජනක තාක්ෂණය මගින් ආර්ථිකමය වාසි සහිතව විදුලිය නිපදවීමේ හැකියාව ලංකාව තුළ ස්ථාපිත කිරීම සහ එහි හැකියාව තාක්ෂණවේදීන් සහා ව්‍යවසායකයින්ට පෙන්නුම් කිරීම සහ ඔවුන්ට ආදර්ශනය කිරීම සඳහාය. එබැවින් මෙම ව්‍යාපෘතියේ බොහෝ අරමුණු කරා අප ලඟාවී ඇති බව පැහැදිලිය.

(ii) මෙම අගයන් සත්‍යතා අගයන් ලෙස එවකට ගණනය කරන ලද අගයන්ය.

(iii) එකඟවේ. මෙය 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එකතුව ඇති අගය මත එකතු කරලීම් බද්ද හා සම්බන්ධිත නැවත මධ්‍යස්ථානය වෙත ලබාගත හැකි වටිනාකමයි. (refund). මෙය මධ්‍යස්ථානය වෙත ලබා දීම සලකා බැලීම සඳහා එකතු කල අගය මත බදු විගණණයක් (VAT Audit) කල යුතු බව දේශය ආදායම් දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් 2008.07.24 හා නැවත 2010.08.26 දින එවන ලද ලිපි වලට අනුව අවශ්‍ය ලිපි ලේඛණ අප විසින් භාර දී ඇත. තවද අවස්ථා කීපයකදි පෞද්ගලිකව සහභාගී වී පසු විපරම් කටයුතු කරලීමට අමතරව අප විසින් 2011.11.11, 2011.09.07, 2011.03.03, 2011.03.15, 2010.05.11, 2011.03.15, 2010.11.30, 2008.08.21 මෙහි අවශ්‍යතාවය දැඩිව අවධාරනව කර ඇත.

තවද මේ සම්බන්ධයෙන් 2010/2011වර්ෂයේදි අප විසින් දක්වන ලද කරුණු සටහන් කරගත් ලොග් සටහනක්ද එකතුකල අගය මත එකතු කරලීමේ බදු නියෝජ්‍ය කොමසාරිස්වරයා යටතේ එම දෙපාර්තමේන්තුවේ සටහන්ව ඇත.

කෙසේ වුවද, මේ සම්බන්ධයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අඛන්ඩ උත්සාහයක යෙදෙමින් පවතී.

(ආ) <u>ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම</u>

සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා ජීවවායු ජනකයක් සෑදීම

එකඟනොවේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණවූයේ නිර්වායු ජීරණය මගින් වැසිකිළි අපද්‍රව්‍ය පරිසර හානිය අවම වන ආකාරයට පිරිපහදු කිරිමය. මෙම වැසිකිළි පද්ධතිය විශාල භූමියක් තුළ විසිරි ඇති වැසිකිළි පද්ධතියකි. මෙහි අතුරුඵලයක් වශයෙන් යම් ප්‍රමාණයක ජීවවායුවක් ද නිපදවේ. ඒ අනුව මෙහි මූලික අරමුණු ද ඉටුවී ඇති අතර අතුරුඵලයක් වශයෙන් සුළු වශයෙන් ජීව වායුව ද ලබාගත හැක.

<u>කෙසෙල් ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම</u>
එකඟවේ. මේ සඳහා සුදුසු මල්ලක් නිපදවා තෝරාගත් ගොවින් අතරේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් බෙදාදෙන ලදී. නමුත් ඒවා ප්‍රචලිත කිරීමට බාධා වන ලෙස වෙනත් සමාජ ආර්ථික කරුණු බලපා ඇති නිසා මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල වර්තමානයේ දැකගත නොහැකි විය.

(ඇ) සෑම පර්යේෂණයක්ම අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වන අතර එසේවන්නාවූ පර්යේෂණ ඒ හා අදාල සන්ධිස්ථානයන්හිදී අත්හැර දමනු ලැබේ. මෙමගින් තවදුරටත් මේ සඳහා වන වියදම් අපතේ යාමක් සිදුනොවනු ඇත.

(ඈ) එකඟනොවේ. ලාම්පු සාම්පල 801 ක් අප වෙත භාරදී තිබී ඇත්තේ පැය 2000 ක ආයු කාලයෙන් පසු පරීක්ෂා කර බලා වාර්තා නිකුත් කිරීමට පමණක්ම නොව අනෙකුත් අවශ්‍ය පරීක්ෂණ වාර්තා ද ලබාගැනීම සඳහාය. මෙම සාම්පල 801 ක් පැය 2000ක් ආයු පරීක්ෂාවට ලක් කරන ලෙස SLSI ආයතනය මගින් ඉල්ලුම් කර තිබුනේ සාම්පල දෙකක් සඳහා පමණක් බැවින්, එම සාම්පල දෙකක් සඳහා පමණක් මෙම පරීක්ෂණ වාර්තාව නිකුත් කර ඇත

(ඉ) එකඟනොවේ. වැඩ ඇණවුම් නිකුත් නොකිරීම නිසා ලාම්පු පරීක්ෂා කිරීම සඳහා යොමු නොකර ඇතැයි සටහන් වීම නිවැරදි නොවන්නේය.

ලාම්පු පරීක්ෂා නොකර සිටීම සහ පරීක්ෂා කිරීමට යොමු නොකර ඇත්තේ, පරීක්ෂා කිරීම සඳහා ලැබෙන ලාම්පු ප්‍රමාණය බොහෝ වැඩි හෙයිනි. එනම් දවසේ සම්පූර්ණ රාජකාරී වේලාව තුලදී පරීක්ෂණයන් සිදු කල ද දැනට අප වෙත ඇති ලාම්පු පරීක්ෂණයන් නිම නොකල හැකි නිසාය. ලාම්පු පරීක්ෂණයන් අප වෙත ලැබෙන ප්‍රමුඛතාවය මත සිදු කරනු ලැබේ.

(ඊ) මෙම කාලය තුල අප වෙත මුදල් නොලැබීම හේතුවෙන් ඉන්වොයිස් නිකුත් කිරීමට ප්‍රමාද වී ඇත.

(උ) (i) එකඟවේ. එම ලිපිකරුවා 2000.09.01 දින සිට මධ්‍යස්ථානයේ ගිණුම් ලිපිකරුවකු ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇත. ඔහුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී යම් යම් අවස්ථාවල කෙටි කාලසීමාවකට යටත්වනසේ සේවා බණ්ඩනය කරමින් 2007 වර්ෂය වන තෙක් සේවය ලබා ගෙන තිබුනි. ඔහු විසින් සිදුකරනු ලැබූ විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන්, පළපුරුදු බාහිර නිලධාරයෙකු මඟින් මූලික විමර්ශනයක් පවත්වා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ සේවය 2007.08.20 දින සිට අවසන් කර ඇත. පසුව ඔහුගේ වෘත්තීය සංගමය විසින් කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරන ලදී. එහිදී ඔහුගේ සේවය දීර්ඝ කිරීමේදී කර ඇති බණ්ඩනයන් හා සේවය අවසන් කිරීම පිළිබඳව අධිකරණයේදී සැළකිල්ලට යොමු කල ද කොන්ත්‍රාත් ලේබලයන්ට මුවා වෙමින් අදාළ සේවකයාගේ

සේවය යුක්ති සහගත නොවන ලෙසකින් කටයුතු කරමින් අවසන් කර ඇති බවට` නිගමනය කරමින් හිඟ වැටුප් සහිතව ඔහු ස්ථිර සේවයේ පිහිටුවීමට තීන්දුව ලබාදෙන ලදි.

(ii) 2004 වර්ෂයට පෙර ආයතනයේ නීති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන ඇති අතර ඇතැම් අවස්ථාවල උපදෙස් ලබාදීමේදී නියමිත කාල රාමුවක් තුළ ලබාගැනීමේදී ඇතිවූ ගැටළු හේතුවෙන් සහ එකම නීතිඥවරයාට අදාල නඩුවට අඛණ්ඩව පෙනීසිටීමට නොහැකි වීම යන හේතූන් නිසා නීති කටයුතු වලදී ආයතනික වශයෙන් ඇතිවූ අවාසිදායක තත්වයන් හේතුවෙන්, ආයතනික නීති කටයුතු වලදී මීට ප්‍රථම ආයතනයේ තාක්ෂණික පැවරුම් ගිවිසුම් සකස්කිරීම සඳහා උපදෙස් ලබාදුන් පළපුරුදු නීතිඥවරයෙකුගේ සේවය අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත 2004.01.01 දින සිට ලබාගන්නා ලදි. ඇතැම් නීතිමය කටයුතු ඊළඟ වර්ෂය සඳහාද ඉදිරියට ගෙනයාමට සිදුවූ නිසා මාසික ගෙවීම් පදනමක් මත (Monthly Professional Charge) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඔහුගේ සේවය අඛණ්ඩව මධ්‍යස්ථානයට ලබාගැනීමට සිදුවිය. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, 2012 වර්යේදී ඔහුට මාසික පදනම මත ගෙවීම් නොකරන අතර ලබාගන්නා නීති උපදෙස් සඳහා පමණක් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

(උ) එකඟවේ. මෙම මුදල් වැඩි ප්‍රතිලාභ ඇති ස්ථාවර තැන්පතු වල අතිරික්ත භාර අරමුදලේ ආයෝජනය කිරීම ගැන 2012 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සඳහා යොමු කරනු ඇත.

(එ) මෙලෙස සම්මාන/ප්‍රදානය කරනු ලබන්නේ ව්‍යාපෘතිවල ප්‍රතිඵල මතය. මේ සඳහා අනුමත කරගෙන ඇති ක්‍රමවේදයන් සහ නිර්නායකයන්ට අනුව ව්‍යාපෘති ඇගයීමකට ලක් කරනු ලැබේ. පසුගිය වර්ෂ දෙක තුළ සම්මාන ප්‍රදානය කිරීමට සුදුසු ව්‍යාපෘති නොමැතිවීම හේතුවෙන් සම්මාන ප්‍රදානය නොකරන ලදී. මෙයින් පිළිබිඹු වන්නේ නව පර්යේෂණයන් සිදුකල හැකි ඉංජිනේරුවන් ආයතනයට බඳවාගැනීමට දුෂ්කර වී ඇති බවය. මෙම ප්‍රදානයන් සඳහා යොදා ගනු ලබන මුදල් වලින් කොටසක් අපගේ පර්යේෂණ ඉංජිනේරුවන් ලබාගත් ජනාධිපති සම්මාන/ප්‍රදානය, ජාතික විද්‍යා පදනම මගින් ලබාදුන් සම්මාන/ප්‍රදානය, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය මගින් ලබාදුන් සම්මාන/ප්‍රදානය සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව මගින් ලබාදුන් සම්මාන/ප්‍රදානය වේ. 2012 වර්ෂයේදී අදාල මුදල් සම්මාන/ප්‍රදානය සඳහා ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

(ඒ) මධ්‍යස්ථානයේ කළමණාකාරිත්වයේ අනුමැතිය සහිත නොගෙවන ලද බදු ව්‍යාපෘතියේ වියදමක් වශයෙන් ගෙන ඇත.

4.3 හඳුනාගත් පාඩු

(අ) එකඟනොවේ. මෙය පරිපාලයේදී සිදුවූ දෝෂයක් නොවන අතර මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් 4.2 (උ) (i) යන්නෙහි දක්වා ඇත.

(ආ) එකඟවේ. මෙම ව්‍යාපෘති සියල්ලක්ම ක්‍රියාත්මක කිරීමේදී සිදුවූ අලාභ වලට පාදක වූ හේතුව වන්නේ වැඩිපුර ශ්‍රමිකයන් යෙදවීම නිසාය. එසේ වැඩිපුර ශ්‍රමිකයන් යෙදවූවත් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය අඩුවීම හා එම ශ්‍රමිකයන්ගේ වැඩ අධීක්ෂණය කිරීමට වැඩඅධීක්ෂකයන් නොමැතිවීමත් මීට බලපා ඇත. ඊට පිළියමක් ලෙස දැනට පුරප්පාඩුව පවතින වැඩඅධීක්ෂකයන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) රු.57,176 ක මුදල ආපසු අයකර ගැනීම සිදුවන්නේ පාලනාධිකාරී තීරණයක් මත කොටස් වශයෙන් බැවින් එම මුදල අයකර ගැනීම 2014 වර්ෂය දක්වා දිවේ.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) කෝපායි සහ කරවෙඩ්ඩි යන ස්ථානවල විදාතා මධ්‍යස්ථාන ඉදිකිරීමට තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය මගින් වැඩසටහනක් ආරම්භ කරන ලදී. නමුත් ඉදිකිරීම් සඳහා කෝපායි වෙත ගොස් පරීක්ෂා කිරීමේදී මේ සම්බන්ධයෙන් එවැනි ගොඩනැගිල්ලක් සෑදීමට දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය සහයෝගය හා එකඟත්වය නොලැබුනු අතර මෙය අමාත්‍යාංශ වෙත දන්වා කෝපායි විදාතා මධ්‍යස්ථානයේ ඉදිකිරීම තාවකාලිකව නතර කරන ලදී. මෙහි මූලික වැඩකටයුතු සඳහා දැරූ වියදම් මෙහි දක්වා ඇත. ඒ අනුව නිෂ්පාදනය කරන ලද පෙර සවි කොන්ක්‍රීට් උපාංග ඉදිරියේදී වෙනත් ව්‍යාපෘති සඳහා භාවිතයට ගැනීමට ක්‍රියාකරණු ලබන අතර, එම වියදම එම අදාල ව්‍යාපෘතීන් සඳහා බැර කරණු ඇත.

(ආ) එකඟනොවේ. මෙම පුහුණුව ආර්ථික නොවූ ගණුදෙනුවක් ලෙස දැක්වීම නිවැරදි නොවේ. මෙම පුහුණුව ලබාදුන්නේ ISO ක්‍රමවේදය නර්ඩ් ආයතනය තුළ ස්ථාපිත කිරීමේ මූලික පියවරක් ලෙසය.

(ඇ) සාමාන්‍යයෙන් පර්යේෂණ ව්‍යාපෘති වල අවසන් ප්‍රතිඵලය බලාපොරොත්තු වූ අරමුණු ඉටුවීම හෝ නොවීම අනුව එය ආර්ථික නොවූ ගනුදෙනු ලෙස අර්ථ දැක්වීම යහපත් නොවේ. සෑම පර්යේෂණ ව්‍යාපෘතියක්ම අවසානයේ ලබාගන්නා දැනුම ඉදිරි කටයුතු සඳහා ආයතනයට විශාල ආයෝජනයක් ලෙස හැඳින්වීම වඩාත් නිවැරදිය.

සෑම පර්යේෂණ ව්‍යාපෘතියක් අවසානයේදීම පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය නොවේ. එහෙත් සමහර ව්‍යාපෘති අවසන් කල පසු නිශ්චිත කාල සීමාවකදී පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. එහෙත් පර්යේෂණ ඉංජිනේරුවන් ආයතනය හැරයාම නිසා සමහර ව්‍යාපෘති සඳහා වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකිවී ඇත. කෙසේවුවද, ඉදිරියේදී මෙම තත්වය මගහරවා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සාදා ඇත.

4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

එක් එක් කාලයන්හී පර්යේෂණයන් වලට අදාලව මිලදී ගන්නා ලද භාණ්ඩ මෙම චලන නොවන තොගවේ. මෙහි දක්වා ඇත්තේ බිල්පතෙහි වටිනාකම වන අතර එහි වර්තමාන වටිනාකම (විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික් අයිතමයන් සඳහා) බොහෝවිට අඩුය. කෙසේවෙතත් මෙම භාණ්ඩ සම්බන්ධයෙන් විශ්ලේෂණය කර යල්පැනගිය භාණ්ඩ අපහරනය කිරීමට කටයුතු කරනු ලබන අතර පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කල හැකි චලනය නොවූ භාණ්ඩ ගබඩා කරනු ඇත.

4.6 මධ්‍යස්ථානය සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතන සඳහා මුදාහැරීම

(අ) මෙම ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය මිලියන 7.9ක් පමණ වේ. ICTAD නියමයන්ට අනුව එවැනි ඇස්තමේන්තු ගත මුදලක ගොඩනැගිල්ලක් ඉදිකිරීම් සඳහා වැය කළ යුතු කාලසීමාව මාස 6ක් පමණ වේ. (ICTAD- Procurement Guide Line reference 4.2.2). මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට 2011 වසරේ ජනවාරි මසදී සැලසුම් කර තිබුනත් උතුරු ප්‍රදේශයේ වැසි සහිත කාලගුණික තත්වය හා ගංවතුර තත්වයන්, ඒ වන විට පැවති ප්‍රාදේශිය සභා මැතිවරණයත් සහ සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයත් නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට 2011 අප්‍රියෙල් මස 16 වන තෙක් ප්‍රමාද කිරීමට සිදුවිය. මේ අනුව මාස 6කින් සෑදිය යුතු ගොඩනැගිල්ල මාස 3 1/2ක කෙටි කාලයකින් නිමකිරීමට කටයුතු කිරීමට සිදුවිය. ඒ අනුව වැඩි සේවක පිරිසක් සහ දෛනිකව වැඩි කාලසීමාවක් නිලධාරීන්ට සහ සේවකයින්ට සේවයේ යෙදීමට සිදුවිය. ඒ හේතුවෙන් ඇස්තමේන්තු ගත ප්‍රමාණයට වැඩි පිරිවැයක් ගමන් වියදම් සහ අතිකාල සේවා සඳහා දැරීමට සිදුවිය.

(ආ) ගිවිසුම අත්සන් කරනු ලැබුයේ අමාත්‍යාංශය විසින් අප ආයතනයට ගෙවිය යුතු මුදල් සඳහාය. එමනිසා නර්ඩ් මධ්‍යස්ථානය දරණු ලැබු වියදම් ගිවිසුමට ඇතුලත් නොකරන ලදී.

4.7 මානව සම්පත් කළමනාකරණය

මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින ඉංජිනේරු පර්යේෂණ කාර්ය මණ්ඩලය හා තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවාගැනීමට මධ්‍යස්ථානය විසින් අවශ්‍ය පියවර ගෙන ඇතත් මෙයින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී ඇත. සෑම වර්ෂයකදීම විශ්ව විද්‍යාල වලින් ප්‍රතිඵල නිකුත් කරන ලද වහාම ඒ පළිබඳව සොයා බලා සුදුසුකම් සහිත ඉංජිනේරු උපාධිධාරීන් බඳවාගැනීමට මධ්‍යස්ථානය විසින් කටයුතු කරනු ලැබේ. 2011 වර්ෂයේදීද අනුමත බඳවාගැනීමේ සඳහන් ප්‍රතිපාදන වලට අනුව පර්යේෂණ ඉංජිනේරු තනතුරන්ට අදාළ තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව, පර්යේෂණ ඉංජිනේරු තනතුරු සඳහා 11 දෙනෙකු බඳවාගන්නා ලද අතර ඉන් 04 දෙනෙකු මේ වන විට ඉල්ලා අස්වී ඇත. එසේම ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු තනතුර සඳහා කිසිදු අයදුම් පත්‍රයක් ලැබුනේ නැත. පර්යේෂණ ඉංජිනේරු හා ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු තනතුරු සඳහා සුදුසුකම් වලට සාපේක්ෂව අඩු වැටුප් ව්‍යුහයක් පැවතීමත් මෙම ආයතනය කොළඹ නගරයෙන් බැහැරව පැවතීමත් යන කරුණු, බඳවාගත් පර්යේෂණ ඉංජිනේරු කාර්ය මණ්ඩලය රඳවාගැනීමට පවතින ගැටළු බව අපගේ නිරීක්ෂණයයි.

මෙම ආයතනයට බෙහෙවින්ම අනන්‍ය තාක්ෂණයන් පවතින සිවිල් ඉංනේරු ක්ෂේත්‍රය හා විදුලි, විද්‍යුත් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා ඉල්ලුම් කරන සංඛ්‍යාව බෙහෙවින්ම අඩුය. 2011 වර්ෂයේ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා එක් (01) අයෙකු පමණක් ඉල්ලුම්කර බඳවා ගන්නා ලද අතර ඔහුද එම වර්ෂයේදීම ඉල්ලා අස්වන ලදි. විදුලි විද්‍යුත් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තිදෙනෙකු බඳවාගන්නා ලද අතර ඉන් දෙදෙනෙකුම මේවන විට ඉල්ලා අස්වී ඇත. ඒ හේතුව නිසා එම ක්ෂේත්‍රවල ඉංජිනේරු පර්යේෂණ කාර්යයන් ඉදිරියට ගෙනයාමේ ගැටළුවක් පවතී. තවද ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු තනතුරු 15ක පුරප්පාඩු පිරවීමට නොහැකිවීම මත ඉංජිනේරු පර්යේෂණ කටයුතු වලදී සහ අදාළ ව්‍යාපෘති කරගෙන යාමේදී අවශ්‍ය වන ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු වරුන්ගේ මගපෙන්වීම හා දායකත්වය, බඳවා ගනු ලබන නවක පර්යේෂණ ඉංජිනේරුවන්ට

නොලැබෙන බව තවදුරටත් ඔබට පැහැදිලිවනු ඇත. මෙයද නවක පර්යේෂණ ඉංජිනේරුවන් අප ආයතනය තුළ රඳවාගැනීමට ඇති බාධාවක් වේ. එමනිසා ආයතනයේ සකස් කරන ලද ක්‍රියා සැලැසමට අනුව ඉලක්ක කරා ලඟාවීමට අපහසුවී ඇත.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

(i) එකඟවේ. වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී ක්‍රියාකාරී සැලැස්ම සමස්ථයක් වශයෙන් සැලකිල්ලට ගත්ද, එයින් තෝරාගත් ප්‍රතිශතයක් හෝ තෝරාගත් අයිතමයන් ප්‍රමාණයක් සඳහන් කර නොතිබිණි. එසේම 2011 නව අයවැය යෝජනා වලින් මධ්‍යස්ථානයට අදාල නිර්දේශ ඇතුලත් නොකිරීම පිළිගන්නා අතර, ඉදිරියේදී වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී, ඉහත තත්වයන් සැලකිල්ලට ගනු ලැබේ.

(ii) එකඟවේ. මෙම වර්ෂයේ සිට විගණනය සිදුකිරීමේදී මූල්‍ය විගණනයට අමතරව පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණය සහ විශේෂ විමර්ශණ යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විගණනය සිදුකිරීමට සැලකිල්ල යොමුකර ඇත.

5.2 අභ්‍යන්තර පාලනය

එකඟවේ. මෙහි බැටරි පරීක්ෂා කිරීම සඳහා ඒ හා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් ඇත. බැටරි පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය කිසසේත්ම එක් පුද්ගලයෙකුගේ සහභාගිත්වයෙන් පමණක් සිදු කල නොහැක.

එමෙන්ම මෙම බැටරි පරීක්ෂා කිරීමේ ක්‍රම වේදය තුලම වැරදීම් අවම කර ගැනීමේ ක්‍රමවේදයක් අඩංගු කර ඇත. තවද මෙහිදී වාර්තා නිකුත් කරනු ලබනුයේ අනුමත අධීක්ෂනයකින් පසුවය. මෙම කාල වකවානුව තුළ මෙම අංශයේ සේවයේ නියුක්තව සිටියේ එක් ඉංජිනේරුවෙක් නිසා මෙම කටයුතු අංශ ප්‍රධානී විසින්ම කිරීමට සිදුවිය. දැනට මේ සඳහා වෙනම තාක්ෂණ නිලධාරියෙකු අනියුක්ත කර ඇත.

5.3 විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම

(i) එකඟවේ. මෙම වර්ෂයේ සිට 2003 ජුනි 02 දිනැති හා පී.ඊ.ඩී/12 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 7.4.1 වගන්ති ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි.

(ii) 2010 දෙසැම්බර් 14 දිනැති හා අංක 55 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 5 ඡේදයේ ප්‍රකාරව 2011 වර්ෂයේ විගණන කමිටු සඳහා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණක නිරීක්ෂකයෙකු ලෙස සහභාගි කරවා ගෙන ඇත.

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී ආර් පුල්ලපෙරුම
සභාපති